# ශ්‍රී ලංකාවේ මිරිදිය මසුන්

# Freshwater Fishes of Sri Lanka



ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය

පරිසර සහ ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය

**පිටකවරය :**

*Puntius srilankensis* (Senanayake, 1985)

E: Blotched filamented barb; S: දන්කුඩ පෙතියා

ශ්‍රී ලංකාවට ආවේණික රටාසමයෙකි. දුම්බර කඳුකරයේ මහවැලි ද්‍රෝණියට සීමාවේ. ස.දි.සෙ.මී. 10 වේ. 2006 වසරේ ජාතික රතු දත්ත ලැයිස්තුව මගින් දැඩි අන්තරායක (CR) ලෙසත්; වනසත්ත්ව හා තුරුලතා ආරක්‍ෂක ආඥාපනත මගින් ආරක්ෂිත රටාසමයකු ලෙසත්; ධීවර සහ ජලජ සම්පත් ආඥාපනත මගින් අපනයනය සපුරා තහනම් කරනු ලැබූ රටාසමයකු ලෙසත් නම්කර ඇත.

ENV BD 07

# ශ්‍රී ලංකාවේ මිරිදිය මසුන්
# Freshwater Fishes of Sri Lanka

LIBRARY
Ministry of Environment &
Natural Resources

සම්පත් ද අල්විස් ගුණතිලක
(BSc; Post. Dip. in Archaeology)

2007

පරිසර සහ ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය

ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය

BDS
BIODIVERSITY SECRETARIAT

ආරක්ෂිත ප්‍රදේශ කළමනාකරණ සහ
වනජීවී සංරක්ෂණ ව්‍යාපෘතියේ මූල්‍යමය ආධාර අනුග්‍රහයෙනි

# ශ්‍රී ලංකාවේ මිරිදිය මසුන්
# Freshwater Fishes of Sri Lanka

ප්‍රථම මුද්‍රණය 2007 මැයි 22

© සම්පත් ද අල්විස් ගුණතිලක

**ISBN 955-9120-70-0**

| | |
|---|---|
| කතෘ | : සම්පත් ද අල්විස් ගුණතිලක |
| සිතුවම් | : සම්පත් ද අල්විස් ගුණතිලක |
| අක්ෂර සංයෝජනය | : මංජුල ගුණරත්න |
| පිටු සැලසුම හා මුද්‍රණය | : නියෝ ග්‍රැෆික්ස්<br>51/3, පාසැල් මාවත,<br>ගංගොඩවිල,<br>නුගේගොඩ. |
| සම්බන්ධීකරණය | : හසුලා රාජපක්ෂ |
| ප්‍රකාශනය | : ජෛව විවිධත්ත්ව ලේකම් කාර්යාලය,<br>පරිසර සහ ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය,<br>"සම්පත් පාය"<br>82, රජමල්වත්ත පාර,<br>බත්තරමුල්ල. |
| අනුග්‍රහය | : ආරක්ෂිත ප්‍රදේශ කළමනාකරණ සහ<br>වනජීවී සංරක්ෂණ ව්‍යාපෘතිය |

# පෙරවදන

ශ්‍රී ලංකාව කුඩා දිවයිනක් වුව ද මිරිදිය පරිසර පද්ධති ගණනාවක් මෙහි දැක ගත හැකිය. ශ්‍රී ලංකාවේ මිරිදිය පරිසර පද්ධති අතර ගංගා ද්‍රෝණි 103ක් ද, වැව් දස දහසකට ආසන්න ප්‍රමාණයක්ද, වගුරු බිම්, පොකුණු, විල්ලු, සහ කුඹුරු වැනි ස්වාභාවික මෙන්ම මිනිසා විසින් නිර්මාණය කරන ලද පරිසර පද්ධති ගණනාවක් ද දැකගත හැක. මෙම විවිධ වූ පරිසර පද්ධති ජීවී රටාසමයන් රාශියකට වාසස්ථාන සපයයි. ශ්‍රී ලංකාවේ මිරිදිය ජීවී ප්‍රජාව අතර මිරිදිය මසුන්ට විශේෂ ස්ථානයක් හිමිවේ. සුරතල් මසුන් ලෙස ශ්‍රී ලංකාවේ මිරිදිය මත්ස්‍ය රටාසමයන් ගණනාවක් ලොව පුරා ප්‍රසිද්ධියක් උසුලයි. එමෙන්ම ශ්‍රී ලංකාවේ දැනට වාර්තා වන මිරිදිය මත්ස්‍ය රටාසමයන් 82න් 44ක්ම (එසේත් නැතහොත් 54%) ශ්‍රී ලංකාවට ආවේණික වීම තවත් වැදගත් කරුණකි.

මෙම ආවේණික මත්ස්‍ය රටාසමයන් වැඩි වශයෙන් දැකගත හැක්කේ තෙත් කලාපීය ඇල දොල ආශ්‍රිතවය. නමුත් තෙත් කලාපය තුළ වේගයෙන් ව්‍යාප්ත වන ජනගහණය සහ ඔවුන්ගේ ක්‍රියාකාරකම් හේතු කොටගෙන මෙම තෙත් කලාපීය ඇල දොල දැඩි ආතතියකට ලක්වී ඇත. මේ හේතුවෙන් ශ්‍රී ලංකාවේ මිරිදිය මත්ස්‍ය රටාසමයන්ගෙන් 9ක් ගෝලීය වශයෙන්ද 28 දේශීය වශයෙන්ද වඳවී යාමේ තර්ජනයට ලක්වී ඇති බැව් ලෝක සංරක්ෂණ සංගමය විසින් ප්‍රකාශිත රතු දත්ත පොතෙහි සඳහන් වේ. තවද මත්ස්‍ය රටාසමයන් 2ක් (*Labeo lankae* සහ *Macrognathus aral*) මේ වන විට ශ්‍රී ලංකාවෙන් වඳවී ගොස් ඇති බවටද අනුමාන කෙරේ.

තෙත් කලාපයේ ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම සඳහා රක්ෂිතයන් ගණනාවක් ස්ථාපනය කර ඇති නමුත් මෙම රක්ෂිතයන් තුළින් මිරිදිය මසුන් සඳහා ලැබෙන ආවරණය ඉතා සීමිතය. මීට හේතුව, මෙම රක්ෂිතයන් බොහොමයක් පිහිටා ඇත්තේ උප කඳුකර සහ කඳුකර ප්‍රදේශ වල බැවින් ඒ තුළ දැකගත හැක්කේ වේගයෙන් ගලායන ගංගා ඇල දොල වීමය. මෙවන් ඇලදොලවල විසීමට අනුවර්තනය දක්වන්නේ ඉතා සීමිත මිරිදිය මත්ස්‍ය රටාසමයන් ගණනාවකි. එබැවින් ශ්‍රී ලංකාවට ආවේණික සහ තර්ජනයට ලක්වූ රටාසමයින්ගෙන් වැඩි

ප්‍රතිශතයක් දැකගත හැක්කේ ආරක්ෂිත ජාලයෙන් පිටත පිහිටා ඇති ඇල දොලවලය. මෙම ඇල දොල තර්ජන රාශියකට ලක්වී ඇති බැවින් ශ්‍රී ලංකාවේ මිරිදිය මසුන්ගේ දීර්ඝ කාලීන පැවැත්ම තහවුරු කිරීම විශාල අභියෝගයක් වී ඇත.

සංරක්ෂණය සඳහා යොදාගන්නා ක්‍රමවේදයන් අතර දැනුවත් කිරීම ඉතා වැදගත් ස්ථානයක් ගනී. ශ්‍රී ලංකාවේ මිරිදිය මසුන් පිළිබඳව අධ්‍යයනයට ලැදි ශ්‍රී ලාංකිකයින්ට මුහුණ පෑමට සිදුවී ඇති ප්‍රධානතම බාධකයන් වන්නේ ශ්‍රී ලංකාවේ මිරිදිය මසුන් පිළිබඳ රචිත පොත් පත් ප්‍රමාණය අඩුවීමය. මින් බොහෝ ග්‍රන්ථයන් පළකොට ඇත්තේ ඉංග්‍රීසි බසිනි. තවද එම පොත්ද බොහොමයක් අද වෙළඳ පොලෙහි දැකගත නොහැක. එබැවින් සම්පත් ගුණතිලක හෙළ බසින් සිරිලක මිරිදිය මසුන් පිළිබඳ ග්‍රන්ථයක් පළ කිරීම මා දකින්නේ කාලෝචිත මෙන්ම යුගයේ අවශ්‍යතාවයක් ඉටු කිරීම සඳහා ගත් පියවරක් ලෙසය.

මා සම්පත් ගුණතිලක හඳුනාගත්තේ මීට වසර 10කට පමණ පෙරය. එවකට ඔහු විවෘත විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයකු වූ අතර, කුරු ගඟ ද්‍රෝණියේ මිරිදිය මත්ස්‍ය විවිධත්වය පිළිබඳ ඔහුගේ අවසන් වසර ව්‍යාපෘතිය මගේ අධීක්ෂණය යටතේ සිදු කෙරිණි. එදා මෙදා තුර සම්පත් මා සමග ව්‍යාපෘති ගණනාවක් සඳහා සහභාගි වූ අතර මට හැඟෙන ආකාරයට මෑත කාලයේදී ශ්‍රී ලංකාවේ බිහිවුණු දක්ෂතම තරුණ සත්ත්ව විද්‍යාඥයින් කිහිප දෙනා අතරින් සම්පත් ද එක් අයෙකි. ඔහු විසින් රචිත මෙම ග්‍රන්ථය තාක්ෂණික වශයෙන් ඉතා ඉහළ ප්‍රමිතියකට නිර්මාණය වී ඇති අතර ඉතා සරළව සිරිලක මිරිදිය මසුන් පිළිබඳව පාඨකයා දැනුවත් කිරීමට පොහොසත් වී ඇත. අවසන් වශයෙන් ඔහු විසින් ගත් මෙම ප්‍රශංසනීය පියවර අගය කරන අතර, ඉදිරියේදී මෙවන් ග්‍රන්ථ රාශියක් එළිදැක්වීමට ඔහුට ධෛර්යය සහ ආශීර්වාදය ලැබේවා යයි පතමි.

ආචාර්ය දේවක වීරකෝන්
සත්ත්ව විද්‍යා දෙපාර්තමේන්තුව,
කොළඹ විශ්ව විද්‍යාලය,
කොළඹ 03.

# ප්‍රස්තාවනාව

ශ්‍රී ලංකාව ජෛව විවිධත්වයෙන් පොහොසත් වුව ද, එක් එක් සත්ත්ව වර්ග හඳුනා ගැනීම සඳහා පළවී ඇති ක්ෂේත්‍ර පොත් සංඛ්‍යාව අල්පය. එසේම මෙතෙක් පළවී ඇති ක්ෂේත්‍ර පොත් වැඩිමනක් ඉංග්‍රීසියෙන් ලියවී ඇති අතර ඒවාද ඌණ පූර්ණයන් සහිතය. එනම් එක් සත්ත්ව වර්ගයක් හඳුනා ගැනීම සඳහා පොත් පත් කිහිපයක් පරිශීලනය කිරීමටත්, පර්යේෂණ පත්‍රිකා පරිශීලනය කිරීමටත් සිදුවී ඇත. පාසැල් සහ විශ්වවිද්‍යාල සිසුන් ද ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන දූ දරුවන් සහ වැඩිහිටියන් ද ඇතුළුව සිංහල පාඨකයනට ලියවී ඇති ක්ෂේත්‍ර පොත් බොහොමයක් පක්ෂීන්, උරගුන් සහ උභය ජීවීන්ට සීමාවී ඇත. එබැවින් ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර මිරිදිය ජලාශ, ගංගා සහ ඇල දොල ආශ්‍රිතව වාර්තා වන මත්ස්‍ය රටාසමයන් හඳුනා ගැනීම සඳහා සරළ ක්ෂේත්‍ර අධ්‍යයන ග්‍රන්ථයක් සිංහල මාධ්‍යයෙන් ඉදිරිපත් කිරීම මෙහි මූඛ්‍ය පරමාර්ථය වේ. එබැවින් විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ පමණක් නොව මිරිදිය මසුන් පිළිබඳව උනන්දුවක් දක්වන සියලු පිරිස් උනන්දු කරවීම සඳහාත් පාසැල් සිසුන්ගේ ක්ෂේත්‍ර අධ්‍යයන පහසු කරලීම සඳහාත් මෙම ග්‍රන්ථය පිටුවහලක් වනු ඇතැයි විශ්වාස කරන්නෙමු.

ශ්‍රී ලංකාවේ මිරිදිය මසුන් ග්‍රන්ථය සම්පාදනයේදී අපහට ඇප උපකාර කළ පිරිසකි. මේ අතරින් මෙම ග්‍රන්ථය සම්පාදනය සඳහා මා හට ඇරයුම් කළ පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂක ගාමිණී ගමගේ මහතාට මගේ පළමු කෘතඥතාව පළ කරමි. එතුමා විසින් 2006 වසරේදී ගිරිතලේ පැවති වැඩමුළුවකදී මේ පිළිබඳ මුල් අදහස ඇති නොකරන්නට, මෙම ග්‍රන්ථය එළිදැක්වීමට තවත් බොහෝ කලක් ගතවනු නියතය.

එමෙන්ම, ශ්‍රී ලංකාවේ මිරිදිය මසුන් පිළිබඳ මා සතු යම් දැනුමක් වෙද්ද, එම දැනුම මා සතු වූයේ 1989 වසරේ දී ශ්‍රී ලංකා තරුණ සත්ත්ව වේදීන්ගේ සංගමයෙන් අරඹන ලද ගමන් මඟ සමගය. තරුණ සත්ත්වවේදීන්ගේ සංගමයේ ජලජ ජීවී අධ්‍යයන ඒකකයේ උපදේශකව සිටි ශාන්තසිරි ජයවීර මහතා සහ පක්ෂි අධ්‍යයන ඒකකයේ උපදේශක කැලුම් මනමේන්ද්‍ර-ආරච්චි මහතාගෙන් ලද දැනුම, විශ්වවිද්‍යාලයේදී ආචාර්ය දේවක වීරකෝන් මහතා යටතේ පුළුල් කර ගැනුමට හැකිවූ බැවිනි. විවිධ අවස්ථාවන් හිදී පර්යේෂණ පත්‍රිකා සපයා දීමෙන්, ක්ෂේත්‍රයේදී සහය දීමෙන් සහ ග්‍රන්ථ සම්පාදනයේ දී නන් අයුරින් සහාය දුන් රොහාන්

පෙතියාගොඩ, ආචාර්ය චන්න බඹරදෙනිය, දිනේශ් ගබඩාගේ, රනිල් පෙරේරා, සුරංජන් ප්‍රනාන්දු, සුජාන් මදුරංග, ආනන්ද ලාල් පීරිස්, නලින්ද පීරිස්, භාතිය කැකුලන්දල, නාලින් පෙරේරා, සරත් ඒකනායක, සමීර කරුණාරත්න සහ ශ්‍රීපාලි ඉලංගන්තිලක මහතුන් හටද මගේ හෘදයාංගම කෘතවේදීත්වය පළ කරන්නෙමි. මිරිදිය මසුන්ට අදාළ පැරණි පර්යේෂණ පත්‍රිකා සොයා ගැනීමේදී, උපකාර කළ බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ රජිත් දිසානායක, Linnean Society of London හි උප පුස්තකාලයාධිපති ලින්ඩා බෘෂ්ර්ක්ස් සහ ලෝක සංරක්ෂණ සංගමයේ ශ්‍රී ලංකා ශාඛාවේ පුස්තකාලාධිපති දර්ශනී විජේසිංහ මහත්ම මහත්මීන් හට විශේෂ ස්තූතිය පුදකරමි.

ග්‍රන්ථයෙහි වැඩකටයුතු ආරම්භ කළ දිනයේ සිට නිවසේදී මාහට ඇප උපකාර කළ ආදරණීය මෑණියන්, දයාබර බිරිඳ සහ රූප සිතුවම් කරන විට මා පසුපසින් සිටිමින් උරහිසට නිකටින් බරදී, එකම සිතුවම කිහිපවරක් සිතුවමට නැංවීම දක්වා කාර්ය භාරය දෙගුණ තෙගුණ කළ මා සුරතල් පුතු ද සෙනෙහසින් සිහිපත් කරන්නෙමි.

එමෙන්ම සියලු මුද්‍රණ කටයුතු සම්බන්ධීකරණය කළ ජෛව විවිධත්ත්ව ලේකම් කාර්යාලයේ හසුලා රාජපක්ෂ මහත්මිය සහ දක්ෂිණි පෙරේරා මහත්මියටත් සිංහල අක්ෂර සංයෝජනය කළ මංජුල ගුණරත්න මහතාටත්, ව්‍යාකරණ දෝෂ නිවැරදි කළ එම්. ඩී. එස්. සෙනෙවිරත්න මහත්මා සහ සීතා රාජපක්ෂ මහත්මියටත්, සිතියම් සකස්කර දුන් ප්‍රසන්න සමරවික්‍රම මහතාටත්, ග්‍රන්ථය මනාඅයුරින් මුද්‍රණය කළ නුගේගොඩ නියෝ ග්‍රැෆික්ස් මුද්‍රණ ආයතනයටත් මගේ අවංක ස්තූතිය පුදකරමි.

ග්‍රන්ථයේ ගුණාත්මක බව ඉහළ නැංවීමට හැකි සෑම වෙහෙසක්ම මා විසින් දැරූ මුත් තවත් අඩුපාඩු කොතෙකුත් පැවතිය හැකිය. එබැවින් යම් ගුණ දොසක් වෙතොත් ඉතා කරුණාවෙන් අප හට දන්වා එවන්නේනම් ඉදිරියේදී වරද නිවැරදි කරලීමට හැකිවනු ඇත.

සම්පත් ද අල්විස් ගුණතිලක
17, සිරිසඟබෝ පාර,
කව්ඩාන,
දෙහිවල.

Tel: 0112714311
2007 මැයි 22.

LIBRARY
Ministry of Environment &
Natural Resources.

# පටුන


| | |
|---|---|
| හැඳින්වීම | 1-27 |
| ග්‍රන්ථය පරිශීලනයට උපදෙස් | 2-4 |
| මත්ස්‍යයන්ගේ රූප විද්‍යාත්මක ලක්ෂණ | 4-7 |
| මිනුම් | 7-8 |
| ගණනයන් | 9-10 |
| මත්ස්‍ය පරිසර විද්‍යාව | 11-15 |
| ආහාර | 15-16 |
| බෝවීම | 16-18 |
| ශ්‍රී ලංකාවේ මත්ස්‍ය විද්‍යාත්මක කලාප | 18-21 |
| මිරිදිය මත්ස්‍යයනට ඇති තර්ජන | 22-25 |
| ශ්‍රී ලංකාවේ මිරිදිය මත්ස්‍ය අධ්‍යයන ඉතිහාසය | 25-27 |
| ශ්‍රී ලංකාවේ මිරිදිය මත්ස්‍ය කුල හඳුනා ගැනුමට සුබෙදුන් සුචිය | 28-31 |
| ශ්‍රී ලංකාවේ මිරිදිය මත්ස්‍ය රටාසමයන් හඳුනා ගැනුමට සුබෙදුන් සුචිය | 32-44 |
| ශ්‍රී ලංකාවේ මිරිදිය මසුන් | |
| පලක 01 | 46-47 |
| *1.1* *Anguilla bicolor* McClelland, 1844 | |
| *1.2* *Anguilla nebulosa* McClelland, 1844 | |
| *1.3* *Ophisternon bengalense* McClelland, 1844 | |
| *1.4* *Monopterus desilvai* Bailey & Gans, 1998 | |
| පලක 02 | 48-49 |
| *2.1* *Macrognathus aral* (Bloch & Schneider, 1801) | |
| *2.2* *Mastacembelus armatus* (Lacepède, 1803) | |
| *2.3* *Zenarchopterus dispar* (Valenciennes, 1846) | |
| *2.4* *Xenentodon cancila* (Hamilton, 1822) | |
| *2.5* *Hyporhamphus limbatus* Valenciennes, 1846 | |

ඵලක 03 50-51

*3.1* *Clarias brachysoma* Günther, 1864

*3.2* *Heteropneustes fossilis* (Bloch, 1797)

*3.3* *Wallago attu* (Bloch & Schneider, 1801)

*3.4* *Ompok bimaculatus* (Bloch, 1794)

*3.5* *Chitala ornata* (Gray, 1831)

ඵලක 04 52-53

*4.1* *Mystus gulio* (Hamilton, 1822)

*4.2* *Mystus cavasius* (Hamilton, 1822)

*4.3* *Mystus vittatus* (Bloch, 1794)

*4.4* *Pterygoplichthys multiradiatus* (Hancock, 1828)

ඵලක 05 54-55

*5.1* *Acanthocobitis urophthalmus* (Günther, 1868)

*5.2* *Schistura notostigma* (Bleeker, 1863)

*5.3* *Lepidocephalichthys jonklaasi* (Deraniyagala, 1956)

*5.4* *Lepidocephalichthys thermalis* (Valenciennes, 1846)

ඵලක 06 56-57

*6.1* *Awaous melanocephalus* (Bleeker, 1849)

*6.2* *Glossogobius giuris* (Hamilton, 1822)

*6.3* *Oligolepis acutipinnis* (Valenciennes, 1837)

*6.4* *Stenogobius malabaricus* (Day, 1865)

*6.5* *Schismatogobius deraniyagalai* Kottelat & Pethiyagoda, 1989

ඵලක 07 58-59

*7.1* *Sicyopterus griseus* (Day, 1878)

*7.2* *Sicyopterus halei* (Day, 1888)

*7.3* *Sicyopus jonklaasi* Klausewitz & Henrich, 1986

*7.4* *Stiphodon martenstyni* Watson, 1998

ඵලක 08 60-61

*8.1* *Garra ceylonensis* Bleeker, 1863

*8.2* *Garra* cf. *phillipsi* Deraniyagala, 1933

*8.3* *Butis butis* (Hamilton, 1822)

*8.4* *Eleotris fusca* (Bloch & Schneider, 1801)

පලක 09 62-63

*9.1* *Channa ara* (Deraniyagala, 1945)

*9.2* *Channa gachua* (Hamilton, 1822)

*9.3* *Channa orientalis* Bloch & Schneider, 1801

*9.4* *Channa punctata* (Bloch, 1794)

*9.5* *Channa striata* (Bloch, 1793)

පලක 10 64-65

*10.1* *Aplocheilus dayi* (Steindachner, 1892)

*10.2* *Aplocheilus werneri* Meinken, 1966

*10.3* *Aplocheilus parvus* (Raj, 1916)

*10.4* *Oryzias* cf. *melastigma* (McClelland, 1839)

පලක 11 66-67

*11.1* *Etroplus maculatus* (Bloch, 1785)

*11.2* *Etroplus suratensis* (Bloch, 1785)

*11.3* *Anabas testudineus* (Bloch, 1795)

*11.4* *Helostoma temminckii* Valenciennes, 1842

පලක 12 68-69

*12.1* *Belontia signata* (Günther, 1861)

*12.2* *Malpulutta kretseri* Deraniyagala, 1937

*12.3* *Pseudosphromenus cupanus* (Cuvier, 1831)

*12.4* *Osphronemus goramy* Lacepède, 1802

පලක 13 70-71

*13.1* *Trichogaster pectoralis* (Regan, 1910)

*13.2* *Trichogaster trichopterus* (Pallas, 1777)

*13.3* *Oreochromis mossambicus* (Peters, 1852)

*13.4* *Oreochromis niloticus* (Linnaeus, 1766)

පලක 14 72-73

*14.1* *Amblypharyngodon grandisquamis* Jordan & Starks, 1917

*14.2* *Amblypharyngodon melattinus* (Valenciennes, 1844)

*14.3* *Rasboroides atukorali* (Deraniyagala, 1943)

*14.4* *Rasboroides vaterifloris* (Deraniyagala, 1930)

ඵලක 15 74-75

**15.1** *Chela ceylonensis* Hamilton, 1822
***15.2*** *Devario malabaricus* (Jerdon, 1849)
***15.3*** *Devario pathirana* (Kottelat & Pethiyagoda, 1990)
***15.4*** *Devario* cf. *aequipinnatus* (McClelland, 1839)

ඵලක 16 76-77

***16.1*** *Esomus thermoicos* (Valenciennes, 1842)
***16.2*** *Rasbora daniconius* (Hamilton, 1822)
***16.3*** *Rasbora caverii* (Jerdon, 1849)
***16.4*** *Rasbora wilpita* Kottelat & Pethiyagoda, 1991
***16.5*** *Puntius pleurotaenia* Bleeker, 1863

ඵලක 17 78-79

***17.1*** *Labeo dussumieri* (Valenciennes, 1842)
***17.2*** *Labeo fisheri* Jordan & Starks, 1917
***17.3*** *Labeo lankae* Deraniyagala, 1952
***17.4*** *Labeo rohita* (Hamilton, 1822)

ඵලක 18 80-81

***18.1*** *Puntius asoka* Kottelat & Pethiyagoda, 1989
***18.2*** *Puntius martenstyni* Kottelat & Pethiyagoda, 1991
***18.3*** *Puntius sarana* (Hamilton, 1822)
***18.4*** *Puntius singhala* (Duncker, 1912)

ඵලක 19 82-83

***19.1*** *Puntius bandula* Kottelat & Pethiyagoda, 1991
***19.2*** *Puntius cumingii* (Günther, 1868)
***19.3*** *Puntius nigrofasciatus* (Günther, 1868)
***19.4*** *Puntius srilankensis* (Senanayake, 1985)

ඵලක 20 84-85

***20.1*** *Puntius bimaculatus* (Bleeker, 1863)
***20.2*** *Puntius vittatus* Day, 1865
***20.3*** *Puntius* cf. *ticto* (Hamilton, 1822)
***20.4*** *Puntius titteya* Deraniyagala, 1929

ඵලක 21 86-87

*21.1* *Puntius chola* (Hamilton, 1822)
*21.2* *Puntius dorsalis* (Jerdon, 1849)
*21.3* *Puntius cf. amphibius* (Valenciennes, 1842)
*21.4* *Tor khudree* (Sykes, 1841)

ඵලක 22 88-89

*22.1* *Carassius auratus* (Linnaeus, 1758)
*22.2* *Cyprinus carpio* Linnaeus, 1758
*22.3* *Ctenopharyngodon idella* (Valenciennes, 1844)
*22.4* *Hypothalmichthys molitrix* (Valenciennes, 1844)

ඵලක 23 90-91

*23.1* *Cirrhinus mrigala* (Hamilton, 1822)
*23.2* *Catla catla* (Hamilton, 1822)
*23.3* *Megalops cyprinoides* (Broussonet, 1782)
*23.4* *Oncorhynchus mykiss* (Walbaum, 1792)

ඵලක 24 92-93

*24.1* *Aristichthys nobilis* (Richardson, 1844)
*24.2* *Ehirava fluviatilis* Deraniyagala, 1929
*24.3* *Toxotes chatareus* (Hamilton, 1822)
*24.4* *Xiphophorus maculatus* (Günther, 1866)

ඵලක 25 94-95

*25.1* *Gambusia affinis* (Baird & Girard, 1853)
*25.2* *Poecilia reticulata* Peters, 1859
*25.3* *Xiphophorus helleri* Heckel, 1848

විමර්ශන ග්‍රන්ථ නාමාවලිය (Literature cited) 96-99
ශ්‍රී ලංකාවේ මිරිදිය මත්ස්‍ය නාමාවලිය (Freshwater fishes of Sri Lanka) 100-116
විද්‍යාත්මක නාම සූචිය (Index for Scientific names) 117-121
ඉංග්‍රීසි නාම සූචිය (Index for English names) 122-126
සිංහල නාම සූචිය (Index for Sinhala names) 127-134

# හැඳින්වීම

ශ්‍රී ලංකාව වර්ග කිලෝ මීටර 65,610 ක වපසරියකින් යුක්ත නිවර්තන කලාපීය කුඩා දූපතක් වුවද, දිවයින තුළ ඇති භූගෝලීය විවිධත්වය හේතුකොට, දිවයින පුරා ජාලයක් සේ ගලායන ගංගා 103 කින් පොහොසත්ය. මීට අමතරව ගංගා මුහුදට එක්වන ස්ථාන ආශ්‍රිතව ගංගා මෝය, කලපු ආදී ස්වභාවික ජලජ පරිසර පද්ධතීන් ද, වසර දහස් ගණනක් පැරණි මිනිසා විසින් නිර්මාණය කරන ලද වියලි කලාපය පුරා පැතිරී ඇති වැව් සහ මෑත කාලයේ තෙත් කලාපය ඇසුරේ තනන ලද මහා පරිමාණ ජලාශ පරිසර පද්ධතීන්ගෙන් ද පොහොසත්ය. මෙම ජලජ පරිසර පද්ධති ඉහළ මිරිදිය මත්ස්‍ය විවිධත්වයක් රඳවා ගැනීම සඳහා වාසස්ථාන සපයයි.

ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ජලජ පද්ධති තුළින් වාර්තා වන මත්ස්‍ය රටාසමයන් (විශේෂ = Species) ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැක. එනම් මිරිදිය පරිසර පද්ධති ආශ්‍රිතව (Freshwater inhabiting) වාසය කරන රටාසමයන් සහ කිවුල්දිය ආශ්‍රිතව (Brackish water inhabiting) වාසය කරන රටාසමයන් ලෙසය. මීට අමතරව රටාසමයන්ගේ නිජ භූමි පදනම් කරගෙන දේශීය හෙවත් නිවැසි රටාසමයන් (Indigenous species), ආවේණික හෙවත් තැන්වැති රටාසමයන් (Endemic species) සහ හඳුන්වා දුන් රටාසමයන් (Introduced species) ලෙස ද වර්ගීකරණය කළ හැකිය. වර්තමානයේ ශ්‍රී ලංකාවේ මිරිදිය මත්ස්‍යයන් පිළිබඳව සිදුකර ඇති අධ්‍යයනයන් ඉතා මඳ බව 2000 වසරේ ලෝක සංරක්ෂණ සංගමයේ ශ්‍රී ලංකා ශාඛාව (IUCN Sri Lanka) මගින් ප්‍රකාශයට පත්කරන ලද තර්ජනයට පත් සත්ත්ව හා ශාක පිළිබඳ ජාතික ලැයිස්තුව සැකසීමේදී අපහට හැඟී ගිය කරුණකි. එනම් මිරිදිය මසුන්ගේ ව්‍යාප්තිය, විවිධත්වය, පරිසර විද්‍යාව, අභිජනනය, හැසිරීම් රටා, ගහණ ඝනත්වය පිළිබඳව විධිමත් පර්යේෂණ සිදුකිරීමේ අවශ්‍යතාවක් ඇත. එසේම තවමත් විද්‍යාත්මකව හඳුනා නොගත් රටාසමයන් ගණනාවක්ද ඇති බවට ක්ෂේත්‍ර (Field) සහ සුබෙදුන් (Taxonomists) විද්‍යාඥයන් විසින් පෙන්වා දී ඇත.

ශ්‍රී ලංකාවේ මිරිදිය මත්ස්‍ය විවිධත්වය යම්තාක් දුරකට නිරවුල් වූයේ 1991 වසරේදී රොහාන් පෙතියාගොඩ මහතා විසින් සම්පාදිත Freshwater fishes of Sri Lanka ග්‍රන්ථයෙනි. මෙම ග්‍රන්ථයෙහි මිරිදිය පරිසර පද්ධති ආශ්‍රිත දේශීය රටාසමයන් 65 ද, කිවුල්දිය ආශ්‍රිත දේශීය රටාසමයන් 23 ද, ශ්‍රී ලංකාවේ මිරිදිය

පරිසර පද්ධතිවලට හඳුන්වාදුන් රටාසමයන් 21 ද ඇතුළත් කර තිබින. දේශීය හෙවත් නිවැසි රටාසමයන්ගෙන් 29 ක් ශ්‍රී ලංකාවට ආවේණික රටාසමයන් ලෙස පිළිගැනිණ. 1991 වසරෙන් පසු නව රටාසමයන් කිහිප දෙනෙකු ශ්‍රී ලංකාවේ මිරිදිය පරිසර පද්ධතිවලින් සොයාගත් අතර, ආවේණික රටාසමයන් කිහිපදෙනෙකු ඉන්දියානු අර්ධද්වීපයෙන් වාර්තාවීමත් සමග ආවේණික ලැයිස්තුවේද වෙනස්කම් ඇතිවිණ. එසේම, සුබෙදුන් ගැටලු සහිත ස්ථාන නිරාකරණය වීම නිසා රටාසමයන්ගේ විද්‍යාත්මක නාමයන් වෙනස්වීමද සිදුවිය. එමෙන්ම මිරිදිය මසුන්ගේ ජාන පර්යේෂණ සිදු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඉදිරියේදී නව රටාසමයන් රැසක් විද්‍යාත්මකව හඳුන්වාදීමට නියමිතය (Bossuyt *et al.*, 2004).

කෙසේ වෙතත් අවසන් වරට ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර මිරිදිය පද්ධති ඇසුරු කරන මත්ස්‍ය නාමාවලියක් 2006 වසරේදී රොහාන් පෙතියාගොඩ මහතා විසින් සම්පාදනය කරන ලදී. එයට නිවැසි රටාසමයන් 82 ක් ඇතුළත් අතර ඉන් රටාසමයන් 44 ක් ආවේණික ලෙස සැළකේ. ආවේණික රටාසමයන් අතරින් රටාසමයන් 12 ක් තවමත් විද්‍යාත්මකව ප්‍රකාශයට පත් නොවූවන් වේ. එසේම මෙතෙක් ශ්‍රී ලංකාවෙන් හඳුනාගෙන සිටි *Mystus keletius* (Valenciennes, 1842); *Garra phillipsi* Deraniyagala, 1933; *Puntius ticto* (Hamilton, 1822); *Puntius amphibius* (Valenciennes, 1842); *Oryzias melastigmus* (McClelland, 1839) වැනි රටාසමයන් මිරිදිය මත්ස්‍ය නාමාවලියෙන් ඉවත්කර ඇත. මෙවැනි ව්‍යාකූල තත්ත්වයක් තුළ මෙම ග්‍රන්ථය සම්පාදනය කිරීමේදී කුමන නාමාවලියක් පදනම් කරගන්නේද යන්න අභියෝගයක් විය. 1991 සහ 2006 මිරිදිය මත්ස්‍ය නාමාවලි අධ්‍යයනය කර තවම විද්‍යාත්මකව ප්‍රකාශයට පත් නොවූ රටාසමයන් හැර, විද්‍යාත්මකව හඳුනාගත හැකි, ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර මිරිදිය ජලජ පද්ධති තුළින් වාර්තා වන මත්ස්‍ය රටාසමයන් 111 ක නාමාවලියක් ග්‍රන්ථය අවසානයේ දක්වා ඇත. ඉන් රටාසමයන් 104 ක් හඳුනා ගැනීම සඳහා ඇවසි සුබෙදුන් සූචි, රූප සටහන් සහ විස්තර මෙහි ඇතුළත් කර ඇත.

## ග්‍රන්ථය පරිශීලනයට උපදෙස්

මෙම කෘතිය තුළින් ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර මිරිදිය පරිසර පද්ධති ඇසුරු කර මෙතෙක් විද්‍යාත්මකව හඳුනාගෙන ඇති මත්ස්‍ය රටාසමයන් නිවැරදිව ක්ෂේත්‍රයේදී හඳුනා ගැනුමට අවශ්‍ය කරන තොරතුරු කෙටියෙන් සහ සරළව ඉදිරිපත් කර ඇත.

ක්ෂේත්‍රයේදී හමුවන මත්ස්‍ය රටාසමයන් කුමන කුලයකට (Family) අයත් ද යන්න හඳුනා ගැනීමට සරළ සුබෙදුන් සූචියක් (Taxonomic key) සහ එක් එක් කුලයට අයත් රටාසමයන් වෙන්කර හඳුනාගැනීමට සුබෙදුන් සූචියක් සපයා ඇත. මේ සඳහා රටාසමයන්ගේ බාහිර රූපාකාරය (External morphology) සහ වර්ණ රටා උපයෝගී කරගෙන ඇත.

ග්‍රන්ථයේ දෙවන භාගයේ රටාසමයන්ගේ රූප ඵලක සමඟ හඳුනා ගැනීමේ දත්ත පෙළගස්සා ඇත. මෙහි මත්ස්‍යයාගේ විද්‍යාත්මක නාමය, සිංහල නාමයන්, විද්‍යාත්මකව හඳුනා ගැනීමට අවශ්‍ය කරන කිරණ සහ කොරළ සටහන (පර්යේෂණාගාරක් තුළ විද්‍යාත්මක අධ්‍යයනය කරන්නෙකුට වැදගත් වේ) සහ හඳුනාගැනීමේ ලක්ෂණ දක්වා ඇත. මේ සඳහා දැරණියගල (1952), මොන්රෝ (1955), ප්‍රනාන්දු (1990), සහ පෙතියාගොඩ (1991) ග්‍රන්ථ ඇසුරු කොට ඇත. ක්ෂේත්‍රයේදී හඳුනා ගැනීමට ඇවැසි ලක්ෂණ සහ වර්ණද, රටාසමයාගේ විරුද්ධ ලිංගිකයා හෝ පැටවා රූපාකාරයෙන් හෝ වර්ණ රටාවෙන් වෙනස්කම් ඇතිනම් ලක්ෂණද ඇතුළත්කර ඇත. එසේම වාසස්ථාන සහ ව්‍යාප්තිය, රටාසමයා හමුවන පරිසර පද්ධතියේ ස්වභාවය, මත්ස්‍ය විද්‍යාත්මක කලාප (Ichthiological provinces) ඇසුරෙන් හෝ දේශගුණික කලාප ඇසුරෙන් දක්වා ඇත. රූප ඵලක සඳහා සමාන හැඩ සහ සමාන වර්ණ රටාවන් ඇති රටාසමයන් එක් ඵලකයකට ගෙන ඒමට උත්සහ දරා ඇත. උපරිම දිග සෙන්ටි මීටර (cm) මගින් දක්වා ඇත.

ග්‍රන්ථය අවසානයේ දක්වා ඇති මත්ස්‍ය නාමාවලියෙහි, රටාසමයා හඳුනාගැනීමට වර්තමානයේ භාවිතා කරන විද්‍යාත්මක නාමය ද (Scientific name), නම් කිරීම සිදුකළ පුද්ගල නාමය සහ වර්ෂය දක්වා ඇත. 1991 දී පෙතියාගොඩ මහතාගේ Freshwater fishes of Sri Lanka ග්‍රන්ථයේ ඇතුළත් නාමයන් සංශෝධනයවී ඇති රටාසමයන්ගේ විද්‍යාත්මක නාමයට පහළින් එම රටාසමයා හැඳින්වීමට පෙතියාගොඩ මහතා (1991) භාවිතා කර ඇති නාමය පෙළගස්වා ඇත. විද්‍යාත්මක නාමයන්ට අමතරව මත්ස්‍යයා සඳහා භාවිතා කරන ඉංග්‍රීසි නාමය සහ සිංහල නාමයන්ද ඇතුළත් කර ඇත. එසේම එක් එක් රටාසමයාගේ සංරක්ෂණ තත්ත්වය (Conservation status) ලෝක සංරක්ෂණ සංගමයේ 2006 වසරේ ජාතික රතු දත්ත ලැයිස්තුව ඇසුරෙන් දක්වා ඇත. මීට අමතරව වනසත්ත්ව හා තුරුලතා ආරක්ෂක ආඥාපනත (1993 අංක 49, IV උප ලේඛනය) යටතේ සහ මිරිදිය මසුන් අපනයනයට අදාල ධීවර සහ ජලජ සම්පත්

ආඥාපනත (1996 අංක 2, I-II ලේඛනය) ආරක්ෂිත මසුන්ද සඳහන්කර ඇත. නාමාවලියේ පහත සඳහන් කෙටි යෙදුම් භාවිතාකර ඇත.

2006 වසරේ ජාතික රතු දත්ත ලයිස්තුව (IUCN Sri Lanka & MENR, 2006)
දැඩි අන්තරායක Critically endangered (CR)
අන්තරායක Endangered (EN)
අවදානම් Vulnerable (VU)
ආසන්න තර්ජිත - Near Threatened (NT)
තතු හීන Data deficient (DD)
වනසත්ත්ව හා තුරුලතා ආරක්ෂක ආඥාපනත (FFPO)
ධීවර සහ ජලජ සම්පත් ආඥාපනත අපනයනය සපුරා තහනම් - FAR Shedule I (FARS I)
ධීවර සහ ජලජ සම්පත් ආඥාපනත අපනයනය සීමාසහිත - FAR Shedule II (FARS II)

## මත්ස්‍යයන්ගේ රූප විද්‍යාත්මක ලක්ෂණ (Morphological Characters)




රූපය 1. මත්ස්‍යයන්ගේ බාහිර ලක්ෂණ. A. පෘෂ්ඨීය වරල (Dorsal fin) ; B. වලිග වරල (Caudal fin) ; C. අංශ රේඛාව (Lateral line) ; D. හිස (Head) ; E. අංකුට (Barbels) ; F. ළය වරල (Pectoral fin) ; G. ශ්‍රෝණි වරල (Pelvic fin) ; H. ගුද වරල (Anal fin) ; I. පිධානය (Operculum)




රූපය 2. පෘෂ්ඨීය වරල් වර්ග. a. කිරණ සහිත සාමාන්‍ය පෘෂ්ඨීය වරල ; b. කිරණ නොමැති මාංශලමය ඇඩිපස් වරල (Adipose fin). (උදා : *Mystus* spp.)




රූපය 3. වල්ග වරල් වර්ග ' a. වෘත්තාකාර (Round) ; b. චතුරස්‍රාකාර (Truncate) ; c. නතාග්‍රාකාර (Emarginate) ; d. බෙදුණු (Forked); e. කූඤ්ඤාකාර (Pointed); f. ශල්‍යාග්‍ර (Lanceolate)




රූපය 4. මුඛයේ පිහිටීම. a. අග්‍රස්ථ (Terminal) ; b. උප අග්‍රස්ථ (Sub terminal) ; c. උදරීය (Inferior) ; d. පෘෂ්ඨීය (Superior)




රූපය 5. අංකුට වර්ග' a. නාසා අංකුටය (Nasal barble) ; b. රෝස්ටල් අංකුටය (Rostal barble) ; c. හනු අංකුටය (Mandible barble) ; d. ඌර්ධව අංකුටය (Maxilary barble) ; e. අන්තර් ඌර්ධව හනු අංකුටය (Intermaxillary barble) ; f. මෙන්ටල් අංකුටය (Mental barble)

## මත්ස්‍යයන්ගේ දැකිය හැකි කොරළ වර්ග (Type of scales)

හැඩය හා ව්‍යුහය අනුව ලොව වෙසෙන මත්ස්‍යයන්ගේ කොරළ වර්ග හතරක් හඳුනාගෙන ඇත.

1. ප්ලැකොයිඩ් කොරළ (Placoid scales)
   මේවා එලක ආකාර අතර, එහි තුන්ඩ දැකිය හැක. මෙවැනි කොරළ කාටිලේජීය මත්ස්‍යයන්ගේ පිහිටා ඇත. උදා :- මෝරුන්, මඩුවන්

2. කොස්මොයිඩ් කොරළ (Cosmoid scales)
   මෙම කොරළ ඉතා පුරාණ මත්ස්‍ය විශේෂවල දැකිය හැක. මෙවැනි කොරළ සීලාකාන්ත් මත්ස්‍යයන්ගේ (Coelocanth fish) පිහිටා ඇත.

3. ගැනොයිඩ් කොරල (Ganoid scales)
   මේවා ද පුරාණ පෙනහළු මත්ස්‍යයන්ගේ පිහිටා ඇත.

4. ටෙනොයිඩ් කොරළ (Ctenoid scales)
   පැතලි කොරළ වන මේවායේ අපර දාරයේ කුඩා බණ්ඩක සහිතය. උදා :- තිලාපියා රටාසමයන්ගේ (*Tilapia* spp.)

5. සයික්ලොයිඩ් කොරළ (Cycloid scales)
   මේවා ආසාන්න හැඩයෙන් වෘත්තාකාර වේ. Cyprinidae කුලයේ රටාසමයන්ගේ.

## රූප විද්‍යාත්මක ලක්ෂණ ලබා ගැනීම

ක්ෂේත්‍රයේදී වර්ණය සහ හැඩය භාවිතා කර මත්ස්‍යයෙකු හඳුනාගත හැකි වුවද, විද්‍යාත්මකව හඳුනාගැනීමේදී මත්ස්‍ය නිදර්ශකයේ නිවැරදි මිනුම් (Measurements) සහ ගණනයන් (Counts) ලබාගැනීම වැදගත් වේ. මේ සඳහා මත්ස්‍ය නිදර්ශකයේ වම්පස තෝරා ගන්නා අතර යම් ආකාරයකින් වම්පස හානියට ලක්ව ඇත් නම් දකුණු පස මිනුම් සහ ගණනයන් සිදුකරන අතර එවිට ඒ බව සඳහන් කළ යුතුව ඇත. මිනුම් ලබා ගැනීමේදී මූලික උපකරණ ලෙස වර්නියර් කැලිපරයක් (Vernier Caliper), යකඩ කෝදුවක් සහ බෙදුම් කටුවක් භාවිතා කෙරේ. බෙදුම් කටුව භාවිතා කර මිනුම් ලබා ගැනීමේදී තෙවරක් පාඨාංක ලබාගන්නා අතර එහි මධ්‍යන අගය අවසන් මිනුම ලෙස භාවිතා කෙරේ.

### මිනුම් (Measurements)




රූපය 6. මත්ස්‍යයෙක් හඳුනා ගැනීමේදී උපයෝගී කර ගන්නා මිනුම්.

1. උපරිම දිග (Total length) (රූපය 6.1) - මත්සයාගේ හොම්බ (Snout) ඉදිරි කෙළවරේ සිට වලිගය අවසානය දක්වා.

2. සම්මත දිග (Standard length) (රූපය 6.2) - හොම්බ ඉදිරි කෙළවරේ සිට වලිගයේ මැද නාරටිය පටන් ගන්නා ස්ථානයට (මත්ස්‍ය නිදර්ශකයේ වල්ගයෙන් අල්ලා නැමීමේදී වල්ග නටුවෙන් නැමෙන ස්ථානය තෙක් හොම්බ කෙලවරේ සිට දුර ප්‍රායෝගිකව ලබාගත හැකsh.)
3. හොම්බ කෙළවරේ සිට ගුදය දක්වා (Snout to vent) (රූපය 6.3) - බෙදුම් කටුව ආධාරයෙන් ලබා ගැනේ.
4. හිසේ දිග (Head length) (රූපය 6.4) - හොම්බ කෙළවරේ සිට පිධානයේ අවසන් කෙළවර හෙවත් පිධාන පටලය (operculum membrane) වන තෙක්. බිළාල කුලයේ මසුන්ගේ (*Mystus* spp., *Clarius* sp. etc.) හිසේ දිග ගැනීමේදී අපර කපාල තේරීමේ කෙළවර තෙක් මිනුම් ගැනේ.
5. පූර්ව පෘෂ්ඨීය දුර (Pre-dorsal length) (රූපය 6.5) - උඩහනුවේ කෙළවරේ සිට පෘෂ්ඨීය වරල පටන් ගන්නා ස්ථානය තෙක්.
6. වලිග නටුවේ උස (Caudal peduncle depth) (රූපය 6.6)
7. වලිගයේ දිග (Length of caudal fin) (රූපය 6.7) - වල්ගයේ ආරම්භයේ සිට වල්ග වරලේ කෙලවර තෙක්.
8. ශරීරයේ ගැඹුර (Body depth) (රූපය 6.8) - මත්ස්‍යයාගේ සිරුරේ උපරිම උස ලබා ගැනේ. (බොහෝ විට පෘෂ්ඨීය වරලේ කිරණ පටන් ගන්නා ස්ථානයේ සිට ශරීරයේ පහළ මාංශ කෙළවර තෙක් දිග).
9. අක්ෂිකූප විෂ්කම්භය (Orbit diameter) (රූපය 6.9) - මත්ස්‍යයාගේ අක්ෂිකූපවල අස්ථිමය මායිම් අතර දුර.
10. පෘෂ්ඨීය වරලේ දිග (Length of dorsal fin) (රූපය 6.10) - දිගම කණ්ඨකය (spine) හෝ දිගම කිරණය (ray) පටන් ගන්නා ස්ථානයේ සිට එහි කෙළවර තෙක් දිග.
11. ගුද වරලේ දිග (Length of anal fin) (රූපය 6.11) - දිගම කණ්ඨකය (spine) හෝ දිගම කිරණය (ray) පටන් ගන්නා ස්ථානයේ සිට එහි කෙළවර තෙක් දිග.
12. ශ්‍රෝණි වරලේ දිග (Length of pelvic fin) (රූපය 6.12) - දිගම කණ්ඨකය (spine) හෝ දිගම කිරණය (ray) පටන් ගන්නා ස්ථානයේ සිට එහි කෙළවර තෙක් දිග.
13. ලය වරලේ දිග (Length of pectoral fin) (රූපය 6.13) දිගම කණ්ඨකය (spine) හෝ දිගම කිරණය (ray) පටන් ගන්නා ස්ථානයේ සිට එහි කෙළවර තෙක් දිග.

## ගණනයන් (Counts)

කිරණ ගණනයන් ලබා ගැනීමේදී වරල්වල කණ්ඨක (Spines) සංඛ්‍යාව, නොබෙදුණ කිරණ සංඛ්‍යාව (Unbranched rays) සහ බෙදුණු කිරණ (Branched rays) සංඛ්‍යාව ද ලබා ගැනේ (රූපය 7-9). කොරළ ගණනයන් ලබා ගැනීමේදී, අංශ රේඛාව ඔස්සේ කොරළ සංඛ්‍යාව, අංශ රේඛාවට ඉහළින් සහ පහළින් ශරීරය දෙපසට විහිදෙන පෘෂ්ඨීය වරලේ ආරම්භයේ සිට අංශ රේඛාව තෙක්ද, ශ්‍රෝණි වරල ආරම්භයේ සිට අංශ රේඛාව තෙක්ද, සහ ගුද වරලේ ආරම්භයේ සිට අංශ රේඛාව තෙක්ද, ඇති කොරළ සංඛ්‍යාව ද ගණනය කරනු ලැබේ (රූපය 10).

රූපය 7. වරල්වල දැකිය හැකි කිරණ වර්ග. a. කණ්ඨකය (Spine); b. නොබෙදුණ කිරණය (unbranched ray); c. බෙදුණු කිරණය (branched ray). සාමාන්‍යයෙන් කණ්ඨකය දැති සහිත ඝන ස්වභාවයෙන් යුක්ත අතර කිරණ මෘදු ආවාර සහිත (Segmented) වේ. කණ්ඨක ලිවීමේදී රෝම ඉලක්කම් ද කිරණ ලිවීමේදී ඉන්දු අරාබි ඉලක්කම් ද භාවිතා කෙරේ.




## කිරණ සටහනක් ලිවීම (Ray counts)

රූපය 8. මෙම පෘෂ්ඨීය වරලේ කණ්ඨක දෙකක් පවතින අතර නොබෙදුණු කිරණ එකක් සහ බෙදුණු කිරණ පහක් ද දැකිය හැක. මෙහි කිරණ සටහන D II 1.5 ලෙස දැක්විය හැක. D අකුරෙන් පෘෂ්ඨීය වරලත්, II යන රෝම ඉලක්කමෙන් කණ්ඨක දෙකත්, 1 යන අරාබි ඉලක්කමෙන් නොබෙදුණ කිරණයත්, 5 යන අරාබි ඉලක්කමෙන් බෙදුණු කිරණයත් දැක්වේ.



රූපය 9. මෙහි පෘෂ්ඨීය වරල් දෙකක් දැකිය හැක. එහි ප්‍රථම වරලේ ($D_1$) කණ්ඨක දහයක් ද දෙවන වරලේ ($D_2$) එක් නොබෙදුණ කිරණයක් සහ බෙදුණ කිරණ 7 ක් දැකිය හැක.




D X-1.7 හෝ $D_1$ X, $D_2$ 1.7 ලෙස ලිවිය හැක.

සම්පූර්ණ කිරණ සටහනක් (D- පෘෂ්ඨීය වරල A- ගුද වරල P- ලය වරල V- ශ්‍රෝණි වරල C- වලිග වරල) - D II 3.5; A III 5; P I.5; V I 8; C19

## කොරළ ගණනයන් කිරීම (Scale counts)




රූපය 10. මත්ස්‍ය ශරීරයේ වැදගත් කොරළ ගණනයන්.

1. පූර්ව පෘෂ්ඨීය කොරළ (pre-dorsal scales) සංඛ්‍යාව :9).
2. අංශරේඛා කොරළ පෙළට ඉහළින් පෘෂ්ඨීය වරල පටන් ගන්නා ස්ථානය තෙක් කොරළ සංඛ්‍යාව :2 1/2).
3. අංශ රේඛාවට පහළින් ශ්‍රෝණි වරල පටන් ගන්නා ස්ථානයට ඇති කොරළ සංඛ්‍යාව :2 1/2).
4. අංශ රේඛාවට පහළින් ගුද වරල පටන් ගන්නා ස්ථානයට ඇති කොරළ සංඛ්‍යාව :2 1/2).
5. අංශ රේඛාව ඔස්සේ ඇති කොරළ සංඛ්‍යාව :20).
6. වලිග නටුව වටා ඇති කොරළ සංඛ්‍යාව :8).

## මත්ස්‍ය පරිසර විද්‍යාව (Fish Ecology)

ලොවෙහි වෙසෙන මත්ස්‍යයෝ විවිධ පරිසර පද්ධතීන්වල වාසය කරති. එක් එක් රටාසමයන් ඔවුනටම ආවේණික වූ පරිසර තත්ත්වයන් අත්කර ගෙන සිටින අතර එම පරිසර තත්වයනට ඔවුනටම ආවේණිකවූ හැසිරීම්, ආහාර, බෝවීමේ ක්‍රියාවලි පෙන්වයි. මෙම පරිසර තත්ත්ව මත්ස්‍යයන් වසන ජලපහරේ රසායනික, භෞතික සහ අනෙකුත් ජෛවීය ලක්ෂණ මත වෙනස් වේ. මෙසේ වාර්තා වන මත්ස්‍යයන්, අභ්‍යන්තර ජලජ පරිසර පද්ධති (Inland waters) සහ කරදිය පරිසර පද්ධති (Oceanic Waters) යන ප්‍රධාන පරිසර පද්ධතිවල ව්‍යාප්තියක් දක්වයි. එසේම රටාසමයන්ගේ විවිධත්වය අනුව ඔවුනටම ආවේණික වූ වාසස්ථාන හිමි වේ. ඉහතින් දැක් වූ රසායනික සහ භෞතික පරිසර පද්ධති අනුව ව්‍යාප්තියට අමතරව ජෛවීය සාධක මත ද මත්ස්‍යයන් ගේ ව්‍යාප්තිය දැකිය හැක. එනම් විලෝපීය-ගොදුරු සම්බන්ධතාව (Predator-prey relationships), තරගකාරීත්වය (Competition) සහ සහජීවනය (Symbiosis) අනුව ද වාසස්ථාන තෝරාගැනේ.

අප මෙහිදී සාකච්ඡා කෙරෙන අභ්‍යන්තර ජලජ පද්ධතිවල වෙසෙන මත්ස්‍ය රටාසමයන්ගේ පරිසර පද්ධති පිළිබඳව හැදෑරීමේ දී ප්‍රධාන කාණ්ඩ හතරකට බෙදා දැක්විය හැක. එනම් :1) ජලාශ සහ වැව් (Lakes & Tankes) :2) ගංගා සහ ඇල දොල (Rivers & Streams) :3) විශේෂ වාසස්ථාන (Special habitats) සහ :4) කලපු සහ මෝය (Lagoons & Estuaries) යන ඒවාය. කෙසේ වෙතත් අප රටේ භූමි සැකැස්ම අනුව අප සතුව විශේෂිතවූ වාසස්ථාන (Special habitats) දැකිය නොහැකි තරම්ය. එනම් කාන්තාර ජලාශ (Desert waters), ගුහා ආශ්‍රිත (Cave pools) සහ අභ්‍යන්තර මුහුදු (Inland seas) අප රටේ දැකිය නොහැක.

## ජලාශ සහ වැව් (Lakes & Tanks)

අප රට සතුව නිවර්තන ස්වාභාවික (natural) ජලාශ නොමැති වුවද අනාදිමත් කාලයක සිට මිනිසා විසින් ගොඩනැගූ වියලි කලාපීය මහා ජලාශ :වැව්) මෙන්ම මෑත කාලයේ තෙත් කලාපීය කඳුකරය ආශ්‍රිතව ඉදිකළ බහුකාර්ය ජලාශද දැකිය හැක. මෙම පද්ධති වාසස්ථාන කරගත් ස්වදේශීය (Indigenous) මත්ස්‍ය රටාසමයන් පරිණාමය වී නොමැති වුවද මෙවැනි ජලාශවලට අනුවර්තනය වූ

මත්ස්‍යයන් :උදා : *Channa* spp., *Puntius* spp. හා *Etroplus* spp.) දැකිය හැක. මොවුන්ට අමතරව විදේශයන්ගෙන් හඳුන්වා දුන් මත්ස්‍ය රටාසමයන් බොහෝ ගණනක් මෙම ජලජ පද්ධති තම වාසස්ථාන ලෙස තෝරාගෙන ඇත.

## ගංගා සහ ඇළ දොල (Rivers & Streams)

මෙම පරිසර පද්ධති ශ්‍රී ලංකාව පුරා ජාලයක් මෙන් දැකිය හැක. එනම් ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරය ඇසුරු කරගෙන පෝෂණය ලබන ගංගා නිම්න 103ක් පමණ වාර්තාවන අතර ඒවා දිවයින පුරාම විහිදී ගොස් මුහුද හා සම්බන්ධ වේ. මෙම පරිසර පද්ධතිය තුළ ක්ෂුද්‍ර වාසස්ථාන (Micro-habitat) බොහෝ සංඛ්‍යාවක් දැකිය හැකි අතර මෙවැනි ක්ෂුද්‍ර වාසස්ථාන විශාල මත්ස්‍ය විවිධත්වයකට ආහාර, අභිජනන ස්ථාන සහ වාසස්ථාන සපයයි. මෙවැනි පරිසර පද්ධතිවල රසායනික සහ භෞතික ගුණ ඉහළ කඳුකරයේ සිට පහතරට තැනිතලා දක්වා ගලා ඒමේදී වෙනස් වේ. විශාල ගල්පර සහිත වේගවත් පිරිසිදු ජල පහරවල්වල වෙසෙන රටාසමයන් විශේෂ අනුවර්තනයන් පෙන්වයි. ඊට හොඳම උදාහරණය ලෙස ගල්පාඩින් *(Garra ceylonensis)* දැක්විය හැක. මොවුන්ට වේගවත් ජල පහරට එරෙහිව උපස්ථරයට ඇලී සිටීමට යටිතොල් පැතලි වී චූෂකරයක් බවට පත්වීමත් ලයවරල සහ ශ්‍රෝණිවරල් උදරීයව පිහිටා තිබීමත් දැක්විය හැක. එසේම මොවුන්ගේ ආහාර ලෙස ගල් මතුපිට වැවෙන ඇල්ගේ වර්ග භාවිතා වේ. එසේම පැහැදිලි සෙමෙන් ගලා බසින වැලි හෝ රොඩු සහිත දිය පහරවල්වලට අනුවර්තනය වූත්, සෙවණට ප්‍රිය කරන්නාවූත් බොහෝ රටාසමයන් දැකිය හැක. මෙවැනි ඇල දොලවල්වල ඉතා සෙමින් පිහිනීම සිදු කරන රොඩු අතර හෝ ඉවුරේ පවතින මුල් අතර පවතින ආහාර ලබා ගන්නා රටාසමයන් (උදා : *Puntius spp.*) මෙන්ම රොඩු අතර හෝ මුල්, ගුල් තුළ සැඟවී සිට අන් ජලජ ජීවීන්, මත්ස්‍යයන් ආහාරයට ගන්නා විලෝපීය මත්ස්‍යයන්ද දැකිය හැක. එසේම සෙමෙන් ගලන ජල පෘෂ්ඨයට ආසන්නව පිහිනමින් ඉහළින් වැටෙන කෘමීන් හෝ වෙනත් ආහාර මත යැපෙමින් වෙසෙන උඩහඳයන් (*Aplochelus spp.*) වැනි මත්ස්‍ය රටාසමයන් ද දැකිය හැක. ගංගාවල පහළ නිම්නයේ පිටාර තැනි විල්ලු ආදී ජලජ පරිසර පද්ධතිවල බහුලව ජලජ ශාක දැකිය හැකි අතර එවැනි පරිසර පද්ධති වාසස්ථාන කරගන්නා බොහෝ මත්ස්‍ය රටාසමයන් සර්වභක්ෂකයන් වන අතර මොවුන් අතර ජලජ පැලෑටි අතර සැඟවෙමින් මත්ස්‍යයන් ආහාරයට ගන්නා විලෝපික මත්ස්‍යයන්ද දැකිය හැක.

## කලපු සහ මෝය (Lagoons & Estuaries)

ශ්‍රී ලංකාව අවට මුහුදුබඩ පරිසර පද්ධති ඇසුරු කරගෙන කලපු 46 ක් වාර්තාවන අතර මේවායේ විශේෂත්වය වනුයේ කරදිය සහ මිරිදිය මිශ්‍ර කිවුල්දිය (Brackish water) පැවතීමය. වඩදිය සහ බාදිය සංසිද්ධීන් නිසා ඇතිවන ලවන වෙනස්වීමට ඔරොත්තු දිය හැකි මත්ස්‍ය රටාසමයන් බොහොමයක් දැකිය හැක. එසේම මිරිදිය මත්ස්‍ය රටාසමයන් (Freshwater fish) ලෙස සැලකෙන සමහර මත්ස්‍ය රටාසමයන් මෙන්ම කරදිය මත්ස්‍ය (Marine fish) රටාසමයන් ද මෙම පරිසර පද්ධතිහිදී දැකිය හැක. එසේම ජීවිත කාලයෙන් වැඩි කොටසක් ඉතා පිරිසිදු මිරිදිය ඇල දොලවල වාසය කරන වැලිගොව්වන් (Gobies) බොහොමයකගේ පැටවු තම මුල් කාලය කලපු ආශ්‍රිතවත්, ක්‍රමයෙන් වර්ධනය වත්ම තම දෙමාපියන් වෙසෙන ඉස්මත්තේ දොල පහරවල් වෙතත් ගමන් ගනිති.

මීට අමතරව විශේෂතම සංසිද්ධියක් ලෙස සැලකිය හැක්කේ තම පැටවුන් බිහිකිරීමට මිරිදිය පරිසර පද්ධතිවල සිට ඉතා ඈත කරදිය සමුද්‍ර වෙත ඇදී යන ආඳන්ය (*Anguila* spp.). මෙලෙස සමුද්‍රයේ බිහිවන ආඳ පැටවුන් නැවත තම දෙමාපියන් විසූ රටෙහි ගංගා ද්‍රෝණි වෙතම පැමිණීම තවම විසඳී නැති ගැටළුවකි. කලාතුරකින් කරදිය වාසී සමහර රටාසමයන් රට අභ්‍යන්තරයේ ගංගා ආශ්‍රිතව වාර්තා වී ඇත. එනම් සම්පූර්ණ කරදිය පරිසර පද්ධතියෙන් මිදී මිරිදිය පිරිසිදු ජල පහරවල් වෙත උඩුගං බලා පිහිනීම් කර ඇති අවස්ථා වාර්තා වේ. කෙසේ වෙතත් මෙම රටාසමයන් නියමාකාරයෙන්ම කරදිය රටාසමයන් (marine species) වේ. (උදා - *Gymnothorax polyuranodon, Lutijanus argentimaculatus, and Caranx sexfasciatus*). ඉහත දැක්වූ පරිසර පද්ධතිවලට අමතරව තෙත් කලාපීය වගුරු, කලපු සහ ගංගා මෝය ආශ්‍රිතව කඩොලාන පරිසර පද්ධති ඇසුරු කරගෙන මත්ස්‍ය ගහනයක් ජීවත් වේ. දිය පහරක මත්ස්‍යයෙකුගේ ක්‍ෂුද්‍ර වාසස්ථානය පිළිබඳව අවබෝධයක් ඇතිනම් එම මත්ස්‍ය රටාසමයන් හඳුනා ගැනීමට ඉතාමත් පහසු වනු ඇත. දිය පහරක ක්‍ෂුද්‍ර වාසස්ථානයන්හි ව්‍යාප්තිය අනුව ප්‍රධාන ක්‍ෂුද්‍ර වාසස්ථාන හයක් හඳුනාගත හැකිය.




රූපය 11. ද්විශිය දිය පහරක හරස්කඩක මත්ස්‍ය ක්‍ෂුද්‍ර වාසස්ථාන.

a) ඉහළ ජල පෘෂ්ඨයට සමාන්තරව (ආසන්නව) ආහාර සොයමින් ගමන් ගන්නා මත්ස්‍ය රටාසමයන් ලෙස උඩ හඳයන් (*Aplochelius* spp.) සහ දණ්ඩි (*Rasbora* spp.) දැක්විය හැක.
b) ජල පෘෂ්ඨයේ මධ්‍යයේ වාසය කරන මත්ස්‍යයන් ලෙස පෙතියන් වර්ග දැක්විය හැක. (*Puntius* spp.)
c) ජල පහරේ ගල්මත ඇලී වාසය කරන රටාසමයන් ලෙස ගල්පාඩින් (*Garra* spp.) සහ වැලිගොව්වන් (Gobies) හඳුනාගත හැක.
d) පත්ලට ආසන්නයේ වෙසෙන මත්ස්‍ය රටාසමයන් ලෙස අහිරාවන් මෙන්ම සමහර වැලිගොව් රටාසමයන් දැක්විය හැක. උදා :- Lochers & Gobies spp.
e) විලෝපික සහ නිශාචර මත්ස්‍ය රටාසමයන් බොහොමයක් මෙවැනි ගල් ගුහා හෝ බෙන තුළ වාසය කරති. උදා :- *Clarius* spp.
f) කෘමි භක්‍ෂක පුළුට්ටන් (*Belontia signata*) වැනි රටාසමයන් මෙන්ම කණයන් වැනි (*Channa* spp.) විලෝපික රටාසමයන් ද මෙවැනි ගස් මුල් අතර සැඟවී වාසය කරයි.

ඉහත දැක්වූ විවිධ පරිසර පද්ධති සහ විවිධ ක්‍ෂුද්‍ර වාසස්ථානවලට අනුවර්තන වශයෙන් මත්ස්‍යයන්ගේ හැඩයේ විවිධත්වයක් දැකිය හැක. මෙසේ හැඩය අධ්‍යයනය කිරීම මගින් ඔවුන්ගේ ක්‍ෂුද්‍ර වාසස්ථාන පිළිබඳව අවබෝධයක් ලබාගත හැක. මත්ස්‍යයා වෙසෙන ක්‍ෂුද්‍ර වාසස්ථානය අනුව මත්ස්‍යයාගේ හැඩයේ වෙනස්කම්වලට අමතරව මුඛයේ සහ වරල්වල අනුවර්තන ද දැකිය හැක.

**පෘෂ්ඨියව පැතලි සිරුරු දරන රටාසමයන් :** ජල පෘෂ්ඨයට ආසන්නව වාසය කරන රටාසමයන්ය. මුඛය ඉහළට පිහිටීම මගින් ජල පෘෂ්ඨයේ වෙසෙන කෘමීන් ආහාරයට ගනී. උදා :- උඩ හඳයන්, කණයන්.

**ද්විපාර්ශිය පැතලි සිරුරු දරන රටාසමයන් :** ජල පහර මධ්‍යයට වන්නට වාසය කරන රටාසමයන්ය. මුඛය අග්‍රස්ථව පිහිටන අතර, ජල පහර මධ්‍යයේ ජලජ ශාක අතර ඇති ආහාර ලබා ගනී. උදා : පෙතියන්.

**පෘෂ්ඨ උදරීය පැතලි සිරුරු දරන රටාසමයන් :** ජල පහරේ පත්ල ආසන්නයේ වාසය කරන රටාසමයන්ය. මුඛය උදරීයව පිහිටන අතර එමගින් උපස්ථරයේ වැවෙන ඇල්ගා වර්ග ආහාරයට ගනී (උදා : ගල්පාඬින්). වේගයෙන් ගලන ජල පහරට එරෙහිව උපස්ථරයට ඇලීමට මෙම රටාසමයන්ය අනුවර්තනය වී ඇත. උදාහරණ ලෙස ගල්පාඬින්ගේ (*Garra* spp.) යටි තොල විශාල වී චූෂකරයක් බවට පරිවර්තනය වී ඇති අතර ලයවරල හා ශ්‍රෝණිවරල් උදරීයව පිහිටීමෙන් උපස්තරය බදා සිටීමේ හැකියාව ලැබී ඇත. එසේම විලෝපික වැලිගොව්වන් ද උපස්තරයට ඇලී සිටීමට ශ්‍රෝණිවරල් දෙක එකට සම්බන්ධවී චූෂකර බවට පත් වී ඇත.

## ආහාර (Food)

මත්ස්‍යයන්ගේ ආහාර රටාව අනුව කුණුපභක්ෂක (Detritivores), ශාකභක්ෂක (Herbivores), මාංශභක්ෂක (Carnivores), සහ සර්වභක්ෂක (Omnivores) ලෙස බෙදා වෙන්කළ හැක. මෙසේ පෝෂණය ආහාර මාර්ගයෙන් ගන්නා අතර, අයන වර්ග (උදා- $Ca^{++}$) ජලක්ලෝම මගින් එකවිට අවශෝෂණය කිරීමේ හැකියාවක් ඇත. ඉහත දැක්වූ ප්‍රධාන ආහාර භක්ෂක මත්ස්‍ය රටාසමයන් නැවත ප්‍රධාන කොටස් තුනකට බෙදා වෙන්කළ හැක.

:1) බහුභක්ෂක (Euryphagous) - මිශ්‍ර ආහාර ගන්නා

:2) තනුභක්ෂක (Stenophagous) - සීමාසහිත ආහාර ගන්නා

:3) ඒකභක්ෂක (Monophagous) - එක් ආහාර වර්ගයක් මත යැපෙන්නන්

ලොව වෙසෙන බොහෝ මත්ස්‍ය රටාසමයන් බහුභක්ෂක මාංශභක්ෂකයන් වේ. ශාකභක්ෂක මත්ස්‍ය රටාසමයන් ප්‍රධාන කොටස් දෙකක් දැකිය හැකිය. එනම් ප්ලවාංග භක්ෂක (Plankton feeders) සහ මහා-භක්ෂකයන්ය (Macro feeders). ප්ලවාංග භක්ෂකයෝ තම ජලක්ලෝම පෝරු ආධාරකරගෙන ජලයේ වෙසෙන ප්ලවාංග ආහාරයට ගනිත්. එසේම මහා-භක්ෂකයෝ ජලජ පැලෑටි වැනි ශාක ආහාරයට ගනිති.

මාංශභක්ෂකයෝ තමන්ගේ ගොදුරු පසුපස හඹාගොස් ගොදුරු ඩැහැගැනීම හෝ ඒ සඳහා යම් යම් උපක්‍රම යොදාගනිත්. ගොදුරු ඩැහැ ගැනීම

පිණිස තියුණු දත් සහිත හණු පිහිටන අතර එමගින් ගොදුර රඳවා ගැනීමේ පහසුව ද ලැබේ. මෙවැනි දත් විශේෂයෙන් *Channa* ගණයේ සහ වැලිගොව් රටාසමයන්ගේ දැකිය හැක. එසේම ගොදුරු පසුපස හඹායෑමට වේගයෙන් පිහිනීමේ හැකියාව සමහර රටාසමයනට ලැබී ඇති අතර සැඟවී සිට ගොදුරු ඩැහැගැනීමට උපස්ථරයට හොඳින් අනුවර්ථිත වර්ණ රටාවන් ඇතිකර ගැනීමට ද සමහර රටාසමයන් සමත් වී ඇත.

කුණුපභක්ෂක රටාසමයන් බොහෝ විට පතුල ආසන්නයේ පිහිනමින් පතුලේ ආහාර සොයන්නන් වේ. මොවුන්ගේ මුඛය පහළට පිහිටා තිබෙන අතර සමහරවිට ඉහළ සහ පහළ හනුවල කෘන්තක ආකාරයේ දත් පිහිටා ඇත. මත්ස්‍යයන්ගේ ආහාර අතරට ඉතාම කුඩා අන්වීක්ෂීය ශාක ප්ලවාංග (Phyto-plankton), සත්ත්ව ප්ලවාංග (Zoo-plankton), කුස්ටේෂියාවන් (Crustaceans), ජලජ කෘමීන් (Aquatic insects), ජලජ මොලුස්කාවන් (Aquatic molluscans), මත්ස්‍යයන් (Fishes), උභයජීවීන් (Amphibians) මෙන්ම ජලජ පරිසර පද්ධතිවල වෙසෙන අනෙකුත් කුඩා පෘෂ්ඨ සහ අපෘෂ්ඨ වංශීන් ද ඇතුළත් වේ.

## බෝවීම (Reproduction)

මත්ස්‍ය රටාසමයන් ජලජ පරිසර පද්ධතියට හොඳින් අනුවර්තනය දැක්වීමට එක් හේතුවක් ලෙස මොවුන්ගේ බෝවීමේ ක්‍රමවල පෙන්වන සාර්ථකභාවය පෙන්විය හැක. එක් එක් මත්ස්‍ය රටාසමයන් ඔවුනටම ආවේණික වූ විශේෂිත වූ භෞතික සහ රසායනික ක්ෂුද්‍ර පරිසර පද්ධතිවල වෙසෙන අතර එවැනි විශේෂිත වූ පරිසර පද්ධතියට සරිලන පරිදි ඔවුන්ගේ බෝවීමේ ක්‍රම විධිවලද ආවේණික ලක්ෂණ පෙන්වයි. ඒ සඳහා විශේෂිතවූ ව්‍යුහාත්මක (Anatomical), හැසිරීම් රටා (Behavioral), කායවිද්‍යාත්මක (Physiological), සහ ශක්තිමය අනුවර්තනද පෙන්වයි.

මත්ස්‍යයන් අතර තුන් ආකාරයකින් යුක්ත බෝවීමේ ක්‍රම දැකිය හැක.

:1) ද්විලිංගික අභිජනනය (Bisexual reproduction)

:2) උභයලිංගික අභිජනනය (Hermaphroditic reproduction)

:3) කෞමාරෝද්භවය (Parthenogenesis)

ද්විලිංගික අභිජනනය: මෙම ක්‍රමවේදයට අනුව ශුක්‍රාණු පිරිමි සත්වයා තුළත්, ඩිම්බ ගැහැණු සත්ත්වයා තුළත්, නිපදෙන අතර විරුද්ධ ලිංගිකයන් එක්වීම මගින් නව ජනිතයන් බිහිවේ. බොහෝ විට බිත්තර ජලපහරේ පත්ලේ තැන්පත්කරන අතර සමහර රටාසමයන් විසින් විශේෂිතවූ කැදළි පත්ලේ හෝ ජලජ ශාක අතර තනාගනු ලැබේ.

උභය ලිංගික අභිජනනය: මෙවැනි අභිජනන ක්‍රමයක් බොහෝ විට කරදිය වාසී රටාසමයන්ගේ (උදා :- Perches, Walleyes) දැකිය හැක. මොවුන්ගේ ඩිම්බ සහ ශුක්‍රාණු එකම සත්ත්වයෙක් තුළ හට ගැනේ. එවිට ස්වසංසේචන (Self fertilization) මගින් පැටවුන් බිහි කෙරේ.

කෞමාරෝද්භවය: බොහෝ ගප්පි සහ මෝලි (Guppy & Molly) රටාසමයන් තුළ සංසේචනයකින් තොරව මෙලෙස පැටවුන් වර්ධනය වේ. ගැහැනු මසුන් සහ පිරිමි මසුන් හඳුනාගැනීම සඳහා සමහර අවස්ථාවලදී අපහසුවේ. නමුත් සමහර අවස්ථාවලදී නිතැතින්ම ගැහැනු මසුන් සහ පිරිමි මසුන් බාහිර රූපාකාරයෙන් (External morphology) වෙනස් වේ.

එසේම ලිංගිකත්වය පැහැදිලිව වෙන්කරගත නොහැකි සමහර රටාසමයන්ගේ අභිජනන සමයේදී විශේෂිත වර්ණ රටා හෝ ව්‍යුහයන් වර්ධනයවේ. මෙයද බොහෝ විට පිරිමි මසුන්ට පමණක් සීමාවන්නාවූ ලක්ෂණයක් වේ. Cyprinidae කුලයේ පෙතියන්ගේ පිරිමි මසුන් වඩාත් වර්ණවත් වන්නේ අභිජනන සමයේදීය (උදා:- බුලත් හපයා *Puntius nigrofasciatus*). එසේම සමහර පිරිමි මසුන්ගේ මුහුණ අවට කුඩා බිබිලි (Nuptial tubercles) රැසක් මෙම අවධියේදී ඉස්මතුවේ. එසේම සමහර මත්ස්‍ය රටාසමයන්ගේ පිරිමි මසුන් සතුව ගුදවරල ආශ්‍රිතව විශේෂ ව්‍යුහයක් ගැහැණු මසුන් තුළට ශුක්‍රාණු ඇතුල් කිරීම සඳහා සැකසී ඇත. (උදා:- ගප්පි).

බිත්තර දැමීමෙන් පසුව හෝ පැටවුන් බිහිවීමෙන් අනතුරුව පැටවුන් ආරක්ෂා කිරීමද දැකිය හැක (උදා:- *Channa* spp). එසේම සමහර මත්ස්‍ය රටාසමයන්ගේ :උදා :- *Tilapia* spp. හා බිළාල මසුන්) යම් අනතුරු අවස්ථාවකදී බිත්තර හෝ පැටවුන් තම මුඛය තුළට ගෙන ආරක්ෂාව සලසනු ලැබේ. මෙම සංසිද්ධිය Mouth brooding ලෙස හඳුන්වනු ලැබේ. එසේම මේ අතර තම පැටවුන් උදරීය පෙදෙසේ අලවාගෙන ගමන් ගන්නා බිළාල මසුන් ද :උදා :- Obsetrical Catfish), තම හිසේ

පෘෂ්ඨීය පෙදෙසේ තිබෙන විශේෂිතවූ නෙරුමක පැටවුන් ආරක්ෂාකරන්නාවූ (Forehead brooder) මත්ස්‍යයන් ද, මව විසින් බිහිකරන ලද ජනිතයන් පියාගේ උදරයේ පිහිටි විශේෂිත වූ මඩියක තබාගෙන පැටවුන් ඇතිදැඩි කරන්නාවූ මුහුදු අශ්වයෝද සිටිති.

## ශ්‍රී ලංකාවේ මත්ස්‍ය විද්‍යාත්මක කලාප (Ichthyological Provinces of Sri Lanka)

ශ්‍රී ලංකාව වර්ග කිලෝමීටර් 65610 තරම් වූ ඉන්දියානු සාගරයේ උතුරු අක්ෂාංශ $6^0$-$10^0$ අතර පිහිටියාවූ ඉතා කුඩා දිවයිනකි. එසේම ඉන්දියානු උපමහාද්වීපයට කිලෝමීටර් 25 ක් තරම් වූ ළඟකින් පිහිටීම නිසාත් ඈත අයිස් යුගවලදී (Pleistocene period) ඉන්දියානු මහද්වීපය සමඟ භෞතිකව සම්බන්ධතාවක් පැවැත්වීම නිසාත් අප රටේ ශාක සහ සත්ත්ව සංහතිය කෙරේ ඉන්දීය බලපෑම විශාලය. එසේම මෙම ජීවී රටාසමයන් බොහොමයක් ශ්‍රී ලංකාවට සංක්‍රමණය වන්නට ඇත්තේ ඉන්දියාව දෙසින් බවත් ඉන් පසුව වසර දසදහස් ගණනක් හුදකලාව දිවයින තුළ සිදුවූ පරිණාමීය වෙනස්කම් නිසා බොහෝ රටාසමයන් අප දිවයිනට ආවේණික වී ඇත.

මෙසේ පරිණාමීය වෙනස්කම් පැවතීමට විශේෂ හේතු කීපයක් බලපෑ බව විද්‍යාඥයන්ගේ මතයයි. එනම් අප රටේ පිහිටීම නිවර්තන කලාපයට ඇතුළත් වීමත්, දිවයින තුළ පවතින භෞතික වෙනස්වීම් නිසාත් දේශගුණික සහ ඊට අනුරූප වෘක්ෂලතා පද්ධතීන් (Vegetation types) ඇතිවීම මගින් දිවයිනේ හඳුනාගත හැකි විශේෂ වූ ව්‍යාප්ති කලාප (Distributional Zones) දැකිය හැක. මේවා දේශගුණික කලාප (Climatic Zones), වෘක්ෂලතා කලාප (Vegetation Zones), ජීව-දේශගුණික කලාප (Bio-climatic Zones) ආදී ලෙස නොයෙකුත් වර්ගීකරණයන්ට ලක් කර ඇත.

ශ්‍රී ලංකාව මධ්‍යයේ පිහිටි ප්‍රධාන කඳුකර පද්ධති තුන (නකල්ස් කදුකරය, මධ්‍යම කදුකරය සහ රක්වාන කදුකරය) මෙන්ම ප්‍රධාන අඩතැනි තුන අභ්‍යන්තර ජලධාරා පද්ධතිවල විවිධත්වය කෙරේ විශාල බලපෑමක් ඇතිකර ඇත. එසේම දිවයිනට නිතැතින් ලැබෙන සංවහන වැසිවලට අමතර ප්‍රධාන මෝසම් වැසි දෙක වන ඊසාන දිග වැසි හා නිවර්තන වැසි රට තුළ රඳවා ගැනීමටද මෙම කදුවැටි

මහෝපකාරී වේ. එනිසාම මධ්‍යම කඳුකරය සහ රක්වාන කඳුකරයෙන් මුවා කරන ශ්‍රී ලංකාවේ නිරිතදිග කලාපය නිතැතින්ම වර්ෂාව ලැබෙන තෙත් කලාපය (Wet zone) ලෙසත්, ඊසාන දිග උතුරු දිග කලාප වියලි කලාපය (Dry zone) ලෙසත්, බෙදා දැක්විය හැක. එනම්, තෙත් කලාපයට වසරට ලැබෙන මධ්‍ය වර්ෂාපතනය 2000 සිට 6000mm දක්වාත් වියලි කලාපයට ලැබෙන වර්ෂා වර්ෂාපතනය 750 සිට 2000mm අතර වේ. මෙසේ ලැබෙන වර්ෂාව නැවත සමුදුර කරා ගමන් ගන්නා ස්වාභාවික ගංගා 103 ක් නකල්ස් කඳුකරය, මධ්‍යම කඳුකරය සහ රක්වාන කඳුකරයේ සිට දිවයින පුරා ව්‍යාප්තව ඇත.

ශ්‍රී ලංකාව තුළින් මෙතෙක් වාර්තාවී ඇති මත්ස්‍ය රටාසමයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ පරිණාමීය බන්ධුතාව අධ්‍යයනය කළ ආචාර්ය රනිල් සේනානායක සහ මහාචාර්ය පීටර් බී. මොයිල් යන වියතුන් විසින් 1982 දී ශ්‍රී ලංකාවේ මත්ස්‍ය රටාසමයන්ගේ ව්‍යාප්ති කලාප පිළිබඳව අදහස් ප්‍රකාශ කරන ලදී. ඔවුන් විසින් ශ්‍රී ලංකාව ප්‍රධාන මත්ස්‍ය විද්‍යාත්මක කලාප (Ichthiyological province) හතරකට බෙදා වෙන්කරන ලදී.

## නිරිතදිග කලාපය (South western Province)

මෙම කලාපයේ මායිම් ලෙස පොදුවේ තෙත් කලාපීය පහත රට ප්‍රදේශ දැක්විය හැක. මෙහි භෞතික මායිම් ලෙස උතුරින් අත්තනගලු නිම්නය ඇතුළුව පිළිවළින් දකුණු දිගට කැළණි, කළු, ගිං, සහ නිල්වලා යන ප්‍රධාන ගංගා ඇතුළු කුඩා ගංගා නිම්න සියල්ලෙන් සමන්විත ප්‍රදේශය වේ. 1991 දත්තයනට අනුව මෙම කලාපය තුළින් මත්ස්‍ය රටාසමයන් 59 ක් වාර්තාවන අතර ඉන් මත්ස්‍ය රටාසමයන් 27 ක් ශ්‍රී ලංකාවට ආවේණික වේ. එසේම මත්ස්‍ය රටාසමයන් 59 න් රටාසමයන් 22ක්ම මෙම කලාපයට ආවේණික වේ. මෙම රටාසමයන් 22න් රටාසමයන් 20 ක්ම ශ්‍රී ලංකාවට ආවේණික වේ.

## මහවැලි කලාපය (Mahaweli Province)

මෙම මහවැලි කලාපයේ මායිම් ලෙස මහවැලි නදී නිම්නයට අයත් මධ්‍යම සහ දුම්බර කඳුකර ප්‍රදේශයේ සිට ත්‍රිකුණාමලය දක්වා වූ ප්‍රදේශය වේ. නිරිතදිග කලාපයට පසු වැදගත් මත්ස්‍ය විද්‍යාත්මක කලාපය මහවැලි කලාපය ලෙස දැක්විය

හැක. 1991 දත්තයනට අනුව මහවැලි කලාපය තුලින් මත්ස්‍ය රටාසමයන් 44 ක් වාර්තාවන අතර ඉන් මත්ස්‍ය රටාසමයන් 11 ක් ශ්‍රී ලංකාවට ආවේණික වේ. එසේම මෙම ආවේණික මත්ස්‍ය රටාසමයන් 11 න් රටාසමයන් 5 ක් හමුවන්නේ මහවැලි කලාපයෙන් පමණි.

## වියලි කලාපය (Dry Zone Province)

නිරිතදිග සහ මහවැලි කලාපයනට අයත් ගංගා ද්‍රෝණි හැරුණු කොට වියලි කලාපය තුළින් ගලනා සියලු ගංගා ද්‍රෝණි මෙම කලාපයට ඇතුළත් වේ. එසේම වියලි කලාපය මහවැලි කලාපය මගින් ප්‍රධාන කොටස් දෙකකට බෙදී වෙන්වී ඇත. එනම් ගිනිකොණ දිග වියලි කලාපයත් උතුරු සහ වයඹ ඇතුළත් වියලි කලාපයන්ය. මෙම ප්‍රදේශය තුළින් මත්ස්‍ය රටාසමයන් 37 ක් වාර්තා වී ඇති අතර ඉන් රටාසමයන් 5 ක් ශ්‍රී ලංකාවට ආවේණික වේ. නමුත් මෙම කලාපයටම පමණක් සීමාවූ රටාසමයන් කිසිවක් වාර්තා නොවේ. මෙම කලාපයේ වෙසෙන මත්ස්‍ය රටාසමයන් බොහොමයක් ඉන්දියානු අර්ධද්වීපයෙන් ද වාර්තා වන අතර පරිණාමීයව ඉතා සමීප ඉන්දීය බන්ධුතාවක් පෙන්වයි.

## අතරමැදි කලාපය (Transition Province)

මෙම කලාපයට, තද බෑවුම් සහිත දෙවන අඩතැන්නට අයත් මධ්‍යම කඳුකරයේ බෑවුම් ප්‍රදේශ ඇතුළත් වේ. මෙහි පවතින දොල පහරවල ස්වභාවය අතින් ඉතා වේගවත් ජල ප්‍රවාහයන් සහිත පරිසර පද්ධති නිසාම මත්ස්‍ය රටාසමයන් හට රඳා පැවතීමේ හැකියාව අඩු වී ඇත. නමුත් මේ ප්‍රදේශයේ පවතින සමහර දිය පහරවලට පර්යේෂණ මට්ටමේ හඳුන්වාදීම් කීපයක් සිදු වී ඇති අතර මේ සඳහා ආවේණික රටාසමයන් 3 ක් උපයෝගි කරගෙන තිබිණ. කෙසේ වෙතත් මොවුන්ගේ වර්තමාන තත්ත්වය පිළිබඳව කිසිදු පර්යේෂණයක් නැවත සිදු වී නොමැත.



ශ්‍රී ලංකාවේ මත්ස්‍ය විද්‍යාත්මක කලාප
N
W
E
S
මහවැලි නදිය
අත්තනගලු නදිය
නිල්වලා නදිය
අනෙකුත් නදී
වියළි කලාපය
මහවැලි කලාපය
නිරිතදිග කලාපය
අතරමැදි කලාපය
60 30 0 60
Km
උපුටා ගැනුම - සේනානායක සහ මොයිල, 1982
100000
160000
220000
280000
340000
400000
500000
410000
320000
230000
140000

## මිරිදිය මත්ස්‍යයනට ඇති තර්ජන (Threats)

ශ්‍රී ලංකාවේ වැඩිම මිරිදිය මත්ස්‍ය විවිධත්වයක් දැකිය හැක්කේ නිරිතදිග තෙත් කලාපීය වර්ෂා වනාන්තර ආශ්‍රිත ඇළ, දොල, ගංගා සහ වගුරු ආශ්‍රිත ප්‍රදේශයන්හිදීය. ඊට අමතරව වඩාත් වැදගත්ම ප්‍රදේශය ලෙස මහවැලි කලාපයේ නකල්ස් කඳුකරය ආශ්‍රිත ප්‍රදේශවල පිහිටි ඇල දොල දැක්විය හැක. එසේම මත්ස්‍යයනට පවතින තර්ජන අතින් වැඩිම බලපෑමක් ද ඇත්තේ මෙම ප්‍රදේශවලටය. 2006 වසරේ ජාතික රතු දත්ත ලයිස්තුවට (IUCN Sri Lanka & MENR 2006) අනුව, ශ්‍රී ලංකාවේ මිරිදිය මත්ස්‍ය රටාසමයන් අතරින් වඳවීමේ තර්ජනයට මුහුණ පා ඇති රටාසමයන් ගණන 28 කි. ඉන් රටාසමයන් 22 ක් ශ්‍රී ලංකාවට ආවේණිකය. ඉහත රටාසමයන්ගෙන් රටාසමයන් 10 ක් දැඩි අන්තරායක (CR) ලෙසත්, රටාසමයන් 07 ක් අන්තරායක (EN) ලෙසත්, රටාසමයන් 11 ක් අවදානම් (VU) ලෙසත් ගැනේ. මීට අමතරව රටාසමයන් 07 ක් ආසන්න තර්ජිත :භඹ) ලෙසත්, රටාසමයන් 10 ක් දත්ත හීන (DD) ලෙසත් ලයිස්තු ගතකර ඇත.

මිරිදිය මත්ස්‍ය රටාසමයන්ට ඇති තර්ජන පිළිබඳව 1982 දී සේනානායක සහ මොයිල් යන විද්වතුන් විසින් ද, 1994 දී පෙතියාගොඩ මහතා විසින් ද සාකච්ඡා කර ඇත. ඔවුනට අනුව ප්‍රධාන තර්ජන 7 ක් හඳුනාගෙන ඇත.

1. වනාන්තර විනාශය (Deforestation)
2. නාගරීකරණය (Urbanization)
3. මහා පරිමාණ ජලාශ යෝජනාක්‍රම (Hydrological projects)
4. මැණික් ගැරීම (Gem mining)
5. පළිබෝධ භාවිතය (Pesticide uses)
6. ස්වාභාවික පරිසරයෙන් ඉවත් කිරීම (Exploitation)
7. විදේශ මත්ස්‍යයන් හඳුන්වා දීම (Introduction of exotic species)

## වනාන්තර විනාශය (Deforestation)

කඳුකර වෘක්ෂලතා පද්ධති සහ නිරිතදිග තෙත් කලාපීය වැසි වනාන්තර විනාශය හේතු කොට ගෙන අතුරු ගැටළු ගණනාවක් ඇතිවේ. වැසි වනාන්තර වර්ෂාව ලබා ගැනීම පිණිසත් ලබාගත් ජලය කෙමෙන් ජල මාර්ග වෙත මුදා හැරීමටත් මහඟු සේවයක් කරයි. නමුත් වනාන්තර කැපීමත් සමඟ වර්ෂාව අඩුවීම, බිම් ස්තරය විවෘත වීම නිසා සෝදා පාළුව ඇතිවීමත් ගංගා දොල පහරවල් වියලි කාලවලදී

වියලි යාමේ ප්‍රවණතාවට ලක්වීමත් සිදුවන අතර, සෝදා පාළුව නිසා ජලපහරේ ස්වභාවයේ වෙනස්වීමත් ගංගා පත්ලේ රොන්මඩ තැන්පත් වීමත් නිසා පිරිසිදු ජලය ප්‍රියකරන මත්ස්‍ය රටාසමයන්ගේ පැවැත්මට විශාල බලපෑමක් සිදුවී ඇත. සැබවින්ම මෙනිසා පරිසර තත්වයන්ගේ ගුණාත්මක භාවයේ අඩුවීමටත්, එමගින් වාසස්ථාන අඩුවීමටත් හේතු පෑදේ.

## නාගරීකරණය (Urbanization)

නාගරීකරණය හේතුවෙන් ස්වභාවික වනාන්තර පද්ධති එළිපෙහෙලි වීම සිදුවී, පරිසර පද්ධතියේ ගුණාත්මක බව අහිමිවීමට අමතරව, නගර ආශ්‍රිතව පිටකරන අපද්‍රව්‍ය ජලමාර්ග වෙත එකතුවීම මගින් සිදුවන ජල දූෂණය ආදි හේතු නිසා මිරිදිය මත්ස්‍ය වාසස්ථාන අහිමිවේ. මෙයට හොඳම උදාහරණය ලෙස බෙල්ලන්විල අත්තිඩිය වගුර දැක්විය හැක. කර්මාන්තශාලා මගින් අපද්‍රව්‍ය ඇල මාර්ගවලට පිට කිරීමත් වගුර ගොඩ කර නිවාස සහ වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම්, අපද්‍රව්‍ය බැහැර කිරීම් ආදී ක්‍රියා කාරකම් මගින් වාසස්ථානවලට බලපෑම් සිදුවී ඇත.

## මහා පරිමාණ ජලාශ යෝජනාක්‍රම (Hydrological projects)

මහා පරිමාණ ජලාශ යෝජනාක්‍රම නිසා ජල පහරේ ස්වභාවයේ වෙනස්වීම් සිදුවේ. වේගවත් ජලපහරවල් හරස්කර ජලාශ තැනීමේදී නිශ්චල ජලාශ ප්‍රියකරන මත්ස්‍ය රටාසමයන්ට හොඳ පරිසර පද්ධතියක් ඇති වන නමුත්, වේගවත් දිය පහරවල් ප්‍රියකරන්නවුන්ගේ වාසස්ථාන අහිමිවීමත් එමගින් එම ගහණයේ අඩුවීමත් සිදුවේ. එසේම අභිජනය සඳහා උඩුගං බලා පිහිනන හෝ පහළ කලපු කරා හෝ සමුද්‍රය වෙත යන මත්ස්‍ය රටාසමයන් හට ගංගා හරස්කර බැඳ ඇති මහා පරිමාණ වේලි බාධකවී ඇත.

## මැණික් ගැරීම (Gem mining)

මැණික් ගැරීම මිරිදිය පිරිසිදු ජල මාර්ග වාසස්ථාන කරගත් රටාසමයන්හට බෙහෙවින් බලපානු ඇත. විශේෂයෙන්ම මැණික් ගැරීමේදී මෙම පිරිසිදු ජල මාර්ග බොරවීම නිසා ඒවායේ වසන බොහෝ ආවේණික මත්ස්‍ය රටාසමයන්ගේ ගහන

සනත්වය සීග්‍රයෙන් අඩුවී ගොස් ඇති බවට මෑතදී කරන ලද පර්යේෂණ සාක්ෂි දරයි. මෙවැනි හානිදායක කටයුතු විශේෂයෙන් රත්නපුරය අවට සබරගමු පලාත ආශ්‍රිතව දැකිය හැකි අතර, මෙම ප්‍රදේශ ඇසුරු කරගෙන වෙසෙන ආවේණික මත්ස්‍ය රටාසමයන් ගණනද බොහෝය.

## පළිබෝධ භාවිතය (Pesticides uses)

කෘමිනාශක භාවිතය විශේෂයෙන් වී ගොවිතැන මූල්‍ය උපාය කරගත් ප්‍රදේශවල අධිකව සිදුවන අතර, වී ගොවිතැන සඳහා යොදා ගන්නා කෘමිනාශක පමණක් නොව වල්නාශක ජල මාර්ගවලට එක්වීම නිසා එම ජල පහරවල් වාසස්ථාන කරගෙන වෙසෙන සියලු ජීවීන් කලකදී තුරන්කිරීමට සමත් වේ.

## ස්වාභාවික පරිසරයෙන් ඉවත් කිරීම (Exploitation)

ආහාර පිණිස මසුන් ඇල්ලීම සහ සුරතල් මත්ස්‍ය කර්මාන්තය උදෙසා මසුන් ඇල්ලීම මිරිදිය මත්ස්‍ය විවිධත්වය කෙරෙහි බලපා ඇත. ආහාර පිණිස මසුන් ඇල්ලීම අනාදිමත් කාලයක සිට කරගෙන ආ කටයුත්තක් වන අතර එකල අල්ලාගනු ලැබුවේ බොහෝවිට ප්‍රමාණයෙන් යම් තරමක් විශාල මත්ස්‍ය රටාසමයන්ය. නමුත් වර්තමානයේ යම් ගංගා ආශ්‍රිතව පුපුරණ ද්‍රව්‍ය යොදාගනිමින් මත්ස්‍යයන් මැරීම සිදුකෙරෙන අතර එමගින් කිසිදු තේරීමකින් තොරව සියලු ප්‍රමාණයන්ගේ මෙන්ම සියලු රටාසමයන්ද විනාශ වීම සිදුවේ. වර්තමානයේ අපනයනය සඳහා දේශීය මිරිදිය මසුන් බෝනොකරන අතර ස්වාභාවික පරිසරයෙන් මහා පරිමාණයෙන් එක් රැස් කිරීම සිදුවේ. මේ සඳහා බොහෝ විට වර්ණවත්, අප රටට ආවේණික මෙන්ම දුර්ලභ රටාසමයන් එකතු කරගැනේ.

## විදේශ මත්ස්‍යයන් හඳුන්වා දීම (Introduction of exotic species)

මේ අතරින් වඩාත්ම තර්ජනයක් දේශීය මසුන්වෙත ඇතිකරන්නේ විලෝපික සහ සර්වභක්ෂක මත්ස්‍යයන්ය. සමහර රටාසමයන් හුදෙක් කෙලින්ම මිරිදිය පද්ධති වලට හඳුන්වා නොදුන්නද විසිතුරු මත්ස්‍ය කර්මාන්තය යටතේ මෙරටට පැමිණ ස්වභාවික පරිසරයට නිදහස් වී ඇත. උදාහරණ වශයෙන් මන්නයා :Knife fish *Chitala ornata*) ලෙස හඳුන්වනු ලබන නිශාචර මත්ස්‍යයා එලෙස මෙරටට පැමිණි රටාසමයෙක් වන අතර දේශීය කුඩා මසුන් ගොදුරු කර ගැනීම නිසා යම් යම්

ගැටළු පැන නැගී ඇත. වර්තමානයේ මොවුන් කැළණි, බොල්ගොඩ, සහ කළු ගංගාවල ව්‍යාප්ත වෙමින් පවතී. එසේම අනෙකුත් හඳුන්වාදුන් මත්ස්‍ය රටාසමයන් මගින් ඇති කරන බලපෑම් පිළිබඳ හරියාකාර තක්සේරුවක් කර නොමැති මුත් බොහෝ විට ආහාර සඳහා දේශීය මත්ස්‍ය රටාසමයන් සමඟ තරඟ වැදීම හේතුවෙන් දේශීය රටාසමයන් හට ප්‍රබල බලපෑමක් සිදු විය හැක.

මත්ස්‍යයන් සඳහා පවතින තර්ජන මෙසේ ගොනුකර දැක්වුව ද මේ පිළිබඳව වඩාත් පුළුල්ව අධ්‍යයනයක් කලයුතු බව වැටහේ. එසේ කිරීම මඟින් කුමන රටාසමයන් රටට හඳුන්වා දිය යුතුද කුමන රටාසමයන් විනාශ කළ යුතුද යන්නත්, සංවර්ධන ව්‍යාපාර, කෘෂිකාර්මික ප්‍රතිපත්ති ඇති කිරීමේදී මෙම කරුණු සැලකීම වැදගත් වේ. එමගින් දේශීය මිරිදිය මත්ස්‍ය රටාසමයන් කෙරේ යහපත් කළමනාකරණ සංරක්ෂණ සැලැස්මක් ඇති කර ගැනීමට හැකිවනු ඇත.

## ශ්‍රී ලංකාවේ මිරිදිය මත්ස්‍ය අධ්‍යයන ඉතිහාසය (History of Sri Lankan Ichthyology)

ශ්‍රී ලංකාවේ මිරිදිය මත්ස්‍යයන් සහ සැබැඳි බොහෝ කරුණු ඓතිහාසික වාර්තාවල දක්නට ලැබේ. මහාවංශයේ මත්ස්‍යයනට අභයදානය පිරිනැමුණ අවස්ථා ගැන සදහන්වේ. උදාහරණ ලෙස, III වන අග්‍රබෝධි, මහා පරාක්‍රමබාහු රජවරු මත්ස්‍යයනට අභයදානය දුන් බව කියවේ. එමෙන්ම I වන සේන රජු, මහා විජයබාහු රජු සහ මහා පරාක්‍රමබාහු රජුගේ සෙනවිවරයෙක් මිරිදිය මත්ස්‍යයනට ඇවසි වාසස්ථාන සහ ආහාර ලබාදුන් බව කියවේ. එමෙන්ම රජවරුන් විසින් පිහිටවන ලද සෙල්ලිපි ඇසුරෙන්ද ඉහත කරුණු සනාථ වී ඇත.

ශ්‍රී ලංකාවේ මිරිදිය මත්ස්‍ය අධ්‍යයන ඉතිහාසය හැදෑරීමේදී විදේශීය විද්වතුන්ගේ මෙන්ම දේශීය විද්වතුන්ගේ නොබඳ දායකත්වය ලැබී ඇති බැව් පෙනේ. මුල්ම වාර්තාවලට අනුව ශ්‍රී ලංකාවෙන් මත්ස්‍ය රටාසමයෙක් විද්‍යාලොවට හදුන්වා දුන්නේ 1801 දී බ්ලොච් සහ ස්නයිඩර් යන විදේශීය මත්ස්‍ය සුබෙදු විදුවන් (Taxonomists) විසිනි. ඒ කොළ කනයා ලෙස අපට නමහුරු ශ්‍රී ලංකාවට ආවේණික මිරිදිය මත්ස්‍යයකු වන *Channa orientalis* විදුලොවට හඳුන්වා දීමෙන්ය. ඉන් අනතුරුව දශක 30 කට පමණ පසු 1828 දී එ.එ.එම් රේනොවුඩ් මහතා විසින් ත්‍රිකුණාමලයේ කිනියා ප්‍රදේශයේ උණුදිය උල්පත් ආශ්‍රිතව මත්ස්‍ය රටාසමයන්

කිහිපයක් එකතුකර එවකට පැරිසියේ විසූ ජී. කුවියර් (1860 දශකයේ) සුබෙදු විදුවානන් හට යැවූ අතර ඔහු විසින් එම නිදර්ශක (Specimen) *Puntius thermalis* ලෙස විද්‍යාත්මකව හඳුන්වා දෙන ලදී. ඉන් අනතුරුව කුමින්ග් මහතා විසින් ශ්‍රී ලංකාවේ තෙත් කලාපයෙන් එකතු කරන ලද මත්ස්‍ය නිදර්ශක එවකට බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ සුබෙදු විදූ ඇල්බට් ගුන්තර් මහතාට සපයන ලදුව නව රටාසමයන් රැසක් විදුලොවට ඇතුළු කරන ලදී. 1860 දශකයේ ශ්‍රී ලංකාවට පැමිණි පීටර් බ්ලීකර් විසින් ශ්‍රී ලංකාවේ තෙත් කලාපය පුරා සිදුකරන ලද ගවේෂණයන්ගෙන් පසු නව රටාසමයන් ගණනාවක් නම් කරන ලදී. 1850 වසරේදී ශ්‍රී ලංකාවේ එතෙක් හදුනාගෙන තිබූ සත්ත්ව රටාසමයන් ඇතුළත් කර ග්‍රන්ථයක් සම්පාදනය කළ ඊ.එෆ්. කෙලාට් විසින් ශ්‍රී ලංකාවේ කදුකරය ආශ්‍රිතව මත්ස්‍ය රටාසමයන් ගණනාවක් එක් රැස්කර එම නිදර්ශක වැඩිදුර අධ්‍යයන සඳහා එඩ්වඩ් බ්ලිත් සහ ෆ්‍රැන්සිස් ඩේ යන විද්වතුන් වෙත යවන ලදී. ඔවුන් දෙදෙනා විසින් එම මත්ස්‍ය රටාසමයන් ලොවට හදුන්වාදුන් අතර වර්තමානයේ එම රටාසමයන්ගෙන් කිහිපයක් වාර්තා වී නොමැත. 1875-78 වර්ෂවලදී, ඩේ විසින් ප්‍රසිද්ධ කරන ලද Fishes of India ග්‍රන්ථයෙන් ඉන්දියානු අර්ධද්වීපයේ හා ශ්‍රී ලංකාවේ මත්ස්‍යයන් ගණනාවක් විදුලොවට හදුන්වා දී ඇත. මේ සඳහා ඔහු බ්ලීකර්, ගුන්තර්, සහා කුවියර් යන මත්ස්‍ය විද්‍යාඥයන්ගේ නිදර්ශක එකතුවන් පරිශීලනය කරන ලදී. 1910-1912 වර්ෂවලදී ඩන්කන් විසින් ප්‍රථමවරට ඉන්දියානු මසුන් පිළිබඳව ඇගයීමක් කරන ලදී. 1914 දී ශ්‍රී ලංකාවට පැමිණි ජෝර්ඩන් කොළඹ සහ මහනුවර ප්‍රදේශවල මත්ස්‍ය අධ්‍යයනයන්හි නියැලුණු අතර නව රටාසමයන් තුනක් සොයා ගන්නා ලදී. ශ්‍රී ලංකාවේ මත්ස්‍ය අධ්‍යයනයේ ප්‍රධාන භූමිකාවක් P.E.P. දැරණියගල මහත්මා විසින් ඉටුකරන ලදී. එතුමා කොළඹ ජාතික කෞතුකාගාරයේ අධ්‍යක්ෂක ධූරය හොබවමින් 1928-1933 කාලයේ සිදුකරන ලද අධ්‍යයන ප්‍රතිඵල ලෙස නව රටාසමයන් සහ උපරටාසමයන් ගණනාවක් ගැන පර්යේෂණ පත්‍රිකා Spolia Zeylanica වාර ප්‍රකාශනයේ ප්‍රසිද්ධ කරන ලදී. 1952 දී එතුමා එතෙක් ශ්‍රී ලංකාවෙන් වාර්තා වූ සියලු මත්ස්‍ය රටාසමයන් ඇතුළත් කර ග්‍රන්ථයක් සම්පාදනය කරණ ලදී. 1963 දී කෞතුකාගාර අධ්‍යක්ෂක ධූරයෙන් සමුගන්නා විට ශ්‍රී ලංකාවේ මත්ස්‍ය පර්යේෂණ වලින් වැඩි කොටසක් අවසන්කර තිබිණ. පසු කලෙක මත්ස්‍ය විද්‍යාත්මක පොත් සම්පාදනයකළ මොන්රෝ (1955), මෙන්ඩිස් සහ ප්‍රනාන්දු (1962) විසින් දැරණියගල මහතාගේ ඉහත දත්ත ප්‍රයෝජනයට ගන්නා ලදී.

ඉන්පසුව ශ්‍රී ලංකාවේ මත්ස්‍ය අධ්‍යයනයන්ගේ ඉසුරුමත් කාලය උදාවන්නේ 1980 දශකයෙන් පසුවය. 1980 දී රනිල් සේනානායක මහතා තම ආචාර්ය උපාධි නිබන්ධනයට ශ්‍රී ලංකාවේ මත්ස්‍ය රටාසමයන්ගේ ව්‍යාප්තිය සහ පරිසර විද්‍යාව අධ්‍යයනය කරන ලදී. ඔහු විසින් දුම්බර කදුවැටිය ආශ්‍රිතව නව මත්ස්‍ය රටාසමයෙක් ලොවට හදුන්වා දෙන ලදී. 1980 දශකයේ අවසානයේ සිට 1991 වසර දක්වා කාලය තුළ මර්සි කොට්ලට් සහ රොහාන් පෙතියාගොඩ මහතුන් විසින් මත්ස්‍ය රටාසමයන් ගණනාවක් ශ්‍රී ලංකාවෙන් හඳුනා ගන්නා ලදී. 1991 වසරේදී රොහාන් පෙතියාගොඩ මහතා එතෙක් මිරිදිය මසුන් පිළිබඳව සැකසූ සම්පූර්ණ ක්ෂේත්‍ර හඳුනා ගැනීමේ ග්‍රන්ථයක් එළිදැක්වීය. 1991 වසරෙන් පසු මත්ස්‍යයන් පිළිබඳ උනන්දුවක් දැක්වූ ආයතන, පුද්ගලයන් විසින් විවිධ මට්ටමේ අධ්‍යනයන් සිදුකරන ලද අතර වොටිසන් (1998), බයිලි හා ගැන්ස් (1998) විසින් නව රටාසමයන් දෙකක් සොයාගන්නා ලදී. අවසාන වශයෙන් 2005 වසරේදී කොට්ලට් සහ පෙතියාගොඩ මහතුන් විසින් *Puntius singhala* පිළිබඳව තිබූ සුබෙදුන් ගැටලු නිරාකරණය කරමින් පර්යේෂණ පත්‍රිකාවක් එළිදැක්වූ අතර (2006) පෙතියාගොඩ මහතා විසින් ශ්‍රී ලංකාවේ මිරිදිය මත්ස්‍ය විවිධත්වය හා සුබෙදුන් ගැටලු පිළිබඳව Conservation of Sri Lankan Freshwater fishes යන පර්යේෂණ පත්‍රිකාවේ සාකච්ඡාකර ඇත.

## ශ්‍රී ලංකාවේ මිරිදිය මත්ස්‍ය කුල හඳුනා ගැනුමට සුබෙදුන් සුචිය (Taxonomic Key to the Families of the Freshwater Fishes of Sri Lanka)

1. හිස දිගටිය, ත්‍රිකෝණාකාරය. සිරස් adipose ඇසිපිය දැකිය හැක. හැඩයෙන් කරදිය හාල්මැස්සෙකුට සමානය (පලක 24.2). ------------------------------------------------------------ කුලය: **Clupeidae** (අයිරාවා)
   ඉහත ලක්ෂණ නොදරයි. ---------------------------------------------2.

2. පෘෂ්ඨීය, ගුද සහ වලිග වරල මත කොරළ පිහිටයි. පාර්ශ්විකව හිසේ සිට වලිගය තෙක් සිරස් ලප 6-7 පවතී (පලක 24.3). ---------------------------------------------------------- කුලය: **Toxotidae** (දිමිත්තා)
   ඉහත ලක්ෂණ නොදරයි. ---------------------------------------------3

3. උඩ හනුව (upper mandible) කෙටිය. යටිහනුව (lower mandible) දික්වී දිගු හොටක් ලෙස දිස්වේ (පලක 2.3, 2.5).---------------------------------------------------------------- කුලය: **Hemiramphidae** (මොරැල්ලා)
   හනු ඉහත ආකාර නොවේ. --------------------------------------------- 4

4. උඩ සහ යටි හනු දික්වී හොටක් මෙන් දිස්වේ. හනුවල දත් පැහැදිලිව පිටතට නිරාවරණය වේ (පලක 2.4). ---------------------------------------------------------------- කුලය: **Belonidae** (යොනා)
   උඩ හනුව සහ යටි හනුව දිගින් බොහෝ සමානය, කෙටිය. හොටක් මෙන් දිස් නොවේ. සමහර රටාසමයන්ගේ හොම්බ තරමක් ඉදිරියට දික්ව පැවතිය හැක. --------------------------------------------- 5

5. පෘෂ්ඨීය වරල් දෙකක් දරයි. සමහර රටාසමයන්ගේ දෙවන පෘෂ්ඨීය වරල කිරණ රහිත ඇඩිපස් (adipose fin) වරලකි (පලක 4,6,7,8.3,8.4).--------- 6
   එක් පෘෂ්ඨීය වරල් දරයි. ( පලක 4.1-3). --------------------------------- 9

6. පෘෂ්ඨීය වරල් දෙකෙහිම කිරණ දරයි. --------------------------------- 7
   දෙවන පෘෂ්ඨීය වරල කිරණ රහිත ඇඩිපස් (adipose fin) වරලකි.---------- 8

7. ශ්‍රෝණි වරල් යුගල එක්වී චූෂකරයක් තනයි (පලක 6,7). ----------------------------------------------------------- කුලය: **Gobiidae** (වැලිගොව්වන්)
ශ්‍රෝණි වරල් යුගල වෙන්වී පවතියි (පලක 8.3,8.4).--------------------------------------------------------------- කුලය: **Eleotrididae** (උඩුප්පුව)

8. සිරුරේ දාර සහිතය. කොරළ පලක ආකාරයකි. පෘෂ්ඨීය සහ ලයවරල්වල ආරම්භක කණ්ඨකය ඉතා දැඩිය (පලක 4.4). ---------------------------------------------------------------- කුලය: **Loricariidae (Tank cleaner)**
සිරුරේ දාර රහිතය. කොරළ නොමැත. පෘෂ්ඨීය සහ ලයවරල් වල කණ්ඨක ඇත. (පලක 4.1-3). -------------------------- කුලය: **Bagridae** (අංකුට්ටන්)

9. ශරීරයේ කොරළ නොමැති හෝ පියවි ඇසට නොපෙනෙන තරම් ඉතා කුඩා කොරළ දරයි (පලක 1,2.1-2,3). ------------------------------------------ 10
පියවි ඇසට පෙනෙන විශාල කොරළ දැකිය හැක (පලක 18). ------------- 19

10. සර්පයකුගේ මෙන් ශරීරය දිගුය, සිලින්ඩරාකාර හෝ ද්විපාර්ශිකව පැතලිය. ------------------------------------------------------------------------------ 11
ශරීරය කෙටිය, ද්ර්ශීය මත්ස්‍ය ආකාරය. --------------------------------- 14

11. ශරීරය ද්විපාර්ශිකව පැතලිය, දර්ශිය පිහි තලයක හැඩයකි (knife shape) (පලක 3.5). ------------------------------කුලය: **Notopteridae** (මන්නයා)
ශරීරය දිගුය පිහි හැඩයක් නොමැත, සිලින්ඩරාකාර හෝ ද්විපාර්ශිකව පැතලිය.--------------------------------------------------------- 12

12. ශරීරයේ පෘෂ්ඨීය දාරයේ පෘෂ්ඨීය වරලට ඉදිරියෙන් ස්වාධීනව මතු වූ කණ්ඨක ඇත (පලක 2.1-2)----------කුලය: **Mastacembelidae** (තෙලියන්)
ඉහත දැක්වූ ආකාරයේ කණ්ඨක දැකිය නොහැක. ----------------------- 13

13. ලය වරල් ඇත, ඇස් විශාලය (පලක 1.1-2). ------------------------------------------------------------------------------- කුලය: **Anguillidae** (ආඳන්)
ලය වරල් නැත, ඇස් ඉතා කුඩාය (පලක 1.3-4).------------------------------------------------------------------කුලය: **Synbranchidae** (පොට්ට ආඳන්)

14. මුඛය අග්‍රස්ථව පිහිටයි, අංකුට රහිතය (පලක 23.4). ----------------------
-------------------------------------------- කුලය: **Salmonidae** (ට්‍රවුට්)
මුඛය අග්‍රස්ථව හෝ උදරියව පිහිටයි, දිග අංකුට දැකිය හැක. ------------15

15. මුඛය උදරියව පිහිටයි, කෙටි අංකුට දැකිය හැක. --------------------------16
මුඛය ඉදිරිපසින් පිහිටයි, දිග අංකුට දැකිය හැක. --------------------------17

16. අංකුට යුගල් හතරකි. සිරුරේ සිරස් අතට තද පැහැ පටි (bands) සහිතය (පලක 5.1-2). ------------------------------ කුලය: **Balitoridae** (අහිරාවන්)
අංකුට යුගල් තුනකි. සිරුරේ තද පැහැ තිත් හෝ ලප (spots or blotches) සහිතය (පලක 5.3-4). --------------------- කුලය: **Cobitidae** (අහිරාවන්)

17. වලිගය දෙකට බෙදී ඇත (පලක 3.3-4, 4.1-3). --කුලය: **Siluridae** (වලයන්)
වලිගය දෙකට බෙදී නැත ( පලක 3.1-2). ---------------------------------18

18. පෘෂ්ඨීය වරල වලිගය දක්වා දිගුය (පලක 3.1). --- කුලය: **Clariidae** (මගුරා)
පෘෂ්ඨීය වරල කෙටිය (පලක 3.2). ------කුලය: **Heteropneustidae** (හුංගා)

19. පෘෂ්ඨීය වරලේ අවසන් කිරණය දිගුය (පලක 23.3). ------------------------
------------------------------------------- කුලය: **Megalopidae** (ඉලයා)
පෘෂ්ඨීය වරලේ අවසන් කිරණය ඉහත ආකාර නොවේ. --------------------20

20. පෘෂ්ඨීය වරල සිරුරේ පසුපසට වන්නට පිහිටයි ((පලක 10).---------------21
පෘෂ්ඨීය වරල නිරන්තරයෙන්ම වලිගය සහ හිස අතර මධ්‍යයට හෝ ඉදිරියට ආසන්නව පිහිටයි.---------------------------------------------------22

21. ලයවරලේ ඉහළ දාරය තිර්යක් රේඛාවට (longitudinal axis) ඉහළින් පිහිටයි (පලක 10.4). --------------------------- කුලය: **Oryziidae** (හන්දි හඳයන්)
ලයවරලේ ඉහළ දාරය තිර්යක් රේඛාවට පහළින් පිහිටයි (පලක 10.1-3). ----
------------------------------------------කුලය: **Aplocheilidae** (උඩ හඳයන්)

22. වලිග වරල දෙබල්ය ( forked caudal fin ) (පලක 15-23). -------------------
------------------------------------------- කුලය: **Cyprinidae** (පෙතියන්)
වලිග වරල බෙදී නොමැත (caudal fin rounded or truncate) -------------23

23. වරල්වල කණ්ඨක නොමැත . ------------------------------------------24
වරල්වල කණ්ඨක ඇත. ----------------------------------------------25

24. පෘෂ්ඨීය වරල හිස පසුපසින් ආරම්භව වල්ග ආරම්භය තෙක් දිවේ (පලක 9).
------------------------------------කුලය: **Channidae** (කනයන්, ලූලන්)
පෘෂ්ඨීය වරල කෙටිය නිරන්තරයෙන්ම වලිගය සහ හිස අතර මධ්‍යයට ආසන්නව පිහිටයි (පලක 24.4,25). ---------- කුලය: **Poeciliidae** (ගප්පි)

25. පූර්ව සහ අපර පිධාන දාරයේ කටු සහිතය. ශ්‍රෝණි වරලේ, වරලෙන් එළියට විහිදුන කණ්ඨකයකි (පලක 11.3). --------- කුලය: **Anabantidae** (කාවයියා)
පිධානයේ දාරයේ කටු රහිතය. ශ්‍රෝණි වරලේ, ඉහත ආකාර කණ්ඨකයක් නැත. ---------------------------------------------------------------- 26

26. ශ්‍රෝණි වරලේ යටත් පිරිසියෙන් දික්වූ එක් කිරණයක් හෝ දැකිය හැක. --- 27
ශ්‍රෝණි වරලේ දික්වූ කිරණ නැත. ------------------------------------------28

27. සිරුර පැතලි සහ දිගටි ස්වරූපයකි, *Trichogaster* රටාසමයන්ගේ හැර අන් රටාසමයන්ගේ වලිග වරලේ අවම වශයෙන් දික්වූ කිරණයක් හෝ දැකිය හැකි ප්‍රමාණයෙන් කුඩාය (සෙ.මී. 25 අඩුය) (පලක 12.3,13.1-2). -------------
-------------------------------------කුලය:**Belontiidae** (පුළුට්ටන්, ගුරාමි)
සිරුර පැතලි හා ගැඹුරින් යුක්තය වලිග වරලේ දික්වූ කිරණ නොමැත. යන්තමින් බෙදී ඇත ප්‍රමාණයෙන් විශාලය (සෙ.මී. 25 වඩා වර්ධනය වේ) සෙ.මී. 15 පමණ පැටවුන්ගේ කුඩා තොල් සහිත මුඛය උල්ව ඉහළට එසවී ඇති අතර වර්ධනයත් සමග පෙරළුණ විශාල තොල් බවට පත්වේ (පලක 12.4). ------------------------------ කුලය: **Osphronemidae** (යෝධ ගුරාමි)

28. දුඹුරු මිශ්‍ර කොළ පැහැයකි. ලා සුදු මිශ්‍ර කොළ පැහැති තිරස් සිහින් ඉරි දැකිය හැක (පලක 13.3-4). ----------කුලය: **Helostomatidae** (හාදු ගුරාමි)
ඉහත වර්ණ රටාව නොමැත (පලක 11.1-2,13.3-4).--------------------------
--------------------------------------- කුලය: **Cichlidae** (කොරලි, තිලාපි)

## ශ්‍රී ලංකාවේ මිරිදිය මත්ස්‍ය රටාසමයන් හඳුනා ගැනුමට සුබෙදුන් සුචිය

## (Taxonomic Key to the Species of the Freshwater Fishes of Sri Lanka)

කුලය: **Clupeidae** (අයිරාවා)

1. එක් රටාසමයෙක් පමණි (පලක 24.2). ----------------- ***Ehirava fluviatilis***

කුලය: **Toxotidae** (දිමිත්තා)

1. එක් රටාසමයෙක් පමණි (පලක 24.3). ----------------- ***Toxotes chatareus***

කුලය: **Hemiramphidae** (මොරැල්ලා)

1. යටි හනුවේ කෙළවර තියුණුය (පලක 2.3). --------- ***Zenarchopterus dispar***
   යටි හනුවේ කෙළවර කුඩා ගැටිත්තකින් අවසන් වේ (පලක 2.5). ------------
   ------------------------------------------------ ***Hyporhamphus limbatus***

කුලය: **Belonidae** (යොනා)

1. එක් රටාසමයෙක් පමණි (පලක 2.4).------ ***Xenentodon cancila***

කුලය: **Gobiidae** (වැලිගොව්වන්)

1. ඉහල හනුවේ සිට ඇස දක්වා දිවෙන අඳුරු පැහැති ඉරි දෙකකි. ශ්‍රෝණි වරල දිගටිය (පලක 6.1). ---------------------------- ***Awaous melanocephalus***
   ඉහත වර්ණ රටාවන් නොමැත------------------------------------------------2

2. ඉහල හනුවේ සිට ඇස දක්වා තනි ඉරකි. පාර්ශ්වික අඳුරු ලප 4-5ක් ඇත (පලක 6.2). ---------------------------------------- ***Glossogobius giuris***
   හනුවේ සිට ඇස දක්වා ඉරි දැකිය නොහැක.-------------------------------3

3. පිධානයේ පටල සම්බන්ධ වී නොමැත. නිදහස්ය (පලක 6.3). ---------------
   ---------------------------------------------------***Oligolepis acutipennis***
   පිධානය ඉහත ආකාරයක් නොගනී. ----------------------------------------4

4. සිරුර කොරළ නොමැත. පිරිමි මසුන්ගේ මුඛය රතු පැහැතිය (පලක 6.5). ---
   ------------------------------------------ ***Schismatogobius deraniyagalai***
   සිරුර කොරළ සහිතය. මුඛය රත්පැහැ නැත. --------------------------------5

5. හිස පෘෂ්ඨ උදරියව පැතලිය. පිධානය යට දැලක් ආකාර ව්‍යුහයක් දරයි. සිරුරෙ සිරස් ඉරි දැකිය හැක. පූර්ව පෘෂ්ඨීය කොරළ 8 කි (පලක 6.4). ----- ------------------------------------------- *Stenogobius malabaricus*
ඉහත ආකාරයක් නොගනී. ------------------------------------------------ 6

6. පිරිමි මසුන්ගේ තොල් රතු පැහැතිය. පෞච්ඡ වටන්තයට ඉදිරියෙන් දීප්තිමත් රතු පැහැති දිගු ලපයකි. පළමු සහ දෙවන පෘෂ්ඨීය වරල් ඈත්ව පිහිටයි (පලක 7.3). ----------------------------------------- *Sicyopus jonklaasi*
ඉහත ආකාරයක් නොගනී------------------------------------------------7

7. පලමු පෘෂ්ඨීය වරල උල් හැඩයකි . ---------------------------------------8
පළමු පෘෂ්ඨීය වරල රවුම් හැඩයකි. නිල් පැහැයෙන් යුත් ශරීර වර්ණයකි(පලක 7.4). ----------------------------- *Stiphodon martenstyni*

8. පෘෂ්ඨීය වරල ඉතා සමීපව පිහිටයි. වලිග වරල තනි වර්ණයකි (පලක 7.1). -- ---------------------------------------------------- *Sicyopterus griseus*
පෘෂ්ඨීය වරල් දුරස්ථව පිහිටයි. පිරිමි මසුන්ගේ වලිග වරල රතු පැහැති. එහි මායිම් නිල් හෝ කහ පැහැයක් ගනී (පලක 7.2). ---------- *Sicyopterus halei*

කුලය: **Elaeatridae** (උඩප්පුවන්)

1. වලිගය රවුම් හැඩයකි. මුඛය ඇස පසුකර යයි (පලක 8.4). -- *Eleotris fusca*
වලිගය චතුරස්‍රාකාර හැඩයකි. මුඛය ඇසට ඉදිරියෙන් කෙළවර වෙයි (පලක 8.3). ------------------------------------------------------------- *Butis butis*

කුලය: **Notopteridae** (මන්නයන්)

1. එක් රටාසමයෙක් පමණි (පලක 3.5). ------------------------- *Chitala ornata*

කුලය: **Mustacemblidae** (තෙලියන්)

1. පෘෂ්ඨීය, වලිග සහ ගුද වරල් එකට සම්බන්ධ වී ඇත (පලක 2.2).------------- ---------------------------------------------------*Mastacembelus armetus*
පෘෂ්ඨීය, වලිග සහ ගුද වරල් එකිනෙකට වෙන්ව ඇත (පලක 2.1). ----------- -----------------------------------------------------*Macrognathus aral*

කුලය: **Anguillidae** (ආඳන්)

1. පෘෂ්ඨීය සහ ගුද වරල ආරම්භය එකම මට්ටමේ පිහිටයි (පලක 1.1).---------
   ------------------------------------------------------------ *Anguilla bicolor*
   පෘෂ්ඨීය වරල ආරම්භය ගුද වරල ආරම්භයට ඉදිරියෙන් පිහිටයි (පලක 1.2).---------------------------------------------------*Anguilla nebulosa*

කුලය: **Synbranchidae** (පොට්ට ආඳන්)

1. වලිග වරලේ හඳුනාගත හැකි කිරණ 3-4ක් දැකිය හැක (පලක 1.3). ---------
   ------------------------------------------------- *Ophisternon bengalense*
   වලිග වරල අපැහැදිලිය. කිරණ රහිත සම් පටලයක් සේ දිස්වේ (පලක 1.4).
   ------------------------------------------------------ *Monopterus desilvai*

කුලය: **Salmonidae** (ට්‍රවුට්)

1. එක් රටාසමයෙක් පමණි (පලක 23.4). ------------- *Oncorhynchus mykiss*

කුලය: **Balitoridae** (අහිරාවන්)

1. අංශ රේඛාව සම්පූර්ණ වේ. වලිග නටුව අසල පෘෂ්ඨීයව තද පැහැ තිතකි (පලක 5.1). ------------------------------ *Acanthocobitis urophthalmus*
   අංශ රේඛාව අසම්පූර්ණ වේ. වලිග නටුව අසල සිරස් තද පැහැ ඉරකි (පලක 5.2). -------------------------------------------- *Schistura notostigma*

කුලය: **Cobitidae** ( අහිරාවන්)

1. ශරීරයේ අක්‍රමවත් සාපේක්ෂව විශාල පුල්ලි සහිතය (පලක 5.3). ------------
   ------------------------------------------ *Lepidocephalichthys jonklaasi*
   ශරීරයේ පාර්ශිකව අක්‍රමවත් සාපෙක්‍ෂ කුඩා පුල්ලි පේලියකි. පෘෂ්ඨීයව පුල්ලි පේලියකි. මෙම පේලි දෙක අතර අක්‍රමවත් ලප කැලැල් පේලි දෙකකි. (පලක 5.4). ---------------------------------- *Lepidocephalichthys thermalis*

කුලය: **Bagridae** (අංකුට්ටන්)

1. ශරීරයේ පාර්ශිකව තිරස් ඉරි පේලි 3 හෝ 4 කි. වලිග නටුවේ කළු තිතකි (පලක 4.3). ---------------------------------------------*Mystus vittatus*
   ශරීරයේ පාර්ශිකව තිරස් ඉරි පේලි හෝ වලිග නටුවේ කළු තිතක් නොමැත. -
   -----------------------------------------------------------------------2

2. පෘෂ්ඨීය වරල ත්‍රිකෝණාකාරය, අග්‍රය ඉතා දිගුය. පෘෂ්ඨීය වරල ආරම්භයේ ශරීරයේ කළු තිතකි. ඇඩිපස් වරල පෘෂ්ඨීය වරල අසලින් පටන් ගෙන වලිග නටුව දක්වා දිවේ (පලක 4.2). ---------------------------- *Mystus cavasius*
පෘෂ්ඨීය වරල ත්‍රිකෝණාකාරය, අග්‍රය කෙටිය. හැඩයකි. පෘෂ්ඨීය බණ්ඩකය වරල කෙළවර තෙක් නොයයි. පෘෂ්ඨීය ඇඩිපස් වරල සාපේක්ෂව කුඩාය (පලක 4.1). ---------------------------------------------- *Mystus gulio*

කුලය: **Siluridae** (වලයන්)

1. මුඛයේ කෙළවර ඇසේ අපර සීමාව පසුකර ගමන් ගනී (පලක 3.3). ----------- ------------------------------------------------------------- *Wallago attu*
මුඛයේ කෙළවර ඇසේ අපර සීමාව පසුකර ගමන් නොගනී (පලක 3.4).------- ----------------------------------------------------- *Ompok bimaculatus*

කුලය: **Clariidae** (මගුරා)

1. එක් රටාසමයෙක් පමණි (පලක 3.1). ------------------- *Clarias brachysoma*

කුලය: **Heteropneustidae** (හුංගා)

1. එක් රටාසමයෙක් පමණි (පලක 3.2). -------------- *Heteropneustes fossilis*

කුලය: **Loricarida (Tank cleaner)**

1. එක් රටාසමයෙක් පමණි (පලක 4.4). ------ *Pterygoplichthys multiradiatus*

කුලය: **Megalopidae** (ඉලයා)

1. එක් රටාසමයෙක් පමණි (පලක 23.3). ---------------*Megalops cyprinoides*

කුලය: **Oryziidae** (හන්දි හඳයා)

1. එක් රටාසමයෙක් පමණි (පලක 10.4). --------------*Oryzias* **cf.** *melastigma**
* පෙතියාගොඩ මහතාට (2006) අනුව නව රටාසමයන් දෙකකට වෙන්කර ඇත.

කුලය: **Aplocheilidae** (උඩහඳයා)

1. පිරිමි සහ ගැහැණු මසුන්ගේ කළු තිත් හෝ කළු තීරු දැකිය හැක. -----------2
පිරිමි සහ ගැහැණු මසුන්ගේ කළු තිත් හෝ කළු තීරු දැකිය නොහැක (පලක 10.2). ----------------------------------------------*Aplocheilus parvus*

2. පිරිමි මසුන්ගේ පාර්ශිකව කළු තිත් 2-3 දැකිය හැක. ගැහැණු මසුන්ගේ ගුද වරල පටන් ගන්නා ස්ථානයෙහි වලිගයේ කළු ලප හෝ සිරස් තීරු 5-6 දැකිය හැක. එම ලප ගුද වරල තෙක් ද සමහර විට විහිදේ (පලක 10.1). ------------ ------------------------------------------------------------*Aplocheilus dayi*

පිරිමි මසුන්ගේ පාර්ශිකව ගුද වරල පටන් ගන්නා ස්ථානයට ඉහළින් සිරස් තීරු 5-6 ක් පිහිටයි. ගැහැණු මසුන්ගේ එම තීරු එකතුවී කළු පැල්ලමක් සේ දිස්වේ. එයට ඉහළින් කළු තිත් පෘෂ්ඨීයව දැකිය හැක (පලක 10.3)--------- ------------------------------------------------------- *Aplocheilus werneri*

කුලය: **Channidae** (ලූලන්, කණයන්)

1. ශ්‍රෝණි වරල නොපිහිටයි (පලක 9.3). ------------------- *Channa orientalis*

ශ්‍රෝණි වරල පිහිටයි.-------------------------------------------------------2

2. පෘෂ්ඨීය වරල මායිම රතු, නිල්, හෝ සුදු පැහැයෙන් යුක්තය. කිරණ 350 වඩා අඩුය.----------------------------------------------------------------------3

පෘෂ්ඨීය වරල බොහෝ විට තනි පැහැතිය. ඉහත ආකාරයේ වර්ණ නොපිහිටයි.-------------------------------------------------------------4

3. පෘෂ්ඨීය සහ ගුද වරල දාරය රතු තැඹිලි පැහැතිය. පෘෂ්ඨීය වරලෙහි තිරස් අතට නිල් සුදු පැහැති පටියකි. ශ්‍රෝණි වරල සාපේක්ෂව කුඩාය (පලක 9.2). ------------------------------------------------------------ *Channa gachua*

පෘෂ්ඨීය සහ ගුද වරල නිල් පැහැතිය. දාරය සුදු පැහැතිය. ඒ අතර කළු පැහැති කඩ ඉරි දැකිය හැක. ශ්‍රෝණි වරල සාපේක්ෂව විශාලය (පලක 9.4). ----------------------------------------------------------- *Channa punctata*

4. ශරීරය දම් පැහැයෙන් යුක්තය. සුදු පැහැති තිත් දැකිය හැක. සිරස් ඇල ඉරි 5-6 ක් පාර්ශ්විකව ඇත (පලක 9.1). ----------------------------*Channa ara*

ශරීරය සුදු කළු පැහැයකි. බඩවත සුදු පැහැතිය. සිරස් ඇල ඉරි 15ක් පමණ දැකිය හැක (පලක 9.5)------------------------------------- *Channa striata*

කුලය: **Poeciliidae** (ගප්පි)

1. පාර්ශ්විකව මධ්‍යයට වන්නට තිරස් රතු දුඹුරු ඉරකි. පිරිමි සතුන්ගේ වලිග වරලේ පහළ මායිමේ කිරණයන් දික්වී අසිපත් තල ආකාරයක් ගනී (පලක 25.3). ---------------------------------------------- ***Xiphophorus hellerii***
   පාර්ශ්විකව තිරස් ඉරක් නොපිහිටයි. වලිග වරලේ දික් වූ කිරණ නොමැත. ---2

2. වර්ණය රතු පැහැ හෝ අඳුරු නිල් පැහැයකි. ශරීරයේ කළු තිත් දැකිය හැක (පලක 24.4). ------------------------------------***Xiphophorus maculatus***
   වර්ණය ඉහත ආකාර නොවේ. ---------------------------------------------3

3. දුඹුරු පැහැතිය. පිරිමි මසුන්ගේ වර්ණ දැකිය නොහැක (පලක 25.1).-------- -------------------------------------------------------- ***Gambusia affinis***
   පිරිමි සතුන්ගේ වලිග නටුවේ පෘෂ්ඨීයව කළු ලපයකි. ඊට ඉදිරියේ රතු රෝස ලපයකි. පිධානයට පිටුපසින් කළු හෝ රතු තිතක් සහිතය (පලක 25.2). ----- --------------------------------------------------------- ***Poecilia reticulata***

කුලය: **Anabantidae** (කාවයියා)

1. එක් රටාසමයෙක් පමණි (පලක 11.3).------------------ ***Anabas testudineus***

කුලය: **Belontiidae** (පුළුට්ටන්, ගුරාමි)

1. ශ්‍රෝණි වරලේ කිරණයන් ඉතා දිගුය. ගුද වරල කෙළවර තෙක් බොහෝ විට දික්වේ. ------------------------------------------------------------------2
   ශ්‍රෝණි වරලේ කිරණය එතරම් දිගු නොවේ. ---------------------------------3

2. වර්ණය රෝස රිදී පැහැයකි. ශරීර පාර්ශ්වික මධ්‍යයේ සහ වලිග වටන්තයෙහි කළු ලප දෙකකි (පලක 13.2). ------------------- ***Trichogaster trichopterus***
   වර්ණය අළු කොළ පැහැතිය. මුඛයේ සිට වලිග නටුව තෙක් දිවෙන කළු පැහැති තිරස් ඉරකි. සිරස් ලා පැහැති ඇල ඉරි දැකිය හැක (පලක 13.2).---- --------------------------------------------------***Trichogaster pectoralis***

3. ශ්‍රෝණි වරලේ දික් වූ කෙටි කිරණ දෙකකි. වලිග වරලේ කිරණ දිගුය. පෘෂ්ඨීය සහ ගුද වරලේ කෙළවර දික්වූ කිරණ ඇත (පලක 12.1). --------------------- --------------------------------------------------------- ***Belontia signata***
   ඉහත ආකාර නොවේ. ------------------------------------------------------4

4. පෘෂ්ඨීය, ගුද, වලිග, සහ ශ්‍රෝණි වරල්වල දික්වූ කිරණ එකක් හෝ කිහිපයක් දැකිය හැක (පලක 12.2). ------------------------------ *Malpulutta kretseri*
ගුද සහ ශ්‍රෝණි වරල්වල පමණක් දික්වූ කිරණ එකක් දැකිය හැක. වලිග නටුව අසල කළු තිතකි(පලක 12.3). -------- *Pseudosphromenus cupanus*

කුලය: **Osphronemidae** (යෝධ ගුරාමි)

1. එක් රටාසමයෙක් පමණි (පලක 12.4).--------------- *Osphronemus goramy*

කුලය: **Helostomatidae** (හාදු ගුරාමි)

1. එක් රටාසමයෙක් පමණි (පලක 11.4).-------------- *Helostoma temminckii*

කුලය: **Cichlidae** (තිලාපි, කොරලි)

1. ගුද වරලේ කණ්ඨක 3ට වඩා වැඩිය. ---------------------------------------- 2
ගුද වරල කණ්ඨක 3ට සීමා වේ (පලක 13.3-4).------------------------------
--------------------*Oreochromis* සහ *Tilapia* spp. (තිලාපියා රටාසමයන්)

2. ශරීර වර්ණය කහ පැහැතිය. පාර්ශ්විකව කළු ලප 3කි (පලක 11.1)-----------
------------------------------------------------------*Etroplus maculatus*
ශරීර වර්ණය කොළ පැහැතිය. සිරස් ලා පැහැති ඇල පටි දැකිය හැක. සුදු රිදී පැහැති තිත් දැකිය හැක (පලක 11.2). ------------ *Etroplus suratensis*

කුලය: **Cyprinidae** (පෙතියන්)

## Cyprinidae කුලයේ උප කුල සඳහා සුබෙදුන් සුචිය
## (Taxonomic Key to the subfamilies of Cyprinidae)

1. ශරීරය අර්ධ සිලින්ඩරාකාරය. මුඛය උදරීයව පිහිටයි. යටි තොල චූෂකරයක් සේ සැකසී ඇත .-------------------------උපකුලය **Garrinae** (ගල් පාඩින්)
ශරීරය ද්විපාර්ශ්විකව පැතලිය. තොල දර්ශීය මත්ස්‍ය ආකාරය --------------2

2. උදරීය බඩවත නෞතලාකාරය (Keeled). බොහෝ විට හිස සහ කඳ අතර නැමුමක් (ඇදයක්) දැකිය හැක.-------- උප කුලය **Cultrinae** (කර ඇදයන්)
උදරීය බඩවත නෞකාකාර නොවේ. තරමක් පැතලිය (Rounded). ---------3

3. යටි හනුවේ (Symphysis) ගැටිත්ත දැකිය හැක.------------------------------
--------------------------උප කුලය **Rasborinae** (දණ්ඩි, දම්කොළ සාලයන්)
යටි හනුවේ ඉහත ආකාර ගැටිත්තක් නොමැත ------------------------------
------------------------------------------ උප කුලය **Cyprininae** (පෙතියන්)

## Garrinae උප කුලයේ මත්ස්‍ය රටාසමයන් හඳුනා ගැනුමට සුබෙදුන් සුචිය
## (Taxonomic Key to the Species of the subfamily Garrinae)

1. යටි හනුව වක්‍රව ඇත. රොස්ටල් නෙරුමේ මධ්‍ය උදරීය ඇලියක් ඇත. පසු පෙදෙසේ කොරළ කුඩාය (පලක 8.1). ------------------ *Garra ceylonensis*
යටි හනුව රේඛීය වේ. රොස්ටල් නෙරුමේ මධ්‍ය උදරීය ඇලියක් නොමැත. පසු පෙදේසේ විශාල කොරළ ඇත (පලක 8.1). -------- *Garra* cf. *phillipsi* *

## Cultrinae උප කුලයේ මත්ස්‍ය රටාසමයන් හඳුනා ගැනුමට සුබෙදුන් සුචිය.
## (Taxonomic Key to the Species of the subfamily Cultrinae)

1. උදරීයව නෞතලයක් තනයි (පලක 15.1). ------------ *Chela ceylonensis***

## Rasborinae උප කුලයේ මත්ස්‍ය රටාසමයන් හඳුනා ගැනුමට සුබෙදුන් සුචිය
### (Taxonomic Key to the Species of the subfamily Rasborinae)

1. අංකුට පැහැදිලිව පිටතට දෘශ්‍යමාන වේ. යුගල් 2කි (පලක 16.1). ------------
----------------------------------------------------- *Esomus thermoicos*
අංකුට පැහැදිලිව පිටතට දෘශ්‍යමාන නොවේ.------------------------------2

2. පූර්ව අස්ථිමය ප්‍රසරයක් ඇසට ඉදිරියෙන් නෙරා ඇත (පලක 15.3).----------
----------------------------------------------*Devario* cf. *aequipinnatus**
පූර්ව අස්ථිමය ප්‍රසරයක් ඇසට ඉදිරියෙන් දැකිය නොහැක-----------------3

3. ශරීරයේ කහ පැහැති තිත් සහ සිරස් හෝ තිරස් ඉරි ඇත. -------------------4
ශරීරයේ කළු පැහැති පාර්ශ්වික තිරස් ඉරක් හෝ ඉරි කිසිවක් නොමැත.* ---5

* පෙතියාගොඩ මහතාට (2006) අනුව නව රටාසමයෙක් වේ.
** මීට අමතරව පෙතියාගොඩ මහතා (2006) ශ්‍රී ලංකාවේ නව රටාසමයන් 2 ෙනක් ඇති බව සඳහන් කරයි.

4. තිරස් කහ පැහැති ඉරි 2-3 ශරීර මධ්‍යයේ සිට වලිගය තෙක් පාර්ශිකව දිස් වේ (පලක 15.2). ------------------------------------ ***Devario malabaricus***
කහ පැහැති තිරස් සහ ඇල ඉරි 5-7 ශරීර මධ්‍යයේ සිට වලිගය තෙක් පාර්ශිකව දිස් වේ (පලක 15.4). ------------------------ ***Devario pathirana***

5. ශරීරයේ තිරස් කළු ඉරක් පාර්ශ්විකව දිස් වේ. ------------------------------ 6
ශරීරයේ තිරස් කළු ඉරක් පාර්ශ්විකව දැකිය නොහැක. ------------------- 8

6. යටි හනුවේ පූර්ව කෙළවර (Symphysis ගැටිත්තේ පිහිටීම සහ premaxillary නෙරීම්) "W" ආකාර වේ. පාර්ශ්විකව ඇති කළු තීරුවෙන් පෘෂ්ඨීය මායිම ඡේඛීය නොවේ (පලක 16.4).------------------------------ ***Rasbora wilpita***
යටි හනුවේ ඉහත ආකාර නෙරුමක් නොමැත. පාර්ශිකව කළු තීරුවෙහි පෘෂ්ඨීය මායිම ඡේඛීය හෝ රැලි ආකාරයක් ගනී. --------------------------7

7. පාර්ශික පටු කළු තීරුවකි. පෘෂ්ඨීය දාරය ඡේඛීය වේ. පෘෂ්ඨීයව බලන විට පෘෂ්ඨීය වරලට දෙපසින් ශරීරය තුලින් කහ පැහැති ගෝලාකාර ව්‍යුහයන් 2ක් දැකිය හැක (පලක 16.3). -----------------------------***Rasbora caverii***
පාර්ශික කළු තීරුවේ පෘෂ්ඨීය දාරය රැලි ආකාරය. පෘෂ්ඨීයව බලන විට ශරීරය තුළින් ඉහත ආකාරයේ පෙනුමක් නොමැත (පලක 16.2). ------------- ---------------------------------------------------- ***Rasbora daniconius***

8. අංශ ඡේඛාවක් නොමැත. රන්වන් රිදී පැහැති පාර්ශික ඉරකි (පලක 14.3)---- ------------------------------------------------- ***Rasboroides atukorali***
අංශ ඡේඛාවක් ඇත, අසම්පූර්ණය. ----------------------------------------9

9. අංශඡේඛාව අසම්පූර්ණය, 3-4 කොරළයේදී නවතී. පූර්ව පෘෂ්ඨීය කොරළ සංඛ්‍යාව 12ක් පමණ වේ. (පලක 14.3).------------***Rasboroides vaterifloris***
අංශ ඡේඛාව අසම්පූර්ණය, 11-18 කොරළයේදී නවතී. පූර්ව පෘෂ්ඨීය කොරළ සංඛ්‍යාව 28-36ක් පමණ වේ.-------------------------------------------10

10. ශරීරය සාපේක්ෂව පළලින් වැඩිය. පූර්ව පෘෂ්ඨීය පෙදෙස තරමක් උස්ව පිහිටයි. හොම්බ සහ ඇසේ විෂ්කම්භය සමානය. පෘෂ්ඨීය පෙදෙස කොළ රිදී මිශ්‍ර වර්ණයකි (පලක 14.1). ---------*Amblypharyngodon grandisquamis*
ශරීරය සාපේක්ෂව පළලින් අඩුය. අංශරේඛාව අසම්පූර්ණය 11-18 කොරළයේදි නවතී (පලක 14.2).---------*Amblypharyngodon melattinus*

## Cyprininae උප කුලයේ මත්ස්‍ය රටාසමයන් හඳුනා ගැනුමට සුබෙදුන් සුචිය (Taxonomic Key to the Species of the subfamily Cyprininae)

1. ගුද වරලේ අවසන් නොබෙදුණු කිරණය අස්ථිභවනය වී, අපර දාරයේ දැති සහිතය. ---------------------------------------------------------------------2
ගුද වරලේ අවසන් නොබෙදුණු කිරණය අස්ථිභවනය වී නොමැත. කලාතුරකින් අස්ථිභවනය වුවද අපර දාරයේ දැති නොමැත. --------------3

2. අංකුට යුගල් දෙකකි (පලක 23.2). ---------------------- *Cyprinus carpio*
අංකුට නොමැත (පලක 22.1). --------------------------*Carassius auratus*

3. හිස සාපේක්ෂව විශාලය. අංකුට නොමැත. අංශ රේඛා කොරළ 40-43 කි. උඩු තොල රහිතය, යටි තොල විශාලය (පලක 23.2). ----------- *Catla catla*
ඉහත ලක්ෂණ නොමැත. ----------------------------------------------------4

4. යටි තොල දෘශ්‍යමාන නොවේ. රෝස්ටල් අංකුටය පමණක් දරයි. අංශ රේඛා කොරළ 40-45 කි. පෘෂ්ඨීය වරල කිරණ 12-13 කි (පලක 23.2). ----------------------------------------------------------------------- *Cirrhinus mrigala*
ඉහත ලක්ෂණ නොමැත. ----------------------------------------------------5

5. අපර ලේබියල් ඇලිය (Post labial groove) සම්පූර්ණය . -------------------6
අපර ලේබියල් ඇලිය අසම්පූර්ණය. ----------------------------------------7

6. අංශ රේඛා කොරළ 40-42 (පලක 22.3). ------------------------------------------------------------------------------*Ctenopharyngodon idella*
අංශ රේඛා කොරළ 23-24 (පලක 21.4).-----------------------*Tor khudree*

7. යටි හනුව කැපුම් දාර සහිතයි. ලේබියල් නෙරුමකින් උඩු තොල වැසී ඇත. මුඛය උප අග්‍රස්ථ හෝ උදරීය වේ.------------------------------------------ 8
ඉහත ලක්ෂණ නොමැත. ----------------------------------------------------11

8. අංකුට යුගල් දෙකකි . -------------------------------------------------9
අංකුට යුගල් එකකි . ---------------------------------------------------10

9. අංශ රේඛාවේ කොරළ 40-42. පෘෂ්ඨීය වරල කිරණ 10-12 කි. පාර්ශ්වික රොස්ටල් නෙරුම් (Lateral rostal fold) සහිතය (පලක 17.2). ------------------------------------------------------------------------ ***Labeo fisheri***
අංශ රේඛාවේ කොරළ 53-60. පෘෂ්ඨීය වරල කිරණ 10-11 කි (පලක 17.1). ------------------------------------------------------------------- ***Labeo dussumieri***

10. අංශ රේඛාවේ කොරළ 39. අංශ රේඛාවේ සිට ශ්‍රෝණි වරලට කොරළ 5 1/2 (පලක 17.3). ------------------------------------------------ ***Labeo lankae***
අංශ රේඛාවේ කොරළ 40-44. අංශ රේඛාවේ සිට ශ්‍රෝණි වරකට කොරළ 6 1/2 (පලක 17.4). ---------------------------------------------***Labeo rohita***

11. ඇස සාපේක්ෂව කුඩාය. හිසෙහි අපර භාගයට වන්නට ඇස් පිහිටයි (පලක 22.4). -----------------------------------------***Hypothalmichthys molitrix***
හිසෙහි සාමාන්‍ය මත්ස්‍ය ආකාරයට ඇස් පිහිටයි. -------------------------- 12

12. අංශ රේඛාව අසම්පූර්ණය. --------------------------------------------13
අංශ රේඛාව සම්පූර්ණය. ------------------------------------------------ 17

13. පෘෂ්ඨීය වරලේ කණ්ඨකයේ අපර දාරය සුමටය. පෘෂ්ඨීය වරල මුලයේ කළු පැහැති ඇල ඉරකි. වලිග වරල ආරම්භයේ දිගටි තිරස් තිතකි. ගුදයට ආසන්නව කුඩා කළු පැහැති තිතකි. (පලක 20.2).--------- ***Puntius vittatus***
පෘෂ්ඨීය වරලේ කණ්ඨකයේ අපර දාරය දැති සහිතය. ඉහත වර්ණ රටාව දැකිය නොහැක.---------------------------------------------------------14

14. අංකුට සහිතය (පලක 20.4). ------------------------------ ***Puntius titteya***
අංකුට රහිතය. ------------------------------------------------------------ 15

15. සිරස් පාර්ශික කළු පැහැති තීරු හෝ ලප සහිතය. ------------------------17
වලිග නටුව ආසන්නයේ සහ පිධානය පිටුපස කළු තිතකි (පලක 20.3).-------
---------------------------------------------------- *Puntius* cf. *ticto*

16. පෘෂ්ඨීය, ශ්‍රෝණි වරල් කළු පැහැයක් ගනී (පලක 19.1). --- *Puntius bandula*
පෘෂ්ඨීය, ශ්‍රෝණි වරල් රතු, කහ පැහැයක් ගනී (පලක 19.2). ----------------
---------------------------------------------------- *Puntius cumingii*

17. පෘෂ්ඨීය වරලේ කණ්ඨකයේ අපර දාරය දැති සහිතය. -------------------- 18
පෘෂ්ඨීය වරලේ කණ්ඨකයේ අපර දාරය සුමටය. --------------------------22

18. අංකුට රහිතය. සිරස් කළු තීරු 3ක් දැකිය හැක (පලක 19.3).---------------
---------------------------------------------- *Puntius nigrofasciatus*
අංකුට සහිතය. ------------------------------------------------------ 19

19. ඇසේ සිට වලිගය තෙක් තිරස් කළු පටියකි (පලක 16.5).-------------------
--------------------------------------------- *Puntius pleurotaenia*
ඉහත ආකාරයේ කළු වර්ණයක් නොමැත. ------------------------------ 20

20. රවුම් හැඩැති කළු ලපයක් වලිග නටුවේ ඇත. පැටවුන්ගේ පෘෂ්ඨීය වරල පටන්ගන්නා ස්ථානයේ දෙපස ශරීරයේ කළු තිත් දෙකකි (පලක 18.3). -------
---------------------------------------------------- *Puntius sarana*
ඕවලාකාර ලපයක් වලිග නටුවේ ඇත. ---------------------------------- 21

21. වලිගයේ ඉහළ සහ පහළ භාගවල මායිම් රතු පැහැතිය. අනෙක් වරල් අවර්ණය. ශරීරයේ තිරස් අතට කළු තිත් පේලි 6-7කි. කැළණි ගංගා ද්‍රෝණියට සීමා වේ (පලක 18.1). -------------------------- *Puntius asoka*
වලිගය සහ අනෙක් වරල් සම්පූර්ණයෙන් තැඹිලි රතු පැහැතිය. ශරීරයේ තිරස් අතට කළු තිත් පේලි 6කි. මහවැලි ගංගා ද්‍රෝණියට සීමා වේ (පලක 18.2). "------------- ------------------------------*Puntius martenstyni*

22. පෘෂ්ඨීය කණ්ඨකය ඉතා දැඩිය. හොම්බ සාපේක්ෂව දිගුය (පලක 18.2). ------
---------------------------------------------------- *Puntius dorsalis*
පෘෂ්ඨීය කණ්ඨකය සුමටය. හොම්බ සාපේක්ෂව කෙටිය. ---------------- 23

23. උරහිස, පෘෂ්ඨීය වරලට වහාම යටින් සහ වලිග නටුවේ සිරස් කළු ලප තුනකි. මහවැලි ගංගා ද්‍රෝණියට සීමා වේ. පිරිමි මසුන්ගේ පෘෂ්ඨීය වරල් කිරණ දික්වී ඇත (පලක 18.2). ---------------------***Puntius srilankensis***
වලිග නටුවේ පමණක් කළු ලපයක් හෝ තිතක් ඇත. ---------------------24

24. වලිග නටුව අසල ගුද වරල මුල ඕවලාකාර කළු ලපයකි. පිරිමි මසුන්ගේ පෘෂ්ඨීය වරල් කිරණ දික්වී ඇත. ඉතා කුඩා මසුන්ගේ ***Puntius srilankensis*** මෙන් පාර්ශික සිරස් ලප 3ක් දැකිය හැක (පලක 18.4). ---------------------
-------------------------------------------------------- ***Puntius singhala***
වලිග නටුව අසල කුඩා තිතක් ගුද වරලට පිටුපසින් දැකිය හැක. ----------25

25. මුඛය ඇසේ පහළ සීමාවට පහළින් පිහිටයි. ------------------------------ 26
මුඛය ඇසේ මධ්‍ය රේඛාවට සමාන්තරව පිහිටයි (පලක 21.1). ---------------
------------------------------------------------------------ ***Puntius chola***

26. පෘෂ්ඨීය වරල සහ වලිගය ආරම්භක ස්ථානයේ කළු තිත් දෙකකි (පලක 20.1). --------------------------------------------***Puntius bimaculatus***
එවැනි පැහැදිලි තිත් දෙකක් දැකිය නොහැක (පලක 20.1). -----------------
-------------------------------------------------- ***Puntius* cf. *amphibius***

# ශ්‍රී ලංකාවේ මිරිදිය මසුන්

පලක 01

**1.1** ***Anguilla bicolour*** **D 220-245; A 200-220; P18**

මඩ ආඳා, කළු ආඳා, කක්කුටු ආඳා, කලපු ආඳා

සර්පයෙකුගේ මෙන් දිගටි සිලින්ඩරාකාර සිරුරකි. පෘෂ්ඨීය සහ ගුද වරල් දිගින් සමානය. මුඛයෙහි කෙළවර (Gape) ඇස සීමාව පසුකර නොයයි. බෝවීම සඳහා මුහුදට ගමන් කරන අතර මුහුදේ බිහිවෙන පැටවුන් නැවත ගංගා ඔස්සේ මිරිදියට පැමිණේ (Catadromus). මාංශභක්ෂක මොවුන් නිශාචරය. පහතරට තෙත් හා වියලි කලාපය පුරා ජලජ පරිසර පද්ධතිවල ව්‍යාප්ත වී ඇත. උපරිම දිග සෙ. මී. 40-50 පමණ වේ.

**1.2** ***Anguilla nebulosa*** **D 250-305; A 220-250; P18**

වයිරන් ආඳා, පොල්මල් ආඳා, කබර ආඳා, කහ ආඳා, පුල්ලි ආඳා, වැලි ආඳා, ගල් ආඳා

පෘෂ්ඨීය වරල ගුද වරලට වඩා දිගින් වැඩිය. එහි ආරම්භය පිධානයේ සිට ගුදයට ඇති දුරින් හරි අඩකින් පටන් ගැනේ. මුඛයේ කෙළවර (Gape) ඇසේ අපර භාගය ඉක්මවා පසුපසට ගමන් ගනී. අනුස්‍රෝතගාමී (Catadromus) අභිජනනයකි. මුහුදු මට්ටමේ සිට දෙවන අඩතැන්න දක්වා ජලජ පරිසරවල වාර්තා වේ. උපරිම දිග සෙ. මී. 120 පමණ වේ.

**1.3** ***Ophisternon bengalense*** **D 0; A 0; P 0; C4**

පොට්ට ආඳා

පූර්ව නාස් විවරය හොම්බ කෙළවර පිහිටයි. අපර විවරය ඇසට ඉහළින් පිහිටයි. ඇස් හිසට සාපේක්ෂව ඉතා කුඩාය. කිරණ 3-4 යුක්ත වලිග වරල පමණක් දැකිය හැක. තෙත් කලාපීය පහතරට වගුරු වලින් වාර්තා වේ. මෑත වාර්තා විරලය. උපරිම දිග සෙ. මී. 50 පමණ වේ.

**1.4** ***Monopterus desilvai*** **D 0; A 0; P 0; C0**

දුඹුරු පොට්ට ආඳා, පොට්ට ආඳා

කිසිදු වරලක් නොපිහිටයි. වලිගය අසල මාංශලමය දාරයක් පමණක් දැකිය හැක. ඇස් ඉතා කුඩාය. මඩ සහිත ජලජ පැලෑටිවලින් ගහන පහතරට වගුරු බිම්වලින් වාර්තා වේ. මෑත වාර්තා විරලය. ශ්‍රී ලංකාවට ආවේණිකය. උපරිම දිග සෙ. මී. 20-26 පමණ වේ.



1.1



1.2



1.3



1.4

පලක 02

**2.1** ***Macrognathus aral*** **D XIII VII 50-54; A IIIII 50-22; P. 22-25; C 15**

බටකොළ තෙලියා

පෘෂ්ඨීය පෙදෙසේ, හිසේ සහ හොම්බ අවට කොරළ රහිතය. පෘෂ්ඨීය, වලිග සහ ගුද වරල් වෙන්ව පිහිටයි. මඩ සහිත නිශ්චල ජලජ පරිසර පද්ධතිවලට ප්‍රිය කරයි. උපරිම දිග සෙ. මී. 25 කි. දුර්ලභය. මෑත වාර්තා නොමැත.

**2.2** ***Mastacembelus armatus*** **D XXXIVXXXVII.69-80; A IIIII. 64-78; P25; C20**

ගං තෙලියා, ඔය තෙලියා

හොම්බ කෙළවර නිරුවත්ය. ගුද වරලේ බොහෝ විට කණ්ඨක 3 කි. ඉන් මධ්‍ය කණ්ඨකය දිගින් වැඩිය. පෘෂ්ඨීය, ගුද සහ වලිග වරල එකට සම්බන්ධ වී ඇත. ගල් වැල් සහිත දොල පහරවලට ප්‍රිය කරයි. ජලජ පැලෑටි සහිත වැව්වලින් ද වාර්තා වේ. උපරිම දිග සෙ. මී. 60-75 කි.

**2.3** ***Zenarchopterus dispar*** **D 11-12; A 11-12; P 1.9; V 1.5**

මොරැල්ලා

සිහින් දිගටි සිරුරකි. උඩ හණුව කෙටිවන අතර යටි හණුව දිගුය. පෘෂ්ඨීය සහ ගුද වරල් ශරීරයේ අපරභාගයට වන්නට පිහිටා ඇත. පිරිමි සතුන්ගේ ගුදවරල් කොටස් 3 ක් ලෙස දිස්වේ. ජල පෘෂ්ඨයට ආසන්නව පිහිනා යයි. නොගැඹුරු ජලාශවලින් වාර්තා වේ. ස්වභාවයෙන් කිවුල්දිය වාසීන්ය. උපරිම දිග සෙ. මී. 15 කි.

**2.4** ***Xenentodon cancila*** **D II-I.15-14; A II.15; P 10, C 15; V I.5, LL 250**

යොනා

හනු යුගල දිගුය. යටි හනුවේ දත් ඉහළ හනුවේ දත් අතරින් පිටතට විහිදේ. වලිග වරල චතුරස්‍රාකාරය. පෘෂ්ඨීය සහ ගුදවරල් ශරීරයේ අපර භාගයට ආසන්නව පිහිටයි. සෙමෙන් ගලායන ඇල දොලවල ජල තටාකවල පෘෂ්ඨයට ආසන්නව කුඩා රංචු ලෙස පිහිනා යයි. උපරිම දිග සෙ. මී. 30 කි.

**2.5** ***Hyporhamphus limbatus*** **D 12-16; A 13-16; P I.10-11, V I. 5**

මොරැල්ලා

කලපු සහ ගංගා මෝය ආශ්‍රිතව ජීවත් වන අතර මිරිදියටද පැමිණේ. යටි හනුවේ කෙළවර රතු පැහැයකි. වලිග වරල පහළ භාගය තරමක් දිගින් වැඩිය.



2.1



2.2



2.3



2.4



2.5

පලක 03

**3.1** ***Clarias brachysoma*** **D 70; A 53-60; P I.8; V 6; C 21**

මගුරා, වෙල් මගුරා. කහ මගුරා

අංකුට යුගල් 4 කි. පෘෂ්ඨීය සහ ගුදවරල් දිගුය. ලයවරලේ තියුණු කණ්ඨකයකි. කහ කොළ වර්ණයේ සිට දුඹුරු කොළ වර්ණය දක්වාත්, තද කහ දුඹුරු වර්ණ රටාවන්ගෙන් ද යුක්තය. තෙත් හා වියලි සියලු ජලජ පරිසර පද්ධතිවලින් වාර්තා වේ. මාංශභක්ෂකය. ශ්‍රී ලංකාවට ආවේණිකය. උපරිම දිග සෙ. මී. 50 දක්වා වර්ධනය වේ.

**3.2** ***Heteropneustes fossilis*** **D 7-8; A 67-78; P I.7; V 6; C 17-23**

හුංගා, කහ හුංගා, ලේ හුංගා

අංකුට යුගල් 4 කි. පෘෂ්ඨීය වරල කෙටිය. ගුද වරල දිගුය. ලය වරලේ තියුණු කණ්ඨකයකි. ගුද සහ වලිග වරල සම්බන්ධවූ නිදර්ශකද වාර්තා වේ. පැටවුන් තද රතු දුඹුරු පැහැයකි. ක්‍රමයෙන් වැඩෙත්ම තද දුඹුරු කළු වර්ණයකට හැරේ. වගුරු සහිත පරිසර පද්ධතිවලට ප්‍රිය කරයි. දිවයින පුරා ව්‍යාප්තවී ඇත. උපරිම දිග සෙ. මී. 20-30 කි.

**3.3** ***Wallago attu*** **D 1.4; A 79-81; P I.13-14; V 10; C 18**

වලයා, මහ වලයා

අංකුට යුගල් දෙකකි. කෙටි පෘෂ්ඨීය වරලකි. ලය වරලේ කණ්ඨක නොමැත. ගුද වරල දිගුය, මුඛයේ කෙළවර (Gape) ඇසේ අපර සීමාව පසුකර යයි. මාංශ භක්ෂකය, ගැඹුරු ජල තටාක සහිත ගංගා සහ වැව්වලින් වාර්තා වේ. උපරිම දිග සෙ. මී. 80 කි.

**3.4** ***Ompok bimaculatus*** **D 1.3; A 61-66; P I.12-15; V 6-8; C 18**

වලපොත්තා, පෙනවලයා, කොකැස්සා

ලය වරල් සුනම්‍යය, ගුද වරල දිගුය. පෘෂ්ඨීය වරල කෙටිය. මුඛයේ කෙළවර ඇසේ අපර භාගය පසුකර ගමන් නොගනී. කුඩා පැටවුන් විනිවිද පෙනේ. දිවයින පුරා පහත රට වැව් අමුණු ගංගා ආදියෙන් වාර්තා වේ. උපරිම දිග සෙ.මී. 40 කි.

**3.5** ***Chitala ornata*** **D 9-10; A+C 110-135; V 6**

මන්නයා

ශරීරය දර්ශීය මන්නයක හෝ පිහි තලයක හැඩයකි. ගුද සහ වලිග වරල් සම්බන්ධවී ඇත. ශරීරයේ පාර්ශිකව තිත් හෝ ලප (6-8) පේලියක් ගුදවරලට මායිම්ව දිවේ. විසිතුරු මත්ස්‍ය කර්මාන්තය යටතේ ශ්‍රී ලංකාවට ගෙනෙනු ලැබ ස්වභාවික පරිසරයට නිදහස් වී ඇත. මාංශභක්ෂක බැවින් දේශීය මසුන්ට තර්ජනයක් ලෙස සැලකේ. උපරිම දිග සෙ.මී. 100 වේ.



3.1



3.2



3.3



3.4



3.5

පලක 04

4.1 *Mystus gulio* **D II.6-7; A 3-4.10-12; P I.7-9; V 6; C 17**

අඟුළුවා, මාන අංකුට්ටා

අංකුට යුගල් හතරකි. ලයවරලේ සහ පෘෂ්ඨීය වරලේ සවිමත් ඛණ්ඨකයකි. පෘෂ්ඨීය වරල ත්‍රිකෝණාකාර හැඩයකි. එහි කණ්ඨකය වරල කෙළවර තෙක් නොයයි. වලිගය දෙබල්වී ඇත. ඉහළ භාගය තරමක් දිගුය. පෘෂ්ඨීය ඇඩිපස් (Adipose fin) වරල සාපෙක්‍ෂව කුඩාය. පහත රට තෙත් සහ වියලි කලාපයෙන් වාර්තාවේ. උපරිම දිග සෙ.මී. 15 කි.

4.2 *Mystus cavasius* **D I.6-7; A IV.6-9; P I.6-10; V I.5; C 17**

පත් අංකුට්ටා

අංකුට යුගල් හතරකි. පෘෂ්ඨීය සහ ලයවරලේ දැඩි කණ්ඨක ඇත. පෘෂ්ඨීය වරල ත්‍රිකෝණාකාර අග්‍රය ඉතා දිගුය. පෘෂ්ඨීය වරල ආරම්භයේ ශරීරයේ කළු තිතකි. වලිග වරල දෙබල්ය. ඉහළ භාගය සාපෙක්ෂව දිගින් වැඩිය. ඇඩිපස් වරල පෘෂ්ඨීය වරල අසලින් පටන් ගෙන වලිග නටුව දක්වා දිවේ. පහත රට තෙත් සහ වියලි කලාපයේ වැව් සහ වගුරු ආශ්‍රිතව වාර්තාවේ. උපරිම දිග සෙ.මී. 18 කි.

**4.3** *Mystus vittatus* **D II.7-8; A 2-3.7-8; P I.8; V 6; C 17-18**

ඉරි අංකුට්ටා, හිරි අංකුට්ටා

අංකුට යුගල් හතරකි. ලය වරලේ සහ පෘෂ්ඨීය වරලේ දැඩි කණ්ඨක දැකිය හැක. පෘෂ්ඨීය වරල රවුම් හැඩයකි. එහි ඛණ්ඨකය දිගින් අඩුය. ඇඩිපස් වරල සිහින් දිගටි වන අතර අපර භාගයට වන්නට විශාලය. පාර්ශ්විකව දුඹුරු පැහැති රේඛා 3-4 ඇත. වලිග නටුවේ කළු තිතකි. මෙවැනි ලපයක් පිධානය පිටුපසින්ද සමහර විට දැකිය හැක. පහත රට තෙත් සහ වියලි කලාපයෙන් වාර්තාවේ. උපරිම දිග සෙ.මී. 10 කි.

4.4 ***Pterygoplichthys multiradiatus*** **D 1.7-7; A 1.3-5; P I.6-6; V I.5-6**

ස්කැවෙන්ජර්

ඇඩිපස් වරලක් ඇත. ශරීරය පෘෂ්ඨ උදරියව පැතලි ස්වභාවයකි. හිසේ පෘෂ්ඨීයව සහ ශරීරයේ තීරු ලෙස විශාලව තැනුණ කොරළ ඇත. හිසේ උදරිය පෙදෙස සහ උදරයේ එවැනි විකරණයවූ කොරළ නොමැත. මුඛය උදරියව උලාකෑමට සැකසී ඇත. දකුණු ඇමරිකාව නිජබිම වේ. විසිතුරු මත්ස්‍යයකු ලෙස හඳුන්වා දුන් රටාසමයකි. කොළඹ සහ මහනුවර ප්‍රදේශවලින් වාර්තා වේ. උපරිම දිග සෙ. 50 පමණ ආසන්නවේ.



4.1



4.2



4.3



4.4

පලක 05

5.1 ***Acanthocobitis urophthalmus*** **D IV.10; A II.5; P 1.11; V 7; C 18; LL 16-18**
වයිරන් අහිරාවා, පොල් අහිරාවා
අංකුට යුගල් 3 කි. සිලින්ඩරාකාර ශරීරයේ වලිග නටුව අපහැදිලිය. පෘෂ්ඨීයව වලිගය ආසන්නයේ ඇඩිපස් දාරයක් පිහිටයි. තද වර්ණයෙන් යුත් සිරස් තීරු 15 ක් පමණ දැකිය හැක. වලිග නටුවේ පෘෂ්ඨීය කෙළවරේ කළු තිතකි. හොම්බ කෙලවර සිට ඇස දක්වා කළු පැහැ ඉරකි. පහතරට තෙත් කලාපයේ සෙවණ සහිත සෙමෙන් ගලායන පිරිසිදු දොල පහරවල ව්‍යාප්ත වේ. උපරිම දිග සෙ.මී. 4-5 කි. ශ්‍රී ලංකාවට ආවේණිකය.

5.2 ***Schistura notostigma*** **D III.7; A II.5; P 1.10; V 1.6; C 16-18**
කඳු අහිරාවා, පොල් අහිරාවා, ගෝමර අහිරාවා
අංකුට යුගල් 3 කි. ඇඩිපස් තීරුවක් පෘෂ්ඨීයව සහ උදරීයව වලිගය තෙක් පිහිටයි. වලිගයේ ඉහළ භාගය තරමක් විශාලය. පැටවුන්ගේ අංශරේඛාව ඔස්සේ විශාල පුල්ලි පිහිටයි. වැඩෙත්ම සිරස් පටි (13-14) ආකාරයක් ගනී. වලිග නටුවේ සිරස් කළු ඉරකි. තෙත් කලාපයේ පිරිසිදු දිය පහරවල කඳුකරය දක්වා ව්‍යාප්ත වේ. උපරිම දිග සෙ.මී. 6 කි. ශ්‍රී ලංකාවට ආවේණිකය.

5.3 ***Lepidocephalichthys jonklaasi***
පුල්ලි අහිරාවා
අංකුට යුගල් 4 කි. තද වර්ණයෙන් යුත් පැල්ලම් හෝ පුල්ලි වලින් ගැවසී ඇත. ඇසේ සිට මුඛය දක්වා කළු පැහැ ඉරකි. වලිග නටුවේ පෘෂ්ඨීයව වන්නට කළු තිතකි. කොළරොඩු සහිත සෙමෙන් ගලන පහතරට දිය පහරවලට ප්‍රිය කරයි. උපරිම දිග සෙ.මී. 6 කි. ශ්‍රී ලංකාවට ආවේණික තරමක් දුර්ලභ රටාසමයෙකි.

5.4 ***Lepidocephalichthys thermalis*** **D II-III.6; A II-III.5; P 1.6-7; V 1.6; C 16**
අහිරාවා, වෛරන් අහිරාවා
අංකුට යුගල් 4 කි. වලිග වරලට ආසන්නව පෘෂ්ඨීයව ඇඩිපස් තීරුවක් දැකිය හැක. වලිග නටුවේ ඉහළ කෙළවර කළු තිතකි. ඇසේ සිට Rostal අංකුටය තෙක් කළු ඉරකි. පාර්ශිකව තරමක් විශාල පැල්ලම් 10 පමණ ඇත. වැලි සහිත සෙමෙන් ගලා යන දිය පහරවල පහතරට පුරා වාර්තා වේ. උපරිම දිග සෙ.මී. 5 කි.



5.1



5.2



5.3



5.4

පලක 06

6.1 *Awaous melanocephalus* **D VIII.10; A I.10-11; P I.14-16**

බලි වැලිගොව්වා

කොළ දුඹුරු පැහැ සිරුර පුරා අපිළිවෙළට විහිදුණා ඉරි සහ තිත් රැසකි. ඇසේ සිට ඉහළ හනුව තෙක් කළු පැහැ ඉරි දෙකකි. පෘෂ්ඨීය වරල් මායිම රතු පැහැතිය. ගුද වරලේ මායිම සුදු තීරුවකි. උදරයේ කොරළ රහිතය. පහතරට ජලජ පරිසර පද්ධතිවල වාර්තා වේ. උපරිම දිග සෙ.මී. 12-15 කි.

6.2 *Glossogobius giuris* **D. VI-I.8-9; A I.7-8; P I.16-21; LL 28-36**

මහ වැලිගොව්වා , බලි වැලිගෙම්බා

පෘෂ්ඨ උදරීය පැතලි සිරුරේ ඇස් පෘෂ්ඨීයට පිහිටයි. පළමු පෘෂ්ඨීය වරල රවුම් හැඩයකි. ලය වරල් විශාලය රවුම් හැඩයකි. හිසේ කළු ලප කිහිපයකි. පාර්ශ්විකව කළු ලප දෙපේළියකි. පහතරට ජලජ පරිසර පද්ධතිවල වාර්තා වේ. උපරිම දිග සෙ.මී. 20 පමණ වේ.

6.3 *Oligolepis acutipennis* **D VI-I.10-11; A I.10-11; P I.19-21**

වැලි ගොව්වා

පිරිමි මසුන්ගේ පළමු පෘෂ්ඨීය වරලේ 3-5 කිරණ දික්වී ඇත. ශරීරයේ කොරළ සාපේක්ෂව විශාලය. කළපු සහ ගංගා මෝය ආශ්‍රිත මිරිදියේ වාර්තා වේ. උපරිම දිග සෙ.මී 15 කි.

6.4 *Stenogobius malabaricus* **D VI-I.10; A I.10; P I.15**

වැලි ගොව්වා

ශරීරයේ කොරළ සාපේක්ෂකව කුඩාය. පූර්ව පෘෂ්ඨීය කොරළ 8 කි. ඇසේ සිට මුඛය දක්වා <" හැඩැති සළකුණකි. පළමු පෘෂ්ඨීය වරලේ කළු පැහැ අර්ධ කවාකාර සළකුණකි. සිරුරේ සිරස් ඉරි 5 පමණ දැකිය හැක. කලපු සහ ගංගා මෝය ආසන්න මිරිදියේ වාර්තා වේ. උපරිම දිග සෙ.මී 9 කි.

6.5 *Schismatogobius deraniyagalai* **$D_1$ VI; $D_2$ I.9-10; A 1.9; P 14-15; V 15**

කට රතු වැලිගොව්වා

සිරුර කොරළ රහිතය. වලිග වරල ආරම්භයේ කළු තිතකි. පිරිමි මසුන්ගේ කොපුල්වල දීප්තිමත් තැඹිලි පැහැයකි. මුඛය ඇතුළත රතු පැහැයකි. මුඛය ඇසේ අපර සීමාව පසුකර යයි. ගැහැණු මසුන්ගේ මුඛය ඇසේ සීමාව දක්වා පිහිටයි. ගෙල කෙටිය. තෙත් කළාපයට සීමා වේ. මෑතදී ඉන්දියාවෙන්ද වාර්තා වී ඇත. උපරිම දිග සෙ.මී. 4-5 කි.



6.1



6.2



6.3



6.4



6.5

ඵලක 07

7.1 *Sicyopterus griseus* $D_1$ VI; $D_2$ I.10; P I.16

මහ ගල් වැලිගොව්වා

දුඹුරු පැහැ සිරුරකි. පාර්ශ්විකව කළු ලප 6-7 කි. දෙවන පෘෂ්ඨීය වරල ප්‍රදේශයේ කළු ලප තුනකි. පළමු පෘෂ්ඨීය වරල සිහින් සහ දිගටිය. දෙවන පෘෂ්ඨීය වරල අපර කෙළවර සිහින් සහ දිගටිය. එහි දුඹුරු තිත් දැකිය හැක. වරල් අග කහ සුදු පැහැයකි. තෙත් කලාපයේ දොළ පහරවලින් පමණක් වාර්තා වී ඇත. උපරිම දිග සෙ.මී. 10 කි.

7.2 *Sicyopterus halei* $D_1$ VI; $D_2$ 12; A 11; P 19; V I.5; C 14; LL57

ගල් වැලිගොව්වා

පෘෂ්ඨීය තද කොළ පැහැතිය. පාර්ශ්වික පෙදෙස ලා වර්ණයකි. ශ්‍රෝණිවරල් රෝස පැහැතිය. පිරිමි මසුන්ගේ වලිග වරල දීප්තිමත් රතු තැඹිලි පැහැයකි. මායිම ලා නිල් හෝ කොළ පැහැතිය. සිරුරේ තද වර්ණයෙන් යුත් සලකුණු කීපයකි. ගැහැණු සතුන්ගේ වලිග වරල ලා දුඹුරු පැහැයකි. මායිම තද පැහැයකි. තෙත් කලාපීය දොල පහරවලින් වාර්තා වී ඇත. උපරිම දිග සෙ.මී. 8 කි.

7.3 *Sicyopus jonklaasi* $D_1$ VVI; $D_2$ I.9; A I.9; P 14-16

තොල් රතු වැලිගොව්වා

දිගටි සහ උප සිලින්ඩරාකාර සිරුර කොරළවලින් වැසී ඇත. ඇස් පාර්ශ්විකව පිහිටන අතර හිසේ පෘෂ්ඨීයව පිහිටයි. ඝන තොල් සගලකි. පිරිමි මසුන්ගේ රතු පැහැයකි. පිරිමි මසුන්ගේ වලිග නටුවේ ත්‍රිකෝණාකාර රතු පැල්ලමකි. දේහයේ කහ පැහැති අල්ලි හෝ දාර පවති. ගැහැණු මසුන්ගේ තොල් කළු පැහැයකි. ගල්පර සහිත වේගයෙන් ගලායන තෙත් කලාපීය දොල පහරවලින් වාර්තා වේ. උපරිම දිග සෙ.මී. 5 කි. ශ්‍රී ලංකාවට ආවේණිකය.

7.4 *Stiphodon martenstyni* $D_1$ VII; $D_2$ 9; A I.10; P 15; C 14; LL34

වැලි ගොව්වා

1981 දී අත්වැල්තොට ප්‍රදේශයෙන් හමුවූ නිදර්ශකයකින් 1998 දී ප්‍රකාශයට පත්කරන ලදී. ජීවී මසුන් දීප්තිමත් නිල් පැහැති බව කියවේ. උපරිම දිග සෙ.මී. 5 කි. දන්නා තොරතුරු අල්පය. ශ්‍රී ලංකාවට ආවේණිකය.



7.1



7.2



7.3



7.4

පලක 08

8.1 ***Garra ceylonensis*** **D III.8-9; A II.5; P 1.9-12; V 1.8; C 19; LL 32-34**

ගල් පාඩුරුවා, ගල් පාඬියා

අංකුට යුගල් 2 කි. පෘෂ්ඨීය පෙදෙස දුඹුරු කළු පැහැතිය පාර්ශික පෙදෙස ලා පැහැයකි. බඩවත සුදු පැහැයකි. මුඛ විවරය කවාකාරය. උඩු තොලෙහි මධ්‍ය රෝස්ටල් ඇලියකි. යටි හණුවේ තොල චූෂකරයක් බවට පත්ව ඇත. තද වර්ණයෙන් යුත් පාර්ශික රේඛාවක් දැකිය හැකි අතර ගෙල අසලදී පෘෂ්ඨීයව එම රේඛා සම්බන්ධවේ. වේගයෙන් ගලායන දොල පහරවල වාර්තා වේ. උපරිම දිග සෙ.මී. 8-15 කි. ශ්‍රී ලංකාවට ආවේණිකය.

8.2 ***Garra* cf. *phillipsi***

ගල් පාඩුරුවා, ගල් පාඬියා

හිසේ පාර්ශික පෙනුම ත්‍රිකෝණාකාරය. මුඛ විවරය තිරස් ආකාරයකි. වක්‍රව නොමැත. උඩු තොලෙහි රෝස්ටල් නැම්මේ මධ්‍ය රෝස්ටල් ඇළියක් නැත. උදරීය කොරළ විශාලය පෘෂ්ඨීය වරල හිසේ දිග මෙන් 1.5 පටන් ගනී. වර්ණ රටාව අතින් *Garra ceylonensis* ට සමානය. ස.දි.සෙ.මී. 10 කි. ශ්‍රී ලංකාවට ආවේණිකය. පෙතියාගොඩ මහතා (2006) ලැයිස්තුවෙන් මෙම රටා සමයා ඉවත්කර ඇත. ඒ වෙනුවට *Garra* ගණයට අයත් නව රටාසමයෙකු බව සඳහන් කරයි.

8.3 ***Butis butis*** **$D_1$ IV; $D_2$ I.8; A I.8; P 18-20; V 1.5**

උඩුප්පුවා, වනියා

පෘෂ්ඨීය පෙදෙස ලා දුඹුරු පැහැයේ සිට කොළ පැහැයක් ගනී. මුඛයේ සිට වලිග නටුව තෙක් පළල් තිරස් තද වර්ණයෙන් යුක්ත පටියකි. පළමු පෘෂ්ඨීය වරල කෙළවර රතු පැහැයකි. ශ්‍රෝණි වරල් වෙන්ව පිහිටයි. කිවුල් දියේ සහ ඒ ආසන්න පිරිසිදු මිරිදිය පරිසර පද්ධතිවල වාර්තා වේ. උපරිම දිග සෙ.මී. 12-15 කි.

8.4 ***Eleotris fusca*** **$D_1$ IV; $D_2$ I.8-9; A I.8; P 15-18; V 1.5**

පුවක්බඩිල්ලා

සිරුර දුඹුරු පැහැතිය. අක්‍රමවත් ලා වර්ණයෙන් යුත් රටා දැකිය හැක. පෘෂ්ඨීය පෙදෙස ලා දුඹුරු වර්ණයකි. මුඛයේ කෙළවර ඇසේ අපර භාගය පසුකර ගමන් ගනී. කිවුල් දිය වාසීන්ය. පිරිසිදු මිරිදිය පරිසර පද්ධතිවලින්ද වාර්තා වේ. උපරිම දිග සෙ.මී. 5-8 කි.



8.1



8.1



8.2



8.3



8.4

පලක 09

9.1 ***Channa ara*** **D 48-51; A 32; P 16-18; C 15; LL 16-21.2.40-44**

ආරා, කළු මහ, ගංගරා, ගංආරා, කළු ආරා

උප සිලින්ඩරාකාර දිගටි සිරුරකි. පෘෂ්ඨීය දම් පැහැති පාර්ශික තීරු රේඛා 6 ක් පමණ ඇත. සෙ.මී. 5 පමණ දිග පැටවුන්ගේ අංශරේඛාව ඔස්සේ කහ පැහැති රේඛාවකි. වලිග වරල ආරම්භයේ කළු ලපයකි. ශ්‍රී ලංකාවට ආවේණිකය. තෙත් සහ වියලි කලාපයේ ගැඹුරු තටාක සහිත ඇල දොල ගංගා සහ ජලාශවල වාර්තාවේ. උපරිම දිග සෙ.මී. 80-100 කි.

9.2 ***Channa gachua*** **D 31-35; A 20-23; P 14-15; V 6; C 13-14; LL 10-12.1.28-32**

පරඬැල් කනයා, කණයා

ශ්‍රෝණිවරල සාපේක්ෂව කුඩාය. සෙ.මී. 1 වඩා කුඩා පැටවුන් අඳුරු තැඹිලි පැහැයකි. තෙත් සහ වියලි කලාපය පුරා ව්‍යාප්ත වී ඇත. උපරිම දිග සෙ.මී. 15-20 කි.

9.3 ***Channa orientalis*** **D 31-34; A 20-22; P 13-15; V 0; C 13-15; LL 9-12.1.27-30**

කොළ කනයා, ගස් කනයා

ශ්‍රෝණිවරල නොපිහිටයි. ගැහැණු මසුන්ගේ සහ පැටවුන්ගේ පෘෂ්ඨීය වරල අපර කෙළවරේ කළු තිතක් දැකිය හැක. තෙත් කලාපයේ ජලජ පරිසර පද්ධතිවල වාර්තාවේ. උපරිම දිග සෙ.මී. 10 කි. ශ්‍රී ලංකාවට ආවේණිකය.

9.4 ***Channa punctata*** **D 29-30; A 20-22; P 15-18; V 6; C 13; LL 13-15.1.21.24**

මඩ කනයා, මඩ ආරා, මඩකරියා

පැටවුන්ගේ අඳුරු පැහැ සිරුරේ දීප්තිමත් කහ පැහැති තිරස් ඉරි සහිතය. පෘෂ්ඨීය පෙදෙසේ සිට අංශ රේඛාව තෙක් තද පැහැ සිරස් පළල් තීරු 10 පමණ ඇත. වරල්වල නිල් පැහැ තීරු ඇත. පෘෂ්ඨීය සහ ගුද වරල් මායිම් සුදු පැහැතිය. තෙත් සහ වියලි කලාපය පුරා වාර්තා වේ. උපරිම දිග සෙ.මී. 15-20 කි.

9.5 ***Channa striata*** **D 42-46; A 25-28; P 15-17; V 6; C 15; LL 15-18.2-3.39-42**

ලූලා, හල්පත් මහ

පැටවුන් (සෙ.මී. 2.5) දීප්තිමත් රත් පැහැයකි. වැඩෙත්ම කළු සුදු පැහැයක් ගනී. ජලජ පැලෑටි සහිත තෙත් සහ වියලි කලාපීය ජලාශ සහ වගුරු බිම්වල වාර්තා වේ. උපරිම දිග සෙ.මී. 40-70 කි.



9.1



9.2



9.3



9.4



9.5

පලක 10

10.1 ***Aplocheilus dayi*** **D 3.4; A 3.10; P 2.14; V 2.4; C 16-19; LL 32-33**

උඩ හඳයා

හිසෙහි කහ පැහැයට හුරු සුදු ලපයකි. පිරිමි මසුන්ගේ පාර්ශ්විකව කළු තිත් තුනක් ත්‍රිකෝණාකාරව පිහිටයි. ගැහැණු මසුන්ගේ පාර්ශ්විකව සිරස් කළු තීරු 6-7 සිරුරේ අපරභාගයට වන්න ගුද වරලට ඉහළින් පිහිටයි. තෙත් කලාපයේ කැළණි සහ කළු ගංගා ද්‍රෝණිවල සුලභය. ශ්‍රී ලංකාවට ආවේණිකය. උපරිම දිග සෙ.මී. 5 කි.

10.2 ***Aplocheilus parvus*** **D 3.4; A 4.10; P 1.12; V 2.4; C 16; LL 27-29**

කලපු හඳයා, උඩහඳයා

හිසෙහි කහ පැහැයට හුරු සුදු ලපයකි. තනි වරල් මත කොළ සහ රතු තිත් පවතී. පෘෂ්ඨීය වරල මූලයේ කළු ලපයකි. තෙත් සහ වියලි කලාපයේ වෙරළබඩ මිරිදිය ජලජ පරිසර පද්ධතිවල වාර්තාවේ. උපරිම දිග සෙ.මී. 2-4 කි.

10.3 ***Aplocheilus werneri*** **D 7; A 15-16; P 15; V 5; C 10-11**

ඉරිහඳයා

හිසෙහි කහ පැහැයට හුරු සුදු ලපයකි. *A. dayi* වඩාත් සමානය නමුත් පිරිමි සහ ගැහැණු මසුන්ගේ කළු සිරස් ඉරි දැකිය හැක. පිරිමි මසුන්ගේ මෙම ඉරි ගුදවරල දක්වා දික්වෙන අතර ගැහැණු මසුන්ගේ උදරියව සියලු තීරු එකතු වී කළු පැල්ලමක් සේ දිස්වේ. නිල්වලා සහ ගිං ගංගා ද්‍රෝණිවලට සීමාවේ. උපරිම දිග සෙ.මී. 6-9 කි. ශ්‍රී ලංකාවට ආවේණිකය.

10.4 ***Oryzias* cf. *melastigma***

හංදි තිත්තයා

මෙතෙක් ශ්‍රී ලංකාවෙන් හමුවන රටාසමයා ඉහත *O. melastigmus* විදු නමින් හැඳින්විණ. නමුත් පෙතියගොඩ මහතාට (2006) අනුව ශ්‍රී ලංකාවෙන් හමුවූ ගහනය මෙතෙක් හඳුනානොගත් රටාසමයන් දෙදෙනෙකුට අයත්ය. පෘෂ්ඨීය පෙදෙස නිල් කොළ පැහැයකි. උදරිය පෙදෙස සුදු පැහැතිය. ඇස වටා දිප්තිමත් ලා නිල්පැහැයකි. හිසේ සුදු පැහැ ලපයකි. සමස්තයක් ලෙස පාර්ශ්වික සිරුර විනිවිද පෙනෙන ස්වභාවයකි. උපරිම දිග සෙ.මී. 3 කි. පෙතියාගොඩ මහතාට අනුව (2006) නව රටාසමයන් දෙදෙනාම ශ්‍රී ලංකාවට ආවේණික විය යුතුය. පහත රට කලපු සහ මෝය ආශ්‍රිත මිරිදිය පරිසරවල වාර්තා වේ.


පිරිමි
ගැහැනු
පිරිමි
10.2
ගැහැනු
පිරිමි
ගැහැනු

පලක 11

11.1 ***Etroplus maculatus*** **D XVII-XX.8-10; A XII-XV.8-9; P I.15-16; V I.5; LL35**

කහ කොරලියා, රල්ලියා, රන් කොරලියා

පාර්ශිකව දුඹුරු කහ පැහැති අතර පෘෂ්ඨීය පෙදෙස අඳුරු පැහැයකි. කුඩා රතු තිරස් තිත් පේලි ඇත. පෘෂ්ඨීය භාගයට වන්න කළු ලප 1-5 අතර ප්‍රමාණයකි. මින් ලප 3 ක් පැහැදිලිය. මධ්‍ය ලපය ප්‍රමාණයෙන් දෙපස ලපවලට වඩා විශාලය. ඇසේ පහළ භාගය වටා නිල් පැහැයකි. ගැහැණු මසුන්ගේ වලිග වරලේ මායිමේ ලා නිල් පැහැති තීරුවකි. පහතරට තෙත් සහ වියලි කලාපය පුරා වාර්තා වේ. උපරිම දිග සෙ.මී. 7 කි.

11.2 ***Etroplus suratensis*** **D XVIII-XIX.14-15; A XII-XIII.11-12; P I.16; V I.5; LL35**

කොරලියා, මල් කොරලියා

අළු කොළ පැහැයකි. පෘෂ්ඨීය පෙදෙස අඳුරු පැහැයකි. ශරීරයේ සිරස් ඇල තීරු 6-8 කි. ලය වරල මුලයේ කළු තිතකි. සිරුරේ පෘෂ්ඨීය භාගයේ කොරළුවල දිස්නය සහිත දීප්තිමත් තිත් පිහිටයි. උදරිය වන්නට කළු තිත් පිහිටයි. තෙත් සහ වියලි කලාපීය කිවුල් දිය සහ මිරිදිය පරිසර පද්ධතිවල දැකිය හැක. උපරිම දිග සෙ.මී. 20 කි.

11.3 ***Anabas testudineus*** **D XV-XVIII 9-10; A IX-XI 9-11; P 15-16; V 1.5; LL 15-19.10-15**

කාවයියා, පොල් කාවයියා

පිධාන ද්වාරයේ ඇසට ඉදිරියෙන් අන්තර් පිධාන, උප පිධාන ද්වාරයන් දැති සහිතය. ශ්‍රෝණි වරලේ වරලට තරමක් දිගින් වැඩි කණ්ටකයක් පිහිටයි. පෘෂ්ඨීය පෙදෙස තද කොළ පැහැයකි. පාර්ශික පැහැය කොළ කහ සිට තැඹිලි පැහැය දක්වා වෙනස්වේ. පිධානයට පිටුපසින් සහ වලිග නටුව අසල කළු තිතකි. වයසට යත්ම මෙය මැකීයයි. තෙත් සහ වියලි කලාපය පුරා වාර්තා වේ. උපරිම දිග සෙ.මී. 15 කි.

11.4 ***Helostoma temminckii*** **D XVI-XVIII.13-16; A XIII-XV.17-19; P 10; V 1.5**

හාදු ගුරාමි

පෘෂ්ඨීය පැහැය ලා දුඹුරු කොළ වර්ණයකි. පාර්ශිකව ලා කොළ රිදී පැහැයක් ගනී. තිරස් අතට ලා පැහැති ඉරි පිහිටයි. වැඩිහිටි ගැහැණු සතුන් මහතින් වැඩිය. 1951 දී තායිලන්තයෙන් ගෙනෙන ලදුව ශ්‍රී ලංකාවට හඳුන්වාදෙන ලදී. කොළඹ අවට වගුරු භූමිවලින් වාර්තා වේ. උපරිම දිග සෙ.මී. 10-20 කි.


11.1


11.2


11.3


11.4

ඵලක 12

12.1 ***Belontia signata*** **DXVI-XVII.8-10;AXIV-XVI.10-12;P10-12;V1.5;LL10-15.2.13-16**
තල්කොස්සා, පුලුට්ටා, කොල මොදා
ශ්‍රෝණි වරලේ දික්වූ කිරණ යුගල් දෙකකි. වලිග වරලේ දික්වූ කිරණ දැකිය හැක. ගුද වරලේ 5-6 කිරණ ද, පෘෂ්ඨීය වරලේ 3-4 කිරණද, දික්වී ඇත. තෙත් කලාපීය ගංගා සහ මහවැලි ද්‍රෝණිවලින් වාර්තා වේ. වියලි කලාපයේ ද විරල වාර්තා ඇත. ශ්‍රී ලංකාවට ආවේණිකය. උපරිම දිග සෙ.මී. 18 කි.

12.2 ***Malpulutta kretseri*** **D VIII-X.6; A XVI-XVII.9-11; P 12; C 15; LL 29-30**
මල් පුලුට්ටා
ඇස සාපේක්ෂව විශාලය. වලිග වරලේ මධ්‍ය කිරණ 2 ක් දික්වී ඇත. ශ්‍රෝණි වරල උදරවරලේ සහ පෘෂ්ඨීය වරලේ කෙළවර කිරණ 2 ක් දික්වී ඇත. පෘෂ්ඨීය සහ ගුද වරලේ පාදය කොරළවලින් වැසී ඇත. තෙත් කලාපයට සීමාවී ඇත. වියලි කලාපයේ ස්ථාන කීපයකින් පැරණි වාර්තා ඇත. ශ්‍රී ලංකාවට ආවේණිකය. වර්තමානයේ දුර්ලභය. උපරිම දිග සෙ.මී. 4 කි.

12.3 ***Pseudosphromenus cupanus*** **DXIII-XV.5-7;AXVII-XX.10-13;P11;LL9-13.17-20**
පුලුට්ටා, තල් කොස්සා, තල් කඩයා
ශ්‍රෝණි වරලේ දික්වූ කිරණයකි. වලිග වරලේ මධ්‍ය කිරණයක් දිගුය. වලිග නටුව අසල තද කළු මිශ්‍ර දුඹුරු පැහැ තිතකි. පෘෂ්ඨීය වරලේ තිත් පේලි 8-9 කි. ගුද වරලේ පේලි 2-3 කි. ගැහැණු සතුන් අඳුරු පැහැයකි. තෙත් සහ වියලි කලාප පුරා ව්‍යාප්ත වී ඇත. උපරිම දිග සෙ.මී. 4 කි.

12.4 ***Osphronemus goramy*** **DXII-XIII.10-12;AX-XI.20-22;P13-15;C16;LL32-36**
සෙප්පිලි, තිත්පිලියා, යෝධ ගුරාමියා
ශ්‍රෝණි වරලේ දික්වූ කිරණය මත්ස්‍යයාගේ දිගට සමානය. පෘෂ්ඨීය පෙදෙස තද අළු පැහැයකි. පාර්ශ්වික පෙදෙස ලා පැහැතිය. පැටවුන්ගේ සිරස් තීරු 8 ක් පමණ පිහිටයි. ගුද වරල රෝස පැහැයකි. වලිග නටුව අසල කළු ලපයකි. මුඛය උල් හැඩයකි. වැඩෙත්ම තොල් මහත්ව හොම්බ කෙටිවේ. 1915, 1927, 1935 සහ 1935 දී ශ්‍රී ලංකාවට ඉන්දුනීසියාවෙන් ගෙනෙනු ලදුව හඳුන්වාදෙන ලදී. තෙත් සහ වියලි කලාපය පුරා ව්‍යාප්ත වී ඇත. උපරිම දිග සෙ.මී. 110 කි.


12.1


12.2


12.3


12.4

පලක 13

13.1 ***Trichogaster pectoralis*** **D VII.10-11; A IX-XII.33-38; P 10**
තෙප්පිලි , වෙල් ගුරාමි, ගුරාමියා
ශ්‍රෝණි වරලේ පළමු කිරණය වලිග නටුව දක්වා දිගුය. පාර්ශ්විකව අඳුරු පැති තීරු සිරස් අතට වැටී ඇත. අංශ රේඛාව ඔස්සේ කළු පැහැති තීරුවකි. තෙත් සහ වියලි කලාපය පුරා වාර්තා වේ. 1951 දී මැලේසියාවෙන් ගෙනෙනු ලදුව ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලදී. උපරිම දිග සෙ.මී. 15 කි.

13.2 ***Trichogaster trichopterus*** **D VI-VIII.7-10; A IX-XII.30-38; P9-10; LL30-40**
ගුරාමි, රෝසගුරාමි, තෙප්පිලි
පාර්ශ්විකව කොළ කළු පැහැයකි. අංශරේඛාව ඔස්සේ කුඩා සිරස් රේඛා කිහිපයකි. වලිග නටුව සහ සිරුර මධ්‍යයේ කළු ලප දෙකකි. වලිග වරල සහ ගුද වරල් ලා පැහැ තිත් සමූහයකි. ශ්‍රෝණි වරලේ පලමු කිරණය දිගුය. 1948 සහ 1949 දී සුරතල් මත්ස්‍ය කර්මාන්තය උදෙසා ශ්‍රී ලංකාවට ඉන්දුනීසියාවෙන් ගෙනෙන ලදුව ස්වාභාවික පරිසරයට නිදහස්වූ රටාසමයෙකි. උපරිම දිග සෙ.මී. 15 කි.

13.3 ***Oreochromis mossambicus*** **D XV-XVI.10-12; A III.10-11; P 14-15; V I.5**
තිලාපියා, තෙත්පිලියා, ජපන් බට්ටා, බට්ටා
සිරුර අඳුරු කොළ දුඹුරු පැහැයකි. වලිග වරල මායිම් රතු පැහැයකි. පැටවුන්ගේ පෘෂ්ඨීය වරලේ අපර කෙළවර කළු තිතකි. සමහර අවස්ථාවලදී වැඩුණු මසුන්ගේ පාර්ශ්විකව කළු ලප දැකිය හැක. අභිජනන සමයේදී පිරිමි මසුන්ගේ වලිග වරල සහ පෘෂ්ඨීය වරල දීප්තිමත් තැඹිලි පැහැයක් ගනී. 1951 සහ 1952 දී නැගෙනහිර අප්‍රිකාවෙන් ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලදී. තෙත් සහ වියලි කලාප පුරා ව්‍යාප්තවී ඇත. උපරිම දිග සෙ.මී. 35 කි.

13.4 ***Oreochromis niloticus*** **D XVI-XVII.11-15; A III 8-11; LL31-35**
තිලාපියා
ගුද වරලේ සහ ශරීරයේ අඳුරු සිරස් පටි දැකිය හැක. අභිජනන සමයේදී පිරිමි සතුන්ගේ රතු වර්ණය ප්‍රමුඛවේ. 1956 වසරේදී අප්‍රිකාවෙන් ගෙනෙන ලදුව හඳුන්වාදෙන ලදී. තෙත් සහ වියලි කලාපයේ ව්‍යාප්තියක් දක්වයි. උපරිම දිග සෙ.මී. 40 කි.



13.1



13.2



13.3



13.4

පලක 14

14.1 *Amblypharyngodon grandisquamis* **D I.9; A 7; LL 45**

ගංගිලියා

ශරීරය සාපේක්ෂව පළලින් වැඩිය. පූර්ව පෘෂ්ඨීය පෙදෙස තරමක් උස්ව පිහිටයි. හොම්බ සහ ඇසේ විෂ්කම්භය සමානය. පෘෂ්ඨීය පෙදෙස කොළ රිදී මිශ්‍ර වර්ණයකි. පාර්ශ්විකව රිදී පැහැය ප්‍රමුඛය. පිධානයේ සිට වලිග නටුව තෙක් අඳුරු තිරස් ඉරකි. කොළඹ අවට වගුරු ආශ්‍රිතව හමුවේ. දුර්ලභය. ශ්‍රී ලංකාවට ආවේණිකය. උපරිම දිග සෙ.මී. 8 කි.

14.2 *Amblypharyngodon melattinus* **D II-III.7; AII-III.8; PI.13-14; VI.8; C 19; LL45-57**

සොරයා

ශරීරය සාපේක්ෂව පළලින් අඩුය. අංශරේඛාව අසම්පූර්ණය 11-18 කොරළයේදී නවතී. පෘෂ්ඨීය අළු කොළ මිශ්‍රය. පාර්ශ්විකව රන්වන් දිලිසෙන රිදී වර්ණයකි. තෙත් සහ වියලි කලාපයේ ව්‍යාප්ත වී ඇත. උපරිම දිග සෙ.මී. 8 කි.

14.3 *Rasboroides atukorali* **D II.6; A III.5; P I.9; V 1.5; C 20; LL 22**

හොර දණ්ඩියා

අංශරේඛාවක් නොමැත. මුඛය ඉහලට පිහිටයි. බඩවත වටකුරුය. පෘෂ්ඨීයව දීප්තියෙන් අඩු කහවන් කොළ පැහැයකි. පාර්ශ්වීය පෙදෙස සහ වලිගය දිලිසෙන රන්වන් රිදී වර්ණයකි. බඩවත රිදී පැහැයක් ගනී. පාර්ශ්විකව ලා කොළ පැහැති තිරස් රේඛාවකි. තෙත් සහ වයඹ දිග වියලි කලාපයේ පහතරට තෙත් බිම් වල වාර්තාවේ. උපරිම දිග සෙ.මී. 3 කි. ශ්‍රී ලංකාවට ආවේණික ලෙස සැළකුවද, 1991 දී ඩෙවි සහ මිනන් විසින් ඉන්දියාවේ කේරළයෙන් සොයාගන්නා ලදී.

14.4 *Rasboroides vaterifloris* **D II-III.7-8; A II.6; P 1.11; V 1.6; C 20; LL 25**

හල්මල් දණ්ඩියා, හල්මල් තිත්තයා

ආයත සංකුචිත දේහයකි. මුඛය ඉහළට පිහිටයි. යටි හනුවේ යෝග කුඩුම්බියක් (symphysial knob) දැකිය හැක. ඇස් සාපේක්ෂව විශාලය. පෘෂ්ඨීයව කොළවන් දුඹුරු පැහැයකි. උදරිය රෝස පැහැයකි. ශ්‍රෝණි වරල් තැඹිලි පැහැයකි. වර්ණ රටා 4 ක් දැකිය හැක. තෙත් කලාපයේ සෙමෙන් ගලායන කුඩා දිය පහරවලට සීමාවේ. ශ්‍රී ලංකාවට ආවේණික දුර්ලභ රටාසමයෙකි. උපරිම දිග සෙ.මී. 4 කි.


14.1


14.2


14.3


14.4

පලක 15

15.1 ***Chela ceylonensis*** **D II.7-8; A III.17-19; P I.9-11; V I. 5; C 19. LL33-35**
කර ඇඳයා, තටු දණ්ඩියා
මුඛය පෘෂ්ඨීයව පිහිටයි. පෘෂ්ඨීය පෙදෙස අඳුරු දුඹුරු පැහැයකි. පිඩානය පිටුපස තද පැහැ ලපයකි. උදරීය පෙදෙස රිදී පැහැතිය. උදරීය ධාරය තියුණුය. පාර්ශිකව තැඹිලි සහ නිල් පැහැ මිශ්‍ර දිස්නයක් සහිත ඉරකි. ගුද සහ ශ්‍රෝණි වරල් රෝස පැහැතිය. දිවයින පුරා පහත රට මිරිදිය පද්ධතිවලට සීමාවේ. ශ්‍රී ලංකාවට ආවේණිකය. පෙතියාගොඩ මහතාට (2006) අනුව ***Chela ceylonensis*** ට අමතරව නව රටාසමයන් දෙකක් ශ්‍රී ලංකාව තුළින් වාර්තා වේ. උපරිම දිග සෙ.මී. 7 කි.

15.2 ***Devario malabaricus*** **D II.10-13; A III.12-16; P I.11-12; V I.7; C 19. LL32-34**
රත් කයිලයා, දම්කොළ සාලයා
මුඛය පෘෂ්ඨීයව පිහිටයි. පෘෂ්ඨීය පෙදෙස අඳුරු දුඹුරු පැහැතියි. පාර්ශිකව නිල් පසුබිමේ කහ පැහැති තිරස් සහ සිරස් කඩ ඉරි පිහිටයි. වරල් කහ පැහැයේ සිට අවර්ණ දක්වා වෙනස් වේ. අභිජනන සමයේදී දීප්තිමත් වර්ණ දරයි. තෙත් සහ වියලි කලාපය පුරා ව්‍යාප්ත වී ඇත. උපරිම දිග සෙ.මී. 8-12 කි.

15.3 ***Devario pathirana***
පතිරණ සාළයා
ප්‍රමාණයෙන් සහ හැඩයෙන් ඉහත රටාසමයන්ට සමානය. සිරුරේ පාර්ශිකව සිරස් අතට ඇති අක්‍රමවත් නිල් පැහැති තීරු සහ ඒවා මායිම් කරන කහ වර්ණය මගින් පහසුවෙන් හඳුනාගත හැක. නිල්වලා ගංගා නිම්නයට සීමාවේ. ශ්‍රී ලංකාවට ආවේණිකය. උපරිම දිග සෙ.මී. 6 කි.

15.4 ***Devario* cf. *aequipinnatus*** **D II-III.9-12; A II-III.14-16; P I.11-12; V I.6; LL35-37**
දුම්බර සාලයා, දම්කොළ සාලයා
වර්ණයෙන් සහ ප්‍රමාණයෙන් ***D. malabaricus*** ට වඩාත් සමානය. අක්ෂිකූපයේ ඉදිරි භාගයේ පවතින ඛණ්ඩක ප්‍රසරය (Spinous process) සහ පළල් ගුද වරල මගින් ***D. malabaricus*** රටාසමයාගෙන් වෙනස් වේ. රොහාන් පෙතියාගොඩ මහතා 2006 Devario ගණයට අයත් නව රටාසමයෙක් බව සඳහන් කරයි. නකල්ස් කඳුකරයට ආවේණික බවට සැක කෙරේ. උපරිම දිග සෙ.මී. 8 කි.


15.1


15.2


15.3


15.4

පලක 16

16.1 ***Esomus thermoicos*** **D II.6; A III.5; P I.4; V I.7; C 19. LL 19-20**

රැවුල් දණ්ඩියා, තටු දණ්ඩියා

මුඛයේ ඌර්ධව (Maxillary) අංකුටය ශ්‍රෝණි වරල තෙක් දිගුය. ශරීරයේ පාර්ශ්විකව කළු තිරස් රේඛාවකි. ඊට යාබදව ඉහළින් කහ පැහැති රේඛාවකි. දිවයින පුරා පහතරට මිරිදිය ජලාශවලින් වාර්තාවේ. ශ්‍රී ලංකාවට ආවේණිකය. උපරිම දිග සෙ.මී. 6-10 කි.

16.2 ***Rasbora daniconius*** **D II.7; A II.5; P I.14; V I.8; C 17; LL 31-34**

දණ්ඩියා, කෙහෙල් දණ්ඩියා, කිරි දණ්ඩියා, කුඩමස්සා

ශරීරයේ පාර්ශ්විකව පිහිටන කළු රේඛාවේ පෘෂ්ඨීය දාරය දැති සහිතය. පෘෂ්ඨීය වරලේ පෘෂ්ඨීය දාරය කෙළවර සුදු පැහැතිය. දිවයින පුරා ව්‍යාප්ත වී ඇත. උපරිම දිග සෙ.මී. 8-15 පමණවේ.

16.3 ***Rasbora caverii*** **D II.7; A I.5; P I.13; V I.6; LL 36-37**

කාවෙරි දණ්ඩියා, දණ්ඩියා

පාර්ශ්වික රේඛාවේ පෘෂ්ඨීය දාරය දැති රහිතය. ස්වාභාවික පරිසරයේදී පෘෂ්ඨීය දර්ශනයේදී සිරුර තුළින් කහ පැහැති ලප දෙකක් දැකිය හැක. දිවයින පුරා ව්‍යාප්තියක් දක්වයි. උපරිම දිග සෙ.මී. 10 කි.

16.4 ***Rasbora wilpita*** **D 2.7; A 3.5; P I.13; V I.8; C 17; LL 31-34**

විල්පිට දණ්ඩියා

ප්‍රමාණයෙන් සහ වර්ණයෙන් ***Rasbora daniconius*** ට සමානය. එනමුත් පාර්ශ්වික කළු රේඛාවේ පෘෂ්ඨීය දාරය දැති රහිතය. Symphysial ගැටිත්ත සහ Premaxillary නෙරීම් මගින් යටි හනුවේ පිහිටන W" හැඩය නිසා පහසුවෙන් හඳුනාගත හැක. තෙත් කලාපයට සීමාවේ. ශ්‍රී ලංකාවට ආවේණිකය. උපරිම දිග සෙ.මී. 7 කි.

16.5 ***Puntius pleurotaenia*** **D IV.8; A III-IV.4-5; P I.15; V I.8; C 19; LL 28-30**

හිත මත්සා

කුඩා මත්ස්‍යයන් වර්ණයෙන් ඉහත රටාසමයන්ට සමානය. ඉහත රටාසමයන්ගෙන් මෙම මත්ස්‍යයා වෙන්කර හඳුනාගැනීමට කෙටි අංකුට යුගල් දෙක උපකාරවේ. හැඩය දර්ශීය පෙතියන්ට සමානය තෙත් කලාපයට සීමාවේ. ශ්‍රී ලංකාවට ආවේණිකය. උපරිම දිග සෙ.මී. 7 කි.



16.1



16.2



16.3



16.4



16.5

පලක 17

17.1 ***Labeo dussumieri*** **D III.12-13; A III.5; P I.16; V I.8; C 19;LL 53-60**
හිරි කනයා, ගං කනයා
වල්ග නටුවේ කළු පැහැති ලපයකි. අංකුට යුගල් දෙකකි. අභිජනන සමයේදී පිරිමි මසුන්ගේ පාර්ශිකව රතු ලපයක් ඇතිවේ. පහත රට තෙත් සහ වියළි කළාපය පුරා මිරිදිය ජලාශ සහ ගංගා වලින් වාර්තාවේ. උපරිම දිග සෙ.මී. 40 දක්වා වේ.

17.2 ***Labeo fisheri*** **D III.10-12; A III.5; P I.15; V I.8; C 19.;LL 40-42**
ලොකු ගඩයා, කළු ගඩයා ,වැලි ගඩයා, ගඩයා
ශරීරය රිදී දුඹුරු පැහැයකි. වල්ග නටුවේ කළු ලපයකි. අංකුට යුගල් දෙකකි. ඉන් එක් යුගලක් පහසුවෙන් දැකිය හැක. මහවැලි නදියේ වේගයෙන් ගලා යන ඉහළ කොටසට සීමාවේ. ශ්‍රී ලංකාවට ආවේණිකය. උපරිම දිග සෙ.මී. 30 දක්වා වේ.

17.3 ***Labeo lankae*** **D III.11-12; A 3.5; P I.16; V I.8; C 19; LL 39**
තඹලයා, තඹලය වැන්නා, හිරි කනයා
ශරීරය කොළ දුඹුරු පැහැයකි. උදරියව රිදී පැහැයකි. අංකුට යුගල් එකකි. වරල් කොළ දුඹුරු හෝ තැඹිලි පැහැයක් ගනී. පහතරට මිරිදිය ජලාශ සහ ගංගාවලින් වාර්තා වේ. එනමුත් මෑත වාර්තා නොමැත. ශ්‍රී ලංකාවට ආවේණිකය. උපරිම දිග සෙ.මී. 20-30 අතර වේ.

17.4 ***Labeo rohita*** **D III-IV.12-14; A II-III.5; P I.16-18; V I.8;LL 40-44**
රෝහු, රහු
මුඛය උප අග්‍රස්ථව පිහිටයි. එමගින් අන් ***Ladeo*** රටාසමයන්ගෙන් වෙන්කර හඳුනාගත හැක. අංකුට යුගල් එකකි. වරල් රතු පැහැතිය. වියලි කලාපයේ මිරිදිය ජලාශවලට 1981 දී ඉන්දියාවෙන් හඳුන්වා දුන් රටාසමයෙකි. උපරිම දිග සෙ.මී. 100-200 පමණ වේ.



17.1



17.2



17.3



17.4

පලක 18

18.1 ***Puntius asoka*** **D III.11-12; A III.5; P I.12-13; V I.8; C 23.; LL 27**
රන් මානිස්සා, අශෝක පෙතියා
රන් වන් පැහැයකි. වලිග වරලේ පෘෂ්ඨීය සහ උදරීය දාරය රතු පැහැතිය. සෙසු වරල් අවර්ණය. වලිග නටුව අසල කළු දිගටි ලපයකි. පාර්ශිකව තිරස් කළු තිත් පේළි 8 කි. කැළණි ගංගා ද්‍රෝණියට සීමාවේ. ශ්‍රී ලංකාවට ආවේණිකය. උපරිම දිග සෙ.මී. 10-17 කි.

18.2 ***Puntius martenstyni*** **D 4.8-9; A III.5; P I.14-15; V I.8; LL 27-30**
දුම්බර පෙතියා
සිරුර රන්වන් පැහැයකි. උදරීය පෙදෙස රිදී පැහැයකි. වලිග වරල රතු පැහැතිය, අන් වරල් රන්වන් පැහැතිය. වලිග නටුව අසල කළු දිගැටි ලපයකි. පාර්ශිකව තිරස් තිත් පේලි 6-7 පමණ වේ. දුම්බර කඳුකරයට සීමාවේ. ශ්‍රී ලංකාවට ආවේණිකය. උපරිම දිග සෙ.මී. 14 කි.

18.3 ***Puntius sarana*** **D IV.8; A III.5; P I.12-16; V I.7-8; C 19; LL 26-29**
මස් පෙතියා
සිරුර සාපේක්ෂව ස්ථූලය. සිරුර කොළ දුඹුරු පැහැයකි. කොරළ රිදී පැහැයෙන් දිස්වේ. වලිග නටුව අසල වෘත්තාකාර කළු පැහැති ලපයකි. සමහර නිදර්ශකවල ශ්‍රෝණි වරලේ රතු පැහැයක්ද දැකිය හැක. පැටවුන්ගේ පෘෂ්ඨීය වරල පටන්ගන්නා ස්ථානයේ සිරුරේ දෙපස කළු තිත් දෙකකි. තෙත් සහ වියළි කලාපය පුරා මිරිදිය ජලාශ සහ ගංගාවලින් වාර්තා වේ. උපරිම දිග සෙ.මී. 30 දක්වා වර්ධනය වේ.

18.4 ***Puntius singhala*** **D III.8; A III.5; P I.14-16; V I.6; C 18; LL 20-22**
දම්කොළ පෙතියා
පෘෂ්ඨීය පෙදෙස දම් කොළ පැහැයකි. පාර්ශිකව රන්වන් කහ පැහැතිය. වලිග නටුව අසල කළු ඕවලාකාර ලපයකි. වලිගයේ පෘෂ්ඨීය සහ උදරීය දාරය කළු පැහැතිය. වැඩුණු පිරිමි මසුන්ගේ පෘෂ්ඨීය වරලේ කිරණ දික්ව ඇත. කුඩා පැටවුන්ගේ සිරුරේ සිරස් කළු පටි තුනක් දැකිය හැක. ක්‍රමයෙන් වැඩෙත්ම මධ්‍යයේ පිහිටි සිරස් පටිය ඕවලාකාර ලපය බවට පත්වේ. තෙත් සහ වියළි කලාපය පුරා මිරිදිය ජලාශ සහ ගංගා වලින් වාර්තා වේ. ශ්‍රී ලංකාවට ආවේණිකය. උපරිම දිග සෙ.මී. 10-12 කි.



18.1



18.2



18.3



18.4

පලක 19

19.1 ***Puntius bandula*** **D 3.5-8; A 3.5; P I.11; V I.7-8; C 17; LL 19-21**

ජයන්තියා, බන්දුල පෙතියා

බාහිර වර්ණයෙන් ***Puntius cumingii*** රටාසමයාට සමානය. ශරීරයේ පාර්ශිකව පෘෂ්ඨීය වරලට ඉදිරියෙන් සහ ගුදවරලට වහාම පිටුපසින් කළු පැහැති සිරස් තීරු දෙකකි. පිරිමි මසුන්ගේ පෘෂ්ඨීය ශ්‍රෝණි සහ ගුද වරල් කළු පැහැතිය. වලිග වරල රතු පැහැයකි. අංශ රේඛාව අසම්පූර්ණ වේ. අංශ රේඛාවට යාබද පෘෂ්ඨීය කොරළ පේළිය අතරට කොරළ පේළියක් 5 වන අංශරේඛා කොරළය අසලින් පටන් ගැනේ. කෑගලු දිස්ත්‍රිකයේ මිනිමරු කොලනි ප්‍රදේශයෙන් පමණක් වාර්තාවේ. ශ්‍රී ලංකාවට ආවේණිකය. උපරිම දිග සෙ.මී. 4 පමණවේ.

19.2 ***Puntius cumingii*** **D II.8; A III.5; P I.11; V I.7-8; C 19; LL 19-21**

දෙපුල්ලයා, පොත්යා

වර්ණයෙන් ***Puntius bandula*** මත්ස්‍යයාට සමාන වුවද පෘෂ්ඨීය ශ්‍රෝණි සහ ගුද වරල් කහ හෝ තැඹිලි වර්ණයක් ගනී. එසේම අංශ රේඛාව අසල කොරළ පිහිටීම සාමාන්‍ය ආකාරවේ. පහත රට තෙත් කලාපයේ පිරිසිදු සෙමෙන් ගලන ඇල දොලට සීමාවේ. ශ්‍රී ලංකාවට ආවේණිකය. උපරිම දිග සෙ.මී. 3-5 වේ.

19.3 ***Puntius nigrofasciatus*** **D III.8; A III.5; P I.12; V I.6; C 19; LL 20-22**

බුලත් හපයා, මනමාලයා

පාර්ශිකව සිරස් තීරු තුනකි. පෘෂ්ඨීය, ගුද, සහ ශ්‍රෝණි වරල කළු පැහැතිය. වලිග වරල රතු හෝ අවර්ණය. පහත රට තෙත් කලාපයේ පිරිසිදු සෙමෙන් ගලන ඇල දොලට සීමාවේ. ශ්‍රී ලංකාවට ආවේණිකය. උපරිම දිග සෙ.මී. 5-6 වේ.

19.4 ***Puntius srilankensis*** **D 3.8; A 3.5; P I.13; V I.10; C 17; LL 22-23**

දන්කුඩ පෙතියා

පාර්ශිකව සිරස් කළු පැහැති තීරු තුනකි. පළමු තීරුව පෘෂ්ඨීය වරලට වහාම පහළින්ද අවසන් තීරුව වලිග වරල පටන්ගන්නා ස්ථානයේද පිහිටයි. වැඩුණ පිරිමි මසුන්ගේ පෘෂ්ඨීය වරලේ කිරණ දික්ව ඇත. වලිග වරලේ පිටත දාර කළු පැහැයකි. පැටවුන්ගේ මෙය රන් පැහැයක් ගනී. දුම්බර කඳුකරයේ මහවැලි ද්‍රෝණියට සීමාවේ. ශ්‍රී ලංකාවට ආවේණිකය. උපරිම දිග සෙ.මී. 10 වේ.



19.1



19.2



19.3



19.4

පලක 20

20.1 ***Puntius bimaculatus*** **D IV.7-8; A III.5; P I.15; V I.8; C 19; LL 24-25**

ඉපිලි කඩයා

පෘෂ්ඨීය වරලේ මුලයට ආසන්නව කළු පැහැති ඇල කෙටි ඉරකි. වලිග වරල ආරම්භක ස්ථානයේ වෘත්තාකාර කුඩා තිතකි. පැහැදිලිව පෙනෙන අංකුට යුගලකි. වැඩුණු පිරිමි මසුන්ගේ පෘෂ්ඨීය වරලේ සහ අංශ රේඛාව ඔස්සේ දිවෙන රත් පැහැයකි. දිවයින පුරා ව්‍යාප්ත වේ. උපරිම දිග සෙ.මී. 4-7 වේ. 1991 වසර වන තෙක් ශ්‍රී ලංකාවට ආවේනික ලෙස සැළකුණද 1992දී මිනන් සහ ඩේවි විසින් ඉන්දියාවෙන් වාර්තා කරණ ලදී.

20.2 ***Puntius vittatus*** **D II.8; A II.5; P I.11; V I.8; C 20; LL 20-22**

බණ්ඩි තිත්තයා, පොඩි පෙතියා, ඉපිලි කඩයා

පෘෂ්ඨීය වරල මුලයේ කළු පැහැති ඇල ඉරකි. වලිග වරල ආරම්භයේ දිගටි තිරස් තිතකි. ගුදයට ආසන්නව කුඩා කළු පැහැති තිතකි. වැඩුණු පිරිමි මසුන් අභිජනන සමයේදී රත් පැහැයක් ගනී. පෘෂ්ඨීය පෙදෙස් දිලිසෙන කොළ පැහැයක් ගනී. දිවයින පුරා ව්‍යාප්ත වී ඇත. උපරිම දිග සෙ.මී. 3-4 වේ.

20.3 ***Puntius* cf. *ticto*** **D II.8; A III.5; P I.11; V I.7; C 19; LL 20-22**

දෙපුලියා, තිත් පෙතියා

වලිග නටුවේ ඉදිරිපසට වන්නට කුඩා කළු ලපයකි. සමහර නිදර්ශකවල මෙම තිත වටා කහ හෝ රතට හුරු වර්ණයක් ඇත. පිධානයට පිටුපසින් මධ්‍යයට වන්නට තරමක් අපහැදිලි කළු තිතකි. වියලි කලාපයේ ව්‍යාප්ත වේ. රොහාන් පෙතියාගොඩ මහතා 2006 දී *Puntius ticto* නාමය මිරිදිය මත්ස්‍ය නාමාවලියෙන් ඉවත්කර ඇති අතර, ශ්‍රී ලංකාවට ආවේණික නව රටාසමයෙක් බව සඳහන් කරයි. උපරිම දිග සෙ.මී. 5 වේ.

20.4 ***Puntius titteya*** **D III.7; A III.5; P I.10; V 2.7; C 17; LL 19-20**

ලේ තිත්තයා

පෘෂ්ඨීය පෙදෙස සහ අංශරේඛාව ඔස්සේ කළු දුඹුරු හෝ රත් පැහැයට මිශ්‍ර වර්ණයකි. පෘෂ්ඨීය පෙදෙස සහ මධ්‍ය රේඛාව අතර කහ වර්ණය මුඛයේ ආරම්භයේ සිට වල්ගය දක්වා දිවේ. උදරීය පෙදෙස කහ සුදු පැහැයකි. පෘෂ්ඨීය ගුද සහ ශ්‍රෝණි වරල දාර කළු පැහැයකි. සම්පූර්ණයෙන් රක්ත වර්ණ පැහැයෙන් යුක්ත නිදර්ශකද වාර්තාවේ. පහත රට තෙත් කලාපයට සීමාවේ. ශ්‍රී ලංකාවට ආවේණිකය. උපරිම දිග සෙ.මී. 2.5-3.5 වේ.



20.1



20.2



20.3



20.4

පලක 21

**21.1** ***Puntius chola*** **D IV.8; A III.5; P I.15; V I.7; C 19; LL 24-27**

කොට පෙතියා

මෙම රටාසමයාගේ සුබෙදුම ගැටළු සහිතය. දැරණියගල මහතාට අනුව (1952) කෙටි හොම්බක් සහිත ස්ථූල මත්ස්‍යයෙකි. වලිග නටුවේ අසල අපැහැදිලි කළු ලපයකි. පිධානයට පසුපසින් ද කළු පැල්ලමක් දැකිය හැකිය. පෙතියාගොඩ මහතාට අනුව (1991) ***Puntius dorsalis*** ට බෙහෙවින් සමාන රටාසමයෙකි. එනම් දිගු හොම්බක් සහිතය. පහත රට පුරාම ව්‍යාප්තියක් පෙන්වයි. උපරිම දිග සෙ.මී. 8-15 වේ.

**21.2** ***Puntius dorsalis*** **D IV.8; A III.5; P I.11-13; V I.7; C 19; LL 23-25**

කටු පෙතියා , කටු කූරියා, රතු වරල් පෙතියා

හොම්බ ප්‍රදේශය සාපේක්ෂව දිගුය. උදර ප්‍රදේශය පැතලිය. තරමක් දිගටිය. ශ්‍රෝණි සහ ගුද වරල් රත් පැහැයක් ගනී. පැටවුන්ගේ පෘෂ්ඨීය වරල මුලයේ කෙටි කළු පැහැති ඇල ඉරකි. දිගු අංකුට යුවලක් දැකිය හැක. වලිග නටුව අසල අපැහැදිලි ලපයකි. පහත රට පුරාම ව්‍යාප්තියක් පෙන්වයි. උපරිම දිග සෙ.මී. 10 වේ.

**21.3** ***Puntius* cf. *amphibius*** **D IV.8; A III.5; P I.15; V I.8; C 19; LL 23-24**

මඩ ඉපිල්ලා, ඉපිලි කඩයා

මෙම රටාසමයාගේ මෙරට සුබෙදුම ගැටළු සහිතය. හැඩයෙන් ***Puntius chola*** ට සමානය. නමුත් මුඛය තරමක් උදරීයව පිහිටයි. රොහාන් පෙතියාගොඩ මහතා 2006 දී ***Puntius amphibius*** නාමය මිරිදිය මත්ස්‍ය නාමාවලියෙන් ඉවත්කර ඇති අතර, ශ්‍රී ලංකාවට ආවේණික නව රටාසමයෙක් බව සඳහන් කරයි. පහත රට පුරාම ව්‍යාප්ත වේ. උපරිම දිග සෙ.මී. 8 පමණ වේ.

**21.4** ***Tor khudree*** **D IV.9; A III.5; P I.15-17; V I.8; C 19; LL 23-24**

ලෙහෙල්ලා, හොරපොලයා

පැටවුන්ගේ ශ්‍රෝණි වරල් සුදු පැහැයක් ගනී. වැඩුනු මසුන්ගේ හොඳින් වර්ධනය වූ තොල් දැකිය හැකිය. කොරළ ප්‍රමුඛව පිහිටයි. පෘෂ්ඨීය වරලේ දැඩි කණ්ඨකයක් දැකිය හැක. ශ්‍රී ලංකාවේ හමුවන දේශීය මසුන් අතර විශාලතම Cyprinidae කුලයේ සාමාජිකයා වේ. දෙවන අඩතැන්නේ ගංගා ආශ්‍රිත විශාල වලවල්වල වාර්තා වේ. උපරිම දිග සෙ.මී. 20-50 අතර වේ.



21.1



21.2



21.3



21.4

පලක 22

**22.1** ***Carassius auratus*** **D III.16-18;A II-III.5;P I.16;V I.8;C 17-19;LL25-31**
කාප්
ශ්‍රී ලංකාවට හඳුන්වාදුන් මත්ස්‍යයෙකි. වියලි කලාපයේ ජලාශවලින් වාර්තා වේ. වර්ණ රටා ගණනාවක් මින්මැදුරු ඇසුරේ දැකිය හැක. උපරිම දිග සෙ.මී. 60-70 වේ.

**22.2** ***Cyprinus carpio*** **D III-IV.18-20;A III.5; P I.15;V I.8;C 20;LL 32-40**
රට පෙතියා, පොදු කාපයා
1915 සහ 1890 දී යුරෝපයෙන් ශ්‍රී ලංකාවට හඳුන්වාදුන් මත්ස්‍යයෙකි. නුවරඑළිය ප්‍රදේශයේ ජලාශවලට හඳුන්වා දී ඇත. උපරිම දිග සෙ.මී. 70-120 වේ.

**22.3** ***Ctenopharyngodon idella*** **D III.7;A III.7-8;P I.17;V I.8;C 21;LL40-42**
තණකොළ කාපයා
1948 දී චීනයෙන් ශ්‍රී ලංකාවට හඳුන්වාදුන් මත්ස්‍යයෙකි. ඉහල මහවැලි ජලාශවලින් වාර්තා වේ. උපරිම දිග සෙ.මී. 75-150 වේ.

**22.4** ***Hypothalmichthys molitrix*** **D I-III.6-7;A I-III.10-14**
රිදී කාපයා
1948 සහ 1981 දී චීනයෙන් ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් මත්ස්‍යයෙකි. වියලි කලාපයේ ජලාශවලින් වාර්තා වේ. උපරිම දිග සෙ.මී. 105 වේ.



22.1



22.2



22.3



22.4

පලක 23

*23.1* ***Cirrhinus mrigala*** **D III-IV. 12-13; A III.5; P I.17; V I.8; LL 40-45**

මිරිගල්

1981 දී ඉන්දියාවෙන් ශ්‍රී ලංකාවට හඳුන්වාදුන් රටාසමයකි. වියලි කලාපයේ ජලාශවලින් වාර්තා වේ. උපරිම දිග සෙ.මී. 40 වේ.

*23.2* ***Catla catla*** **D III-IV. 14-16; A III.5; P I.20; V I.8; LL 40-43**

කැට්ලා

1942 දී සහ 1982 දී අග්නිදිග ආසියාවෙන් ශ්‍රී ලංකාවට හඳුන්වාදුන් රටාසමයෙකි. වියලි කලාපයේ ජලාශවලින් වාර්තා වේ. උපරිම දිග සෙ.මී. 60 වේ.

*23.3* ***Megalops cyprinoides*** **D IV-V.13-15; A IV.19-25; P 13; V 10; LL 39**

ඉලයා, මරේවා, රැනාවා

කිවුල් දිය වැසි රටාසමයෙකි. ඉඳහිට මිරිදිය පද්ධතිවලට ඇතුළු වේ. පෘෂ්ඨීය වරලේ අවසාන කිරණ දික් වී කෙන්දක ආකාරයක් ගනී. මාංශභක්ෂකය. වැඩුණ මත්ස්‍යයෙකුගේ උපරිම දිග සෙ.මී. 60 පමණ වේ.

**23.4** ***Oncorhynchus mykiss*** **D III-IV.10-12; A III-IV.8-12; C 19**

ට්‍රවුට්

1882, 1889, සහ 1890 දී ඇමරිකා මහද්වීපයෙන් ශ්‍රී ලංකාවේ හෝටන්තැන්න, අග්‍රා පතන, නුවර එළිය ප්‍රදේශයේ ජලාශවලට හඳුන්වාදුන් රටාසමයෙකි. මාංශභක්ෂකය. වර්තමානයේ හෝටන්තැන්න ප්‍රදේශයෙන් හමුවේ. ශ්‍රී ලංකාවේදී වැඩුණ මත්ස්‍යයෙකුගේ උපරිම දිග සෙ.මී. 30-40 පමණ වේ.



23.1



23.2



23.3



23.4

පලක 24

**24.*1*** ***Aristichthys nobilis*** **D III.7; A III.11; P I.19; V I.7. LL115**

හිස ලොකු කාපයා

1948 දී චීනයෙන් ශ්‍රී ලංකාවට හඳුන්වාදුන් රටාසමයෙකි. වියලි කලාපයේ ජලාශවලින් වාර්තා වේ. උපරිම දිග සෙ.මී. 60-112 වේ.

**24.2** ***Ehirava fluviatilis*** **D 2-11; A 3.12; P I.11-13; V I.7; C 19 LL35-38**

ගං අයිරාවා, අයිරාවා

කරදිය හාල්මැස්සෙකුට සමානය. සිරස් Adipose ඇසිපිය සහ උදරීය නෞතලයක් (Ventral keel) ඇති බැවින් අන් රටාසමයන්ගෙන් පැහැදිලිව වෙන්කර හඳුනාගත හැක. කරදිව වාසිය. තෙත් සහ වියලි කලාපයේ මිරිදිය ජලාශවලින්ද වාර්තා වී ඇත. උපරිම දිග සෙ.මී. 5 කි.

**24.3** ***Toxotes chatareus*** **D V.12-13; A III.16-18; P 15; LL33-35**

දිමිත්තා

ඉහළට එසවුණ මුඛ තුඩින් වේගවත් ජලපහරක් විද ජලාසන්නයේ ශාක මත සිටින කෘමීන් ජල පෘෂ්ඨයට වට්ටා ආහාර කොට ගනී. දේශීය රටාසමයෙකි. කිවුල් දියේ වැඩි ඇසුරකි. උපරිම දිග සෙ.මී. 40 කි.

**24.4** ***Xiphophorus maculatus*** **D 8-10**

ප්ලේටි

රතු හෝ නිල් කළු පැහැති වර්ණ රටා දැකිය හැක. මුල් වරට 1958 දී මෙක්සිකෝවෙන් සුරතල් මසුන් කර්මාන්තය යටතේ ශ්‍රී ලංකාවට ගෙනෙනු ලැබ ස්වභාවික පරිසරයට නිදහස්වූ රටාසමයෙකි. කොටගල, නෙළුව සහ අත්තිඩිය යන ප්‍රදේශවලින් වාර්තා වී ඇත. උපරිම දිග සෙ.මී. 4 කි.



24.1



24.2



24.3



24.4

පලක 25

*25.1* ***Gambusia affinis*** **D 7-9; A 9-10**

ගප්පි

1930 සහ 1940 දශකයෙහිදී මැලේරියා මර්දන ව්‍යාපාරය යටතේ හඳුන්වා දුන් රටාසමයෙකු ලෙස සැලකේ. කොළඹ අවට වගුරුවලින් වාර්තා වී ඇත. බොහෝ විට ශරීරය අවර්ණය. උපරිම දිග සෙ.මී. 04 වේ.

*25.2* ***Poecilia reticulata*** **D 7-8; A 8-10**

වෙල් ගප්පි, වෙල් සාරි ගප්පි

1928 සහ 1947 දශකයෙහිදී මැලේරියා මර්දන ව්‍යාපාරය යටතේ හඳුන්වා දුන් රටාසමයෙකි. කොළඹ අවට සහ මධ්‍යම කඳුකරයෙහි ගංගා ආශ්‍රිතව ව්‍යාප්තියක් පෙන්වයි. පිරිමි මත්ස්‍යයාගේ රතු රෝස සහ කළු පැල්ලම් දැකිය හැක. උපරිම දිග සෙ.මී. 3.5 - 4 වේ.

**25.3** ***Xiphophorus hellerii*** **D 11-14; A 8-16**

ස්වෝර්ඩ් ටේල්, කඩුපහරා

මුල් වරට 1958 සහ 1960 දී මෙක්සිකෝවෙන් සුරතල් මසුන් කර්මාන්තය යටතේ ශ්‍රී ලංකාවට ගෙනෙනු ලැබ ස්වාභාවික පරිසරයට නිදහස්වූ රටාසමයෙකි. අංශ රේඛාව ඔස්සේ රතු දුඹුරු ඉරකි. දෙපස රිදීවන් නිල් පැහැයකි. පෘෂ්ඨීය සහ වලිග වරල් ලා කොළ පැහැයකි. පිරිමි මසුන්ගේ වලිග වරලේ කිරණ කිහිපයක් දික්වී ඇත. මධ්‍යම කඳුකරයෙහි ජලාශ කිහිපයක් ආශ්‍රිතව ව්‍යාප්තියක් පෙන්වයි. උපරිම දිග සෙ.මී. 14 වේ.



25.1

පිරිමි



ගැහැනු



25.2

පිරිමි



ගැහැනු



පිරිමි

25.3



ගැහැනු

# ආශ්‍රිත ග්‍රන්ථ (Literature cited)


A Global Information System on Fishes (http://filaman.ifm-geomar.de/home.htm)

Amarasinghe, U.S.; Shirantha, R.R.A.R. & M.J.S. Wijeyaratne (2006) Some aspect of ecology of endemic freshwater fishes of Sri Lanka. Bambaradeniya, C.N.B. (*Eds.*) *The fauna of Sri Lanka.* IUCN World Conservation Union. 113-124.

Bailey, R.M. & C. Gans (1998) Two new Synbranchid fishes, *Monopterus roseni* from Peninsular India and *M. desilvai* from Sri Lanka. *Occ.paper of the Mus. Of Zoology.* The University of Michigan. 726: 1-18.

Bambaradeniya, C.N.B. (2002). The status and implications of invasive alien species in Sri Lanka. *Zoos' Print Journal,* **17**(11): 930-935.

Bossuyt, F.; Meegaskumbura, M.; Beenaerts, N.; Gower, D. J.; Pethiyagoda, R.; Roelants, K.; Mannaert, A.; Wilkinson, M.; Bahir, M. M.; Manamendra-Arachchi, K.; Ng, P. K. L.; Schneider, C. J.; V. Oommen, O. & M. C. Milinkovitch (2004) Local endemism within the Western GhatsSri Lanka Biodiversity Hotspot. *Science,* **306**: 479481.

Chakrabarty, P. & H.H. Ng (2005) The identity of catfishes identified as *Mystes cavasius* (Hamilton, 1822) (Teleostei: Bagridae), with a description of a new species from Myanmar. *Zootaxa,* 1093: 1-24.

Cuvier, G. & A. Valenciennes (182849). *Histoire naturelle des poissons.* Paris, Strassbourg.

Deraniyagala, P.E.P. (1929) The Labyrinthici of Ceylon. *Spolia Zeylanica,* 15(2): 79-111.

Deraniyagala, P.E.P. (1929) Two new freshwater fishes. *Spolia Zeylanica,* 25(2): 73-77.

Deraniyagala, P.E.P. (1943) A new cyprinoid fish from Ceylon. *J. Royal Asiatic Society (Cey. Branch)*. 35(96): 158-159.

Deraniyagala, P.E.P. (1945) A new subspecies among some ophicephalids of Ceylon and India. *Spolia Zeylanica*, 24(2): 93.

Deraniyagala, P. E. P. (1952) *A coloured atlas of some vertebrates from Ceylon*, 1: fishes. National Museum, Colombo. 149pp.

